# මුළු ලොවම පිළි ගත් සදාචාරයන් කිහිපයක්

[ සිංහල – Sinhala – سنهالي ]

ඉමාම් අල් බුහාරිගේ
අදබ් අල් මුෆ්රද් ග්‍රන්ථයෙන් තෝරා ගත්
මාතෘකා කිහිපයක්
1 වන කොටස

පරිවර්තනය

ජාසිම් ඉබ්න් දඉයාන්

2014 - 1435

IslamHouse.com

# عادات أخلاقية معترف بها عالميا

## مختارات من كتاب الأدب المفرد

« باللغة السنهالية »

الإمام البخاري

ترجمة: جاسم بن دعيان

2014 - 1435

IslamHouse.com

# මුළු ලොවම පිළි ගත් සදාචාරයන් කිහිපයක් 1

## ඉමාම් අල් බුහාරිගේ අදබ් අල් මුෆ්රද් ග්‍රන්ථයෙන් තෝරා ගත් මාතෘකා කිහිපයක්- 1 වන කොටස

පරිවර්තනය
ජාසිම් ඉබ්න් දය්යාන්

Title of the Book: Selection from Virtues of Universal Value – Adab al Mufrad
Author : Imam Bukhari
Translated by : Jassim Ibn Daiyan

website : www/islamhouse.com

# පෙරවදන

සුප්‍රසිද්ධ හදීස් විද්වතෙක් වන ඉමාම් බුහාරිගේ අදබ් අල් මුෆ්රද් නම් අගනා ග්‍රන්ථය නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමණන් පෙන් වූ උසස්තම සදාචාරයන් ගැන සඳහන් කරයි. පෞද්ගලික හා සමූහ ජීවිතයට අත්‍යවශ්‍ය යහ මඟ පෙන්වන මෙම ග්‍රන්ථය කෙතරම් වැදගත් දැයි මෙය පරිශීලනය කරන සැවෝටම අවබෝධ වනු නිසැකයි.

නවීන මුස්ලිම් සමාජය, බිය බැතිමත්කමින් තොරව නැමදුමට සහ චාරිත්‍රයන්ට පමණක් ආගම සීමා කොට ජීවත්වෙයි. කුර්ආනය සහ නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් පෙන් වූ ඉස්ලාමීය ජීවන මාර්ගය කුමක් දැයි නොදන්නා නිසා, ඉස්ලාම් ප්‍රිය කරන හැසිරීම් සහ සදාචාරයන් අප අතර දක්නට නොමැත. ඉස්ලාමීය ජීවිතයේ අගය නොදන්නා මෙවැනි පිරිස තමත් ජීවත් වන සමාජයද පරිහානියට පත් කරන බව කොයි කාටත් පෙනේ.

මෑතකදී ඇතැම් මුස්ලිම්වරුන් අතර පිබිදීමක් ඇතිවීමද ඉස්ලාම් පිළිබඳ සත්‍ය තොරතුරු ලැබූ විශාල සංඛ්‍යාවක් සෑම රටකම සිය කැමැත්තෙන් ඉස්ලාමයට පිවිසීමද අල්ලාහ්ගේ ඉමහත් මෛත්‍රිය හේතු කොට ගෙන සිදුවෙයි.

මුස්ලිම්වරුන්ට පමණක් නොව, සියලු ජනයාටම අදබ් අල් මුෆ්රද් පෙන්වන අගනා ජීවන රටාවන් පිළිබඳ දැනුම සිංහල මාධ්‍යයෙන් අධ්‍යයනය ලබන ලාංකික මුස්ලිම්වරුන්ට හඳුනා දෙනු පිණිස එම ග්‍රන්ථයෙන් උපුටා ගත් මාතෘකාවන් කිහිපයක් සිංහල බසට පරිවර්තනය කළෙමි. අපගේ දෛනික ජීවිතයේ සිදු වන සාමාන්‍ය ක්‍රියාවන් තුළින්, සමාජයේ විශාල වෙනසක් සිදු කළ හැකි බව මෙම මාතෘකාවන් පහදා දෙයි. මෙම පොත් පිංචය කියවන කෙනෙක් ඉස්ලාම් පෙන්වන මාර්ගයේ තම ජීවිතය සකස් කරගන්නේ නම් සමාජයට මගෙන් කුඩා සේවයක් සිදු වූ බව සලකමි.

ඉස්ලාම් මූල ධර්ම වාද දහමක් යයි ඝෝෂා කරන සුළු පිරිස, මෙම පොත් පිංචය පෙන්වන්නේ ඉස්ලාමයේ මූල ධර්මය බව දැන්වත් අවබෝධ කර ගත යුතුයි.

අල් කුර්ආනය සහ මුහම්මදු සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන්ගේ හදීස් වදන් පෙන්වන අගනා ජීවන මාර්ගය පදනම් කර ගත් සමාජයක සාමය සහ සහනය පවතින බව නිසැකයි. එවැනි ජීවිතය පිළිබඳ දැනුම ලබා දෙන අරමුණින් ඉටු කළ මෙම සේවය සර්ව බලධාරි අල්ලාහ් පිළිගනිත්වා. මෙම පරිවර්තනයෙහි සහාය වූ සියලු දෙනාට අවංක ස්තූතිය පළ කර අල්ලහ්ගෙන් දුආ කරමි.

අවසාන නබි මුහම්මද් සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන්ට, එතුමාණන්ගේ පවුලේ අයට, එතුමාණන්ගේ හිතවත් මිත්‍රයන්ට සහ එතුමාගේ යහමග අනගමනය කරන සියලු දෙනාට අල්ලාහ්ගේ ආශීර්වාදය සහ සාමය හිමිවේවා.

ජාසිම් ඉබ්න් දඉයාන්

2013 දෙසැම්බර් මස 05 වැනි

## විෂය මාලාව

1. සදාචාරයන් සහ ඉස්ලාම් දහම
2. ලජ්ජාවීම යහ ගුණයක් ලෙස සැලකේ
3. ඊමාන් යන දේව විශ්වාසයෙහි ලජ්ජාවීමද අංගයකි
4. දෙමාපියන්ට ගරු කිරීම
5. අල්ලාහ් ප්‍රිය කරන ක්‍රියාවන් කිහිපයක්
6. දෙමාපියන්ට උපස්ථාන කිරීමෙන් ස්වර්ගය හිමි වේ
7. දෙමාපියන් අතර ප්‍රධාන තැන හිමි වන්නේ කාහටද?

8. දරුවන් සඳහා දෙමාපියන්ගේ යාච්ඤාව
9. දෙමාපියන් සඳහා දරුවන්ගේ යාච්ඤාව
10. නෑ සම්බන්ධකම අගය කිරීම
11. නෑකම අගේ කොට සැලකීම
12. කරුණාවට පිළිතුරු සතුරුකම වන්නේ නම්
13. කාන්තාවන්ට යහපත් සැලකිලි
14. කෙනෙකුගෙන් යැපෙන කාන්තාවන්
15. අසල් වැසියන්ට යහපත් වීම
16. යහපත් අසල් වැසියෙක් වන්නේ කෙසේද?
17. අසල් වැසියන් අතර අයහපත් හැසිරීම
18. මිනිසුන් අතර ශ්‍රේෂ්ඨතම අය
19. සුවයක් නොමැති රෝගයක්
20. උසස්තම ත්‍යාගය ගෙන දෙන ආදරය

# මුළු ලොවම පිළිගත් සදාචාරයන් කිහිපයක් - 1

## මුහම්මද් සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් පෙන් වූ යහමඟ

## 1 සදාචාරයන් සහ ඉස්ලාම් දහම

අඋඃදු බිල්ලාහි මිනස් ෂෙයිතාන් නිර් රජීම්. බිස්මිල්ලාහ් හිර් රහ්මාන් නිර් රහීම්. *"සැබැවින්ම අල්ලාහ්ද අවසාන දිනයද අපේක්ෂා කොට, ඔහු බෙහෙවින් මෙනෙහි කරන අයට, අල්ලාහ්ගේ රසූල්වරයා තුළින් ඔබට අලංකාර ආදර්ශයක්මය."* බව කුර්ආන් වාක්‍ය 33-21 පවසයි.

"අල්ලාහ්ගේ තරාදියෙහි (තුලා වෙහි) සදාචාරයන් (යහපත් ගති පැවතුම්) මෙන් බරැති කිසිවක් නොමැත." යයි මුහම්මද් සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ පැවසූ බව අබු දර්දා රලියල්ලහු අන්හු දන්වා අහ්මද්, අබු දාවුද්, අත් තිර්විදි සහ අදබ් අල් මුෆ්රද් හී ඉමාම් බුහාරි ද වාර්තා කළහ.

"ඔබ අතරින් මම වඩාත් ආදරය කරන සහ විනිශ්වය දිනයෙහි මට සමීපව සිටින අය කවුරුන්දැයි පවසන්නද?" යනුවෙන් නබි සල්ලල්ලාහු අලෛහි

වසල්ලම් තුමාණෝ වරක් සහාබා වරුන්ගෙන් විමසූ විට කිසිවෙක් පිළිතුරු නොදී නිශ්ශබ්ද ව සිටියහ. මෙලෙස දෙතුන් වරක් එතුමාණන් ප්‍රශ්න කළායින් "කරුණාකර අපට පවසන්න නබි තුමාණනි" යයි ඒ පිරිස කීහ. එවිට, "ඔබ අතරින් උසස්තම සදාචාරයන් සහිත අය වේ." යයි නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ පැවසූ බව අහ්මද්, ඉබ්න් හිබාන් සමඟ අදබ් අල් මුෆ්රද් ග්‍රන්ථයෙහි අල් බුහාරි වාර්තා කරයි.

මුහම්මද් සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන්ගෙන් අසභ්‍ය වදනක් හෝ ක්‍රියාවක් දැනුවත්ව හෝ නොදැනුවත්ව හෝ සිදු නොවූ බව අබ්දුල්ලාහ් ඉබ්න් අම්ර් පවසයි. "උසස්තම සදාචාරයන් සහිත පුද්ගලයෙක්, ඔබ අතරින් උසස්තම කෙනෙක් වේ." යයි නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ නිතර මෙන් පවසන බව අල් බුහාරි, මුස්ලිම් සහ අත් තිර්මිදි වාර්තා කළෝය.

"උසස්තම සදාචාරයන් සහ යහපත් ගති පැවතුම් සම්පූර්ණ කරනු පිණිස මම එවනු ලැබුවෙමි." යයි මුහම්මද් සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ පැවසූ බව අබූ හුරෙයිරා රලියල්ලහු අන්හු වාර්තා කරයි.

☐ අල්ලාහ් සහ අවසාන දිනය කෙරෙහි විශ්වාසය සහිතව නිරතුරුව අල්ලාහ් සිහි කරන කෙනෙකුට

මුහම්මද් සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් තුළින් අලංකාරවත් ආදර්ශයක් තිබෙන බව අල් කුර්ආනය පවසයි.

- ☐ ස්වර්ගයේ උසස්තම ස්ථානය මුහම්මද් සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන්ට හිමි යයි සියලු මුස්ලිම්වරු පිළිගන්නා අතර, ස්වර්ගයේ එතුමාණන්ට සමීප ස්ථානයක් ලබා ගැනීමට වෑයම් කිරීම අපි සියලු දෙනාගේම අරමුණවේ. උසස්තම සදාචාරයන් සහ යහපත් ගති පැවැත්ම තුළින් මෙය ඉටු කර ගත හැකි බව නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ පැවසූහ.

- ☐ කෙනෙකුගේ ධනය, උපත, අධ්‍යාපනය හෝ තනතුර අල්ලාහ් ඉදිරියේදී වැදගත් නොවන අතර, දේව විශ්වාසය සමඟ උසස්තම ගතිපැවතුම් සහිතව ජීවත් වන කෙනෙකුට උසස්තම ගෞරව හිමි වන බව මෙම හදීසය පෙන්වයි.

- ☐ සත්‍යතාව, අවංතභාවය, මෛත්‍රිය යන යහගුණයන් මුළු ලොවම අගය කරන බව කවුරුත් පිළිගනී. ආගමික ඉගෙන්වීමෙන් ඇත් වූ අදහස් දරණ සහ හැසිරීම් පවතින සමාජයන් හී පවා සත්‍යතාව උසස්

ගුණාංගයක් ලෙස සැලකේ. එහෙත්, මේ බව පිළි ගත් විගසින් සෑම කෙනෙක්ම තම ජීවිතයෙහි සෑම අවස්ථාවකම මෙම යහගුණය අනුගමනය කිරිමට නිතරමෙන් සූදානම්ව සිටින බව කිසිවෙක් නොපවසයි.

☐ අසත්‍ය දුටු විට ඇතැම් අවස්ථාවන්හී නිශ්ශබ්දව සිටින මිනිසුන්ද අප අතර සිටිති. තමන්ට වාසියක් සිදුවන්නේ නම්, වැරැද්දක් දුටුවත් නිහඬව සිටිනා අය, එම වැරදි ක්‍රියාවෙන් කිසිවෙකුට හානියක් සිදු නොවන බව තම අක්‍රියාවට හේතු දක්වති.

☐ මුළු නොවම පිළිගත් සදාචාරයන්ට මෙම හැසිරීම පටහැනි බව පෙනෙන්නේ නැද්ද? තවත් කෙනෙකුට හානියක් සිවු නොවන අසත්‍ය කරුණකින් තමාට ලාභයක් ලබා ගන්නෙක්, එතැනදී සත්‍ය දේ පවසා එම ලාභය ලබා ගැනීම සෑම අතින්ම උසස් බවද, ගෞරවය ගෙන දෙන බවද ඉස්ලාම් උගන්වයි.

☐ තමා උපදෙස් කළ සියලු සදාචාරයන් මුහම්මද් සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ පිළිපැද පෙන්වූහ. එතමාණෝ ලොවට ගෙන දුන් අලංකාරවත් ආදර්ශයන් සෑම සමාජයටම සෑම

කලකටම අත්‍යවශ්‍ය වන බැවින් ඒවායින් වැදගත් කරුණු කිහිපයක් මෙහිදී සඳහන් කෙරේ.

## 2. ලජ්ජාවීම යහ ගුණයක් ලෙස සැලකේ

“මිනිසුන් තම (සියලු) නබිවරුන්ගෙන් ඉගෙන ගත් දේශනා වලින් කොටසක් නම්, ලජ්ජාව පිළිබඳ හැඟීමක් ඔබට නොමැතිනම්, ඔබට කැමති දෙයක් කරනු,“ යනුවෙන් මුහම්මද් සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ පැවසූ බව අබූ මස්ඌද් උක්බා රළියල්ලහු අන්හු දන්වා ඉමාම් බුහාරි වාර්තා කරයි. පෙර වූ නබිවරුන්ගේ අනුශාසන නැවත වරක් සඳහන් කිරීමෙන්, එය ඉස්ලාම් ද පිළිගත් යහගුණයක් බව මුහම්මද් සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ පෙන්වා දුන්හ. එසේ නැත්නම් එම නිගමනය ප්‍රතික්ෂෙප කරන ලෙස නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ පැහැදිලිව පවසනු ඇත.

සියලු නබිවරුන් විවිධ ජාතීන්ට හා ජනයාට උගන්වා, සියලු ජනයා ඒකමතිව පිළිගත් දෙයක් නිසා මෙම නිගමනය නබි වරුන් ඉගැන් වූ මූලික සදාචාරයේ නීතියක් වේ.

අන් අයගේ හැඟීම් ගැන කිසිවක් නොසළකා, තමා කැමති ඕනෑම දෙයක් කරන්නට ලැජ්ජා නැති කෙනෙක් කිසිවිටෙක පසුබට නොවන්නේය.

එහෙත් කුළැටිකම හෝ ලජ්ජාව නිසා වැරදි සහ තහනම් ක්‍රියාවන් ගෙන් කෙනෙක් ඈත්ව සිටයි. වැරැද්දක් හෝ තහනම් දෙයක් කරන්නට කෙනෙක් ලජ්ජාවීම හෝ පසුබට වීම විශිෂ්ඨ සදාචාරයක් හෙයින් එය වර්ධනය කළ යුතු ගුණාංගයක් බවද සැළකේ.

මෙම හදීස් වදනින් පහත සඳහන් කරුණු කිහිපයක් පැහැදිලිවේ:

- ☐ වැරදි ක්‍රියාවක යෙදෙන්නට ලජ්ජා නොවන හෝ එම ක්‍රියාව නිසා අන් අයගේ පිළිකුලට භාජන වීම ගැන කිසිවක් නොතකන කෙනෙක්, තමා කැමති ඕනෑම හොඳ හෝ නරක දෙයක් ඉටු කරන්නේය. අවසානයේ ඔහු අල්ලාහ්ට මුහුණ දී එම ක්‍රියාවන්හී විපාකය, දඬුවම හෝ ත්‍යාගය ලබා ගනී.

- ☐ ඔබ කරන්නේ නිසැකවම ඉස්ලාමය ඉගැන්වීම් සමඟ එකඟ වන සහ ඉස්ලාම් අනුමත කරන යහපත් දෙයක් නම්, එම ක්‍රියාව ගැන ලජ්ජා වීමට කිසිදු හේතුවක් නැති හෙයින්, එය දිගටම කර ගෙන ගොස් අවසන් කරන්න.

- ☐ කෙනෙකු තුළ කුළැටිකම හෝ ලජ්ජාවීමේ ස්වභාවය නැති වී යෑමේ බැරෑරුම් තත්ත්වය

පිළිබඳව මහම්මද් සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ මෙයින් පෙන්වා දුන්හ.

මේ අනුව අපි යමක් කරන්නට පෙර, එය ලජ්ජා වීමට හේතු වන කරුණක් දැයි සොයා බලා, එය ලජ්ජා වීමට හේතුවන දෙයක් නම් එය අත හැර එයින් ඉවත් විය යුතුයි. එසේ නැතිනම් එය ඉදිරියට ඉටුකර ගෙන ගොස් අවසන් කළ යුතුය. මෙම නිගමනය ඉස්ලාම් හී සෑම දෙයකටම අදාල වන බව සලකන්න. අල්ලාහ් තහනම් කළ හෝ අකැමැති දෙයක් ඉටු කරන්නට කෙනෙක් ලජ්ජා වන නමුත්, අල්ලාහ්ගේ අණ හෝ අනුමත කළ දෙයක් ඉටු කිරීමට ලජ්ජා නොවන නිසා, වැරදි දෙයක් සිදු කිරීමට ලජ්ජාවීමේ සද්ගුණය මෙම හදීස් වදන පෙන්වයි.

☐ බලවත් ලජ්ජා සහිත කෙනෙක් නිවැරදි දෙයකට පක්ෂව පවා හඬ නගන්නට ඇතැම්විට අපොහොසත්විය හැකි වන බව සමහරුන් පවසති. මෙ නිසා අප සැමගේ යුතුකම වන නිවැරදි දේ ඉටුකිරීම සහ වැරදි දෙයින් වැළකීමේ ක්‍රියාව පවා හරියාකාරව ඉටු කිරීමට එම තැනැත්තාට නොහැකි වන බවද මේ අය පවසති. මෙම තැනැත්තා සත්‍ය දෙයට පක්ෂව හඬ නගන්නේද නැත.

මෙහිදී කෙනෙකුගේ දුබලකම සහ කුළැටිකම අතර අවුලක් සිදුවී තිබෙන බව පැහැදිලිව පෙනේ. මෙහි සඳහන් තැනැත්තා, තම අක්‍රියාවට ලජ්ජාව හේතුවක් බව කියා සිටියත්, ඔහු දුබල කෙනෙක් බව පැහැදිලිව පෙනේ. මෙවැනි අවස්ථාවන්හී, මුහම්මද් සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන්ගේ ආදර්ශය කුමක් දැයි බලමු.

☐ මුහම්මද් සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ ඉතාමත් කුළැටි ගති සහිත කෙනෙක් බව සහාබාවරු පවසති. “නිවසේ සිටිනා පිරිසිදු කන්‍යාවකට වඩා නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ තුළැටි ගති සහිත කෙනෙකි.“ යනුවෙන් අබූ සර්ද් අල් කුද්රි රලියල්ලහු අන්හු පැවසීය. තමාට හිමි දෙයක් අනුන් භුක්ති විඳින කල්හී එය ආපසු ඉල්ලා ගන්නට පවා එතුමාණෝ පසුබට විය. එහෙත්, තමා දේශනා කරන සත්‍ය හා අල්ලාහ්ගේ වදන් වෙනුවෙන් නැගී සිටීමටද ඒ වෙනුවෙන් සටන් කිරීමටද එතමාණෝ කිසි විටක පසුබට නොවීය. තම අවශ්‍යතා සඳහා කිසිවක් බලෙන් ඉල්ලීම් නොකළ එතුමාණෝ, අනුන්ගේ හිමිකම් හෝ අල්ලාහ්ට පමණක් හිමි දෙයක් ගැන කථා කිරීමට නිසැකව ඉදිරිපත් විය.

# 3. ඊමාන් යන දේව විශ්වාසයෙහි ලජ්ජාවීමද අංගයකි

“ඊමාන් කරුණු හැටකින් පමණ සමන්විතයි. එහි ප්‍රධාන අංගය, ‘අල්ලාහ් හැර නැමදුමට සුදුසු අන් කිසිවෙක් නැත‘ යන විශ්වාසය වේ. අවසාන අංගය මිනිසුන්ගේ ගමනට බාධක වන යමක් පාරෙන් ඉවත් කිරීමය. විළි ලැජ්ජාවද ඊමාන්හී අංගයක් වේ.“ යනුවෙන් මුහම්මද් සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ පැවසූ බව අල් බුහාරි වාර්තා කරයි. “වැඩිය ලැජ්ජාවන්න එපා“ යයි දිනක් තම සහෝදරයාට කෙනෙක් උපදෙස් දෙනු ඇසූ නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ, “ඔහුට පාඩුවේ ඉන්න දෙන්න. ලජ්ජාවීම ඊමානයේ කොටසකි.“ යයි පැවසූහ.

☐ කරුණු හැටකින් පමණ සමන්විත ඊමාන්හි විළි ලජ්ජාව ගැන විශේෂයෙන් සඳහන් කිරීමට හේතුවක් ඇත. දේව විශ්වාසය පිළිබඳ සියලු කරුනු සඳහා කවුරුත් ස්වකීය කැමැත්තෙන් වැයම් කළ යුතුය. තම දේව විශ්වාසය දැනුවත්ව කෙනෙක් ප්‍රකාශ කළ යුතුය. එමෙන්ම ගමනට

හිරිහැරයක් වන යමක් පාරේ තිබුනහොත් එය ප්‍රයාසයක් දරා ඉවත් කළ යුතුයි.

- මෙම හදීසයේ නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ යෙදූ ‘හයා‘ යන අරාබි පදට නොයෙකුත් අර්ථ තිබේ. විළි ලැජ්ජාව, ආත්ම ගෞරවය, කුළෑටිකම, බයාදුකම යනු මේවායින් සමහරකි.

- විළි ලජ්ජාව ස්වභාවිකව නැගෙන හැඟීමක් බැවින් එය දේව විශ්වාසය හා සමීපව සම්බන්ධවූ කරුණක් බව සැමටම නොපෙනේ. මේ නිසා කුළෑටිකම සිය වුවමනාවෙන් වර්ධනය කළ යුතු ගුණාංකයක් බව මෙම හදීස් වදන පෙන්වයි. මෙම කුළෑටිකම හේතුවෙන් ඉස්ලාම් තහනම් කළ දෙයින් කෙනෙක් දැනුවත්ව, ඕනෑ කමින් ඇත්ව ඉවත් වන්නේ නම්, එම තැනැත්තා අල්ලාහ්ගේ ආදරයට ලක්වන්නේය.

- මෙම හදීසය තුළින් කුළෑටිකම නොහොත් ලැජ්ජාවීමේ ස්වභාවය, දේව විශ්වාසයේ අංගයක් බවද, සමාජය ප්‍රිය කරන උසස් ගුණාංගයක් බවද වටහා ගත හැක.

☐ විළි ලැජ්ජා නැතිවීමේ ප්‍රතිඵලයක් වශයෙන් සමාජ හා පවුල් ජීවිතයන්හී පිරිහීම සිදුවේ. එවැනි සමාජයන්හි දේව විශ්වාසය නැතිවී යෑම හෝ ඊමානය අලංකාරවත් කට වචනයන්ට සහ ප්‍රාණයක් නොමැති චාරිත්‍රයන්ට හා වතාවත්වලට පමණක් සීමාවන අවස්ථාවන් අපි දකිමු. මේ හේතුවෙන් ලැජ්ජාවීමේ ස්වභාවය ඊමාන් යන දේව විශ්වාසය හා සම්බන්ධ කර ඉස්ලාම් පෙන්නුම් කරයි.

## 4. දෙමාපියන්ට ගරු කිරීම

*“එනු. ඔබ කෙරෙහි ඔබගේ පරමාධිපති (අල්ලාහ්) තහනම් කළ දෙය මම කියමි. ඔහුට (අල්ලාහ්ට) කිසිවක් සමාන නොකරන්න. දෙමාපියන්ට කරුණා වන්ත වන්න. දිළිඳුකම නිසා ඔබගේ ළදරුවන් නොමරන්න. ඔබටද, ඔවුන්ටද ආහාර දෙන්නේ අපිය. මහා පාපයන්ට, එයින් ප්‍රකට දෙයටද අප්‍රකට දෙයටද (ප්‍රසිද්ධියේ හෝ රහසිගතව) ළං නොවන්න.“* යනුවෙන් අල් කුර්ආන් 6:151 වාක්‍ය පවසයි.

‘තම දෙමාපියන්ට ශාප කිරීම විශාලතම පාපයකි.’ යනුවෙන් නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම්

තුමාණෝ වරක් පැවසූහ. 'තම දෙමාපයන්ට කෙනෙක් ශාප කරන්නේ කෙසේදැ?' යි සහාබාවරු එතුමාණන්ගෙන් විමසූ විට, 'මිනිහෙක් කෙනෙකුගේ දෙමාපියන්ට ශාප කළ විට ඒ තැනැත්තා හැරී මොහුගේ දෙමාපියන්ට ශාප කරන්නට යෙදෙයි.' යනුවෙන් නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ පිළිතුරු දුන්හ. ( අල් බුහාරි)

- ☐ අල්ලාහ්ට සහකරුවෙක් ඇතැයි කීමේ පාපයෙන් ඈත්වන ලෙස අණ කරන කුර්ආන් වාක්‍යයෙහි දෙමාපියන්ට කරුණාව දක්වන ලෙස සඳහන් කිරිමෙන් එහි වැදගත්කම පහදා ගත හැක.

- ☐ දරුවන් සඳහා දෙමාපියන් දරන පරිශ්‍රමය හේතුවෙන් දරුවන් තම දෙමාපියන්හට ආදරය දැක්වීම උසස්තම ගුණාංගයක් බව සියලු ආගම් පවසයි. නෑ සබඳකම් ගැන වැඩියෙන් සැලැකිලි නොදක්වන නවීන සමාජයන් හී පවා දරුවන් දෙමාපියන්හට ආදරය දැක්විය යුතු බව කවුරුත් පිළිගනී.

- ☐ සෑම දෙමාපියෙක්ම තම දරුවන් කෙරෙහි එක හා සමාන ඇදරය හා සැලකිලි දක්වන බව කිසිවෙක් නොකියයි. මෙහිදී ඇතැම් දරුවන් වඩාත් වාසනාවන්තයෝ වෙති. එහෙත් සෑම

දෙමාපියන්ම තම දරුවන්ට සැලකිලි දක්වන බවද, ඔවුන් හදා වඩා ගන්නට තම කාලය, ශ්‍රමය සහ ධනය වැය කර කායිකව හා මානසිකව වෙහෙසෙන බව නම් නිසැකයි. දෙමාපියන්හට ඇදරය දැක්වීම සෑම දරුවෙකුගේම පුද්ගලික වගකීමක් බව ඉස්ලාම් පවසයි. අල්ලාහ්ගේ ඒකීය භාවය පිළිගැනීමේ අත්‍යවශ්‍යතාවෙන් පසුව දෙමාපියන්හට ආදරය කිරීම මුස්ලිම්වරයෙකුගේ ජීවිතයේ ඉතාමත් වැදගත් කාර්යයක් බව නොයෙකුත් තැන් හි කුර්ආන් පවසයි.

- මෙම හදීස් වදනෙහි නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ වචන යොදා ඇති ආකාරය බලන්න. දරුවන් තම දෙමාපියන්ට ආදරය දැක්විය යුතු බව පැහැදිලි නමුත්, ඔහු කළ වැරදි ක්‍රියාව නිසා කිපුණු කෙනෙක් ඔහුගේ දෙමාපියන්ට ශාප කරන විට (බැණ වදින විට) ඔහු තම දෙමාපියන්ට සිදු කරන ඉතාමත් අකාරුණික ක්‍රියාවක් ලෙස මෙය සැලකෙන බව පෙන්වුහ. ගමේ රණ්ඩු දබරයක මෙය සිදු වන ආකාරය ලාංකික අපි දනිමු.

- තම දෙමාපියන්ට මෙවැනි පායක් සිදු නොකරන්නට කැමති දරුවෙක් අනවශ්‍ය රණ්ඩු දබර කිරීමෙන් වැළකී සමාජයේ සාමයෙන් ජීවත් විය යුතු බව කොයි කාටත් පැහැදිලි වේ.

- අනුන්ගේ ශාපයෙන් තම දෙමාපියන් රැක ගැනීමට වග බලා ගන්නා දරුවන්, තම දෙමාපියන්ගේ ගෞරවය ආරක්ෂා කිරීමත් සමඟ, පාප ක්‍රියාවකින් ඉවත් වන බවද නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ පෙන්වූහ.

# 5. අල්ලාහ් ප්‍රිය කරන ක්‍රියාවන් කිහිපයක්

අබ්දුල්ලාහ් ඉබ්න් මස්උද් රලියල්ලහු අන්හු මෙසේ දන්වයි. “දිනක් අල්ලාහ් කැමති ක්‍රියාවන් කුමක් දැ?“ යි නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන්ගෙන් ප්‍රශ්න කළෙමි. “නියමිත වෙලාවට සලාහ් ඉටු කිරීම.“ යැයි නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ පිළිතුරු දුන්හ. “ඊට පසුව කුමක්දැ?“ යි ඇසුවෙමි. “දෙමාපියන්ට ආදරය දැක්වීම.“ යනුවෙන් පිළිතුරු දුන්හ. “ඊට පසුව කුමක් දැ?“ යි විමසුවෙමි. “අල්ලාහ්ගේ මාර්ගයේ ජිහාද් කිරීම.“ යැයි නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම්

තුමාණෝ පැවසූහ. මෙම හදීසය මුස්ලිම්, අල් බුහාරි සහ අනිත් අයද වාර්තා කර ඇත.

“අල්ලාහ්ගේ අභිමතය දෙමාපියන්ගේ සතුට මත රැඳී පවතී. එමෙන්ම අල්ලාහ්ගේ අසතුට, තම දරුවන් කෙරෙහි දෙමාපියන්ගේ අමනාපය නිසා හට ගනී.“ යන නබි වදන ඉබ්දුල්ලාහ් ඉබ්න් උමර් රලියල්ලහු අන්හු දැන්වූ බව අල් බුහාරි වාර්තා කරයි.

කෙනෙක් ඉස්ලාම් සත්‍ය දහමක් යැයි හඳුනා ගෙන එය පිළිගැනීම, එහි ස්ථිරව රැඳී සිටීම, එම දහම අන් අයට පහදා දීම, මේවා ඉටු කිරීමේදී පැන නගින ප්‍රශ්නයන් සඳහා තම කාලය, ධනය, සහ අවශ්‍ය වුවහොත් ජීවිතය පවා පරිත්‍යාග කිරීම ද, ඒවා සියල්ල සතුටින් පිළිගැනීම යන දේ ජිහාද් හි අවශ්‍ය කරුණු වේ. මෙම පුළුල් අර්ථය වෙනුවට ජිහාද් යනු, ශුද්ධ වූ යුද්ධය පමණක් බව ඇතැමුන් වරදවා තේරුම් ගෙන ඇත.

- ☐ නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ මෙහිදී පළමුව අල්ලාහ්ට ඉටු කළ යුතු සලාත් නම් නැමදුම සඳහන් කළේය. ඊට පසුව දෙමාපියන්ට ඉටු කළ යුතු වගකීම ගැනද, අවසානව ඉස්ලාමීය සමාජයේ ශුභ සිද්ධිය සඳහා ඉටු කළ යුතු සේවය ගැනද සඳහන් කළ අයුරු සැලකිය යුතුයි.

- දෙමාපියන්ට ආදරය දැක්වීමේ ක්‍රියාව සමාජයේ අවශ්‍යතාවන්ට පෙර නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ සඳහන් කළේය. දෙමාපියන්ට ආදරය කිරීම ගැන කිසිවෙක් තර්ක නොකරන නමුත්, මෙම යුතුකම ඉටු කිරීමෙන් අල්ලාහ්ගෙන් ත්‍යාග ලැබෙනු ඇතැයි ඉස්ලාම් විශේෂයෙන් සඳහන් කරන බව බොහෝ දෙනෙක් නොදනී.

- මැදි වයසට පත් වන කෙනෙක්, තම පෞද්ගලික ප්‍රශ්න වලට කාලය වැඩියෙන් වැය කරන අතර දෙමාපියන්ගේ ශුභ සිද්ධිය ගැන ඔවුන් සෙවිල්ලෙන් නොසිටින බව සාමාන්‍යයෙන් අපි දකිමු. තම දෙමාපියන් ගැන සම්පූර්ණයෙන්ම අමතක කර ජීවත් වන අයහපත් දරුවන් ගැනද අපි අසා ඇත්තෙමු. මෙවැනි දරුවන්ට ඔවුන්ගේ වගකීම ගැන මතක් කරමින්, එය අත පසු කළහොත් සිදු විය හැකි විපාකය ගැනද මෙම හදීස් වදන අවවාද කරයි.

- තම ආදරයටත් ගෞරවයටත් හිමිකම් ඇති දෙමාපියන්ට අයත් යුතුකම් ඉටු නොකරන කෙනෙක් ඉස්ලාම් පණවන අනිකුත් රාජකාරි පවා පැහැර හැරීමට ඉඩ ඇත. මෙවැනි පුද්ගලයන්

සමාජයේ දුගීන්ට හා අසරණයන්ට පිහිට වන බව බලාපොරොත්තු වන්නේ කෙසේද?

- ☐ දෙමාපියන්හට ගෞරවය නොදැක්වීම අති විශාල පාපයක් බව අල් කුර්ආන් කිහිප තැන් හී සඳහන් කරයි. අල්ලාහ්ට සහකරුවෙක් ඇතැයි කීමේ පාපයෙන් පසුව දෙමාපියන්හට කරුණාව නොදැක් වීමේ පාපය ගැන කුර්ආන් සඳහන් කිරීමෙන් එහි බරපතළකම පැහැදිලි වේ.

- ☐ අල්ලාහ්ට අකීකරු වන කරුණු පමණක් හැර, දෙමාපියන් බලා ගැනීම, මුදලින් හා ශ්‍රමයෙන් ඒ දෙදෙනාට සහය වීම, සහ ඒ දෙදෙනා සතුටු කරන සියලු කරුණු දෙමාපියන්ට දරුවන්ගෙන් අනිවාර්යයෙන් ඉටුවිය යුතු බව කවුරුත් මතකයේ තබා ගත යුතුයි.

- ☐ ඇතැම් දරුවන් දෙමාපියන් එක්කෙනෙක් හෝ දෙදෙනාම මහලු වියට පත්වූ විට ඔවුන් වැඩිහිටි නිවසකට ඇතුලත් කර, එම නිවසට මාසිකව මුදල් ගෙවීමෙන් තම යුතුකම ඉටු කළ බව සිතා ගනිති. මෙවැනි ක්‍රියාව ඉස්ලාම් ප්‍රිය නොකරයි.

# 6. දෙමාපියන්ට උපස්ථාන කිරීමෙන් ස්වර්ගය හිමි වේ

*"අපි මිනිසාට ඔහුගේ දෙමාපයන් ගැන අවවාද කෙළෙමු. ඔහුගේ මව ප්‍රයාසයෙන් හා ප්‍රසව වේදනාවෙන් ඔහුව ඉසුලුවාය. ඔහුගේ කිරි වැරීම දෑවුරුද්දෙන් හි ය. මටද, නුඹගේ දෙමාපියන්ටද ස්තූති කරව. ඔබ අවසානයේ පැමිණෙන්නේ මා වෙතටය. නුඹට ඒ ගැන දැනුමක් නැති දෙයින් මට සමානයක් තබන්නට ඔවුහු නුඹට බල කළහොත් ඔවුන් දෙදෙනාට කීකරු නොවනු. එහෙත් මෙලොව ඔවුන් දෙදෙනා ඇසුරු කරවු. තවද, පසුතැවිලි වීමෙන් මා වෙත හැරෙන අයගේ මාර්ගය අනුගමනය කරනු. ඔබ නැවත පැමිණෙන්නේ මා වෙතටයි. එවිට ඔබ කළ සියලු දේ ගැන මම ඔබට දැනුම් දෙන්නේමි."* අල් කුර්ආන් 31: 14 හා 15.

"නින්දාවට හා පිළිකුල් බවට ඔහු පත්වුවා. නින්දාවට හා පිළිකුල් බවට ඔහු පත්වුවා. නින්දාවට හා පිළිකුල් බවට ඔහු පත්වුවා." යනුවෙන් තෙ වරක් නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ දිනක් කීහ. "කවුරුන් ගැන සඳහන් කරන්නේද නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමනි?" යැයි සහාබාවරු විමසූ විට. "මව් පියන් දෙදෙනාම හෝ එයින් එක්කෙනෙක් මහලු වයසේ ඔහු සමඟ ජිවත්ව සිටි නමුත්, අපාය ගින්නට ගොදුරු වන දරුවෙක්." යනුවෙන් නබි

සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ පිළිතුරු දුන් බව අබූ හුරෙයිරා රලියල්ලහු අන්හු දන්වා අල් බුහාරි වාර්තා කරයි.

- ☐ දරුවෙකු වදන්නට මවක් දරන වේදනාව ගැන ඉහත සඳහන් කුර්ආන් වැකිය සමාජයට මතක් කරයි.

- ☐ දරුවෙකු වැදූ පමණින් මවගේ බර අඩු නොවුනු බවද එම දරුවාට කිරි පොවා, හදා වඩා ගනු පිණිස මවක් පරිත්‍යාග රාශියක් කරන ආකාරයත් මෙම කුර්ආන් වාක්‍ය තව දුරටත් සඳහන් කරයි.

- ☐ දෙමාපියන් සමඟ මත භේදයක් ඇති කරගන්නට දරුවෙකුට තිබෙන එකම හේතුව ගැනත් කුර්ආන් සඳහන් කරයි. එනම්, අල්ලාහ්ට සමානව තබා, පිළිම, පිංතූරු, ජීවත්ව සිටින හෝ මළවුන්ට වැඳුම් පිදුම් කරන ලෙස දෙමාපියන් කියන්නේ නම්, එම නියෝගය පමණක් ප්‍රතික්ෂෙප කිරීමට දරුවෙකුට අයිතියක් ඇත. එම අවස්ථාවේ පවා ඔවුන්ට කාරුණිකව කථා කළ යුතු බවද කුර්ආන් පවසයි.

- ☐ මහලු වයසට පත් වූ දෙමාපියන්ට සේවය කිරීමේ අවස්ථාවක් ලබන්නට දරුවෙකුට වාසනාවක්

තිබිය යුතු බවද, එය තුළින් අල්ලාහ්ගේ සමාව ලබා ගත හැකි බවද මෙම හදීසය පෙන්වයි.

- මෙවැනි අවස්ථාවක් තිබියදීත්, එයින් අල්ලාහ්ගේ සමාව ලබන්නට කෙනෙක් අපොහොසත් වුවා නම්, ඔහුට වඩා අභාග්‍යවන්ත කෙනෙක් නැති බව මෙම හදිස් වදන සඳහන් කරයි.
- මහලු වියට පත් වූ දෙමාපියන්හට සේවය කිරීමෙන් අල්ලාහ්ගේ සමාව ලැබ ස්වර්ගය හිමි කර ගත හැකි බවද මෙයින් පෙනේ.

## 7. දෙමාපියන් අතර ප්‍රධාන තැන හිමිවන්නේ කාහටද?

මෙම ප්‍රශ්නයට මුහම්මද් සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන්ගේ උපදෙස කුමක් ද?

දිනක් කෙනෙක් "අල්ලාහ්ට පසුව මගේ ගෞරවය සහ යුතුකම ලබන්නට හිමිකම තිබෙන්නේ කාහටද?" යනුවෙන් නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන්ගෙන් විමසූ විට, "ඔබේ මව" යනුවෙන් එතුමා පිළිතුරු දුන්හ. "ඉන් පසුව කව්ද?" යැයි විමසූ විට "ඔබේ මව" යනුවෙන් එතුමා පිළිතුරු දුන්හ. "ඉන් පසුව කවුදැ?"යි තෙවන වරටත් විමසූ විට, "ඔබේ

මව“ යනුවෙන් නැවතත් පිළිතුරු දුන්හ. “ඉන් පසුව“ කවුදැ? යි ඔහු තවත් වරක් විමසූ විට “ඔබේ පියා“ යනුවෙන් නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ පිළිතුරු දුන් බව අබූ හුරෙයිරා රලියල්ලහු අන්හු දන්වා අල් බුහාරි, මුස්ලි, අමහද් සහ තවත් අය වාර්තා කළහ.

- ☐ තුන් වරක් මෙහිදී මව ගැන සඳහන් කර, ඉන් පසුව පියා ගැන සඳහන් කිරීමෙන්, දරුවෙකුගේ ජීවිතයෙහි මවක් දරන වැදගත් ස්ථානය පෙන්වන්නට හේතුන් රාශියක් තිබේ.

- ☐ දරුවන්ගේ කෑම් බීම්, ඇඳුම් පැලඳුම් වැනි දෛනික අවශ්‍යතා සියල්ල පිළියෙල කිරීම, ගේ දොර ශුද්ධ පවිත්‍ර කිරීම යන සියලු කටයුතු මවක් කිසිදු වේතනයක් නොලැබ ඉටු කරයි. මේවාට අමතරව පවුලේ නඩත්තුව සඳහා රැකියා කරන මව්වරුන්ද අද සමාජයේ බොහෝය. මෙවා දිනපතා සිදු වන හෙයින් මෙම උතුම් සේවය කිසිවෙක් ගණන් නොගන්නා පමණක් නොව ඒවා ප්‍රිය කරන්නේද නැත. මේ හේතුවෙන් මවට දැක්විය යුතු ගෞරවය සහ කරුණාව ගැන දරුවන් වැඩිය සැලකිලිමත් වන්නේ නැත.

- තම පවුලේ සහ දරුවන්ගේ අභිවෘද්ධිය සඳහා පමණක් නොව ඔවුන්ට තුන් වේල ආහාර ලබා දෙනු පිණිස විදේශ රැකියාවන්ට යන කාන්තාවන්ගේ කඳුළෙන් පිරුණු ශෝක ජනක කථාවන් අප්‍රමාණයි.

- ඇතැම් අවස්ථාවන්හි දරුවන් තම මවට නිවස තුළදී අකාරුණිකව සැලකුවත්, බැණ වැදුනත් මේවා කිසිවක් පිට අයට නොපෙනෙන නිසා තම මවට අකාරුණිකව සලකන දරුවෙක් පවා සමාජයේ ගෞරවයෙන් පෙනි සිටින්නට ඉඩ ඇත. එහෙත් පියෙකුට මෙලෙස සැලකුවේ නම් ඒ ගැන අසල් වැසියන් ඉක්මනට දැන ගනිති.

- පියාගේ ශාරීරික හැකියාව නිසා ඔහුට අකාරුණික වීමේ සීමාව ඉක්ම වන්නට පුතෙක් පසුබට වුවත් මවට මෙලෙස සැලකීම වලක් වන්නට කිසිවක් නැත.

- මේ හේතුන් නිසා වේදනාවට පත් වන අසරණ මැණියක් තම දරුවාගෙන් විඳින දුක පවසා, ඔහුට දඬුවම් දෙන ලෙස යාච්ඤා කළහොත් අල්ලාහ් එය අනිවාර්ය යෙන්ම ඉෂ්ට කරයි.

☐ දරුවාට සහ මවට මෙවැනි අවාසනාවන්ත දෙයක් සිදු වීම වළකන්නටත්, කෙනෙක් තුළ මවගේ අගය ගැන පහදා දෙන්නටත්, නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් මව ගැන විශේෂයෙන් සඳහන් කළේය.

මේ දැනුම ලත් දරුවන් තම මව කෙරෙහි අකාරුණික වීමට හෝ ඇගේ සිත් තැවිල්ලට හේතුවක් වීමට හෝ කිසිවිටෙක නොයෙදෙන්නේය.

☐ දරුවන් වෙනුවෙන් මවක් විශාල පරිත්‍යාගයක් කරන බව කවුරුත් දනී. ඒවා වෙනුවෙන් දරුවන් දෙමාපියන්ට තම යුතුකම ඉතා කාරුණිකව ඉටු කළ යුතුයි. මෙහිදී දරුවන් කරන්නේ ණය ගෙවීමකි. එහෙත් එවැනි ක්‍රියාවන් සඳහා අල්ලාහ්ගෙන් ඔවුන් විශේෂ ත්‍යාග ලබන බව කුර්ආන් සඳහන් කරයි.

☐ හජ් වන්නාවේ එක් අවස්ථාවකදි යෙමන් ජාතික වන්දනාකරුවෙක් තම මැණියන් පිට මත තබා කඅබාව වටා බොහෝ සතුටින් තවාෆ් කර ගෙන ගියේය. තමා ඔටුවෙකුට සමාන කරමින් කවියක් කියා තවාෆ් කරමින් සිටි ඔහු, උමර් ඉබ්න්

අබ්දුල්ලාහ් රලියල්ලහු අන්හු එහි දී දැක "මෙම ක්‍රියාවෙන් මගේ මවට හිමි යුතුකම මගෙන් ඉෂ්ට වුනාද?" යනුවෙන් එතුමාගෙන් විමසුවේය. උමර් ඉබ්න් අබ්දුල්ලාහ් එයට, "නැත. ඔබව වදන විට ඔබේ මව දැරූ වේදනාවෙන් සුළු කොටසක් වුවද තවමත් ඉෂ්ට වුයේ නැත." යනුවෙන් ඔහුට පිළිතුරු දුන්නේය.

- ☐ 'බිර්' යනු අල්ලාහ්ගේ ගුණාංගයන්ගෙන් එකකි. එම අරාබි වචන යෙහි අර්ථය කරුණාව, ගුණවත්කම, දයාව, අනුකම්පාව, ස්තූතිය, නිර්ලෝභී භාවය යනුවේ. මේ සියලු ගුණාංගයන් දෙමාපියන්ට දරුවෙක් දැක්විය යුතු උසස් ඉරියව් බව ඉස්ලාම් පෙන්වා දෙයි.

- ☐ මුස්ලිම් විද්වතුන් මෙම 'බිර්' යන වචනයේ අර්ථය කොටස් දෙකට බෙදා ඇත. එනම් දරුවෙක් දෙමාපියන්ට මුදලින් සහාය දැක්වීම සහ ශාරීරිකව සහාය දැක්වීම යනුවෙනි. මව්පියන් දෙදෙනාම හෝ එයින් එක් කෙනෙක් දුප්පත් වූ විට, දරුවෙක් තම වත්කමට එකඟව ඒ අයට සහය දිය යුතුයි. මෙය අනිවාර්යයෙන් සිදු කළ යුතු ක්‍රියාවක් වන අතර, තමා කැමති දේ (ඔවුන්ට සහය දෙන්නේද?

නොදෙන්නේදැ? යි) තෝරා ගැනීමේ අයිතිය දරුවෙකුට කොහෙත්ම නැත.

- ☐ තම දරුවා ගැන දෙමාපියන් සෑහීමට පත් වන කල්හි, අල්ලාහ් ද එම දරුවා ගැන සතුටු වන බව නිසැකයි. තවද දෙමාපියන් තම දරුවන් වෙනුවෙන් අල්ලාහ්ගෙන් ප්‍රාර්ථනා කළහොත් අල්ලාහ් එය ඉටු කරන බව කිසිදු සැකයක් නැත.

දෙමායන්හට මුදලින් සහය දිමට අමතරව ඒ දෙදෙනාට ගෞරවය දැක්විය යුතුයි. පියාට පෙර නොයෑම, පියාට ඉහළින් ආසනයක වාඩි නොවීම, වැදගත් අවස්ථාවන් හී පියාට ප්‍රධාන තැන දිම යනු මේවායින් කිහිපයකි. මෙවැනි පුතෙක් තමා ජීවත් වන සමාජයේ ගෞරවයද ලබා ගන්නා බව කවුරුත් පිළිගනි.

## 8. දරුවන් සඳහා දෙමාපියන්ගේ යාච්ඤාව

“තුන් පිරිස ගේ ප්‍රාර්ථනාවන්හට අල්ලාහ් වහාම පිළිතුරු දෙයි. ඒවා නම්, අයුක්තියට භාජන වූ කෙනෙකුගේ යාච්ඤාව, ගමනක යෙදුණු කෙනෙකුගේ යාච්ඤාව, සහ තම දරුවන්හට විරුද්ධව දෙමාපියන් කරන යාච්ඤාව.“ යනුවෙන් මුහම්මද් නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් පැවසු බව

අබූ හුරෙයිරා රලියල්ලහු අන්හු දන්වා අහ්මද් සහ තිර්මිදි වාර්තා කළහ.

- ☐ මේ තුන් පිරිසටම අදාල වන එක් කරුණක් තිබේ. ඒනම්, තම නිත්‍යානුකූල අවශ්‍යතාවන් ලබා ගැනීමට මේ අයට කිසිදු මාර්ගයක් නොමැති වීමයි.

- ☐ අයුක්තියට භාජන වූ කෙනෙක් තමාට උපකාර කරන්නට කිසිවෙක් නැති වූ විට අවසානයේ අල්ලාහ්ගේ සරණ පතයි.

- ☐ එමෙන්ම තම නිවසෙන් බොහෝ දුරක් ගමන් කළ මගියෙක් නොයෙකුත් අපහසුතා වන්ට මුහුණ දෙන විට අවසානයේ ස්ථිර අරමුණින් අල්ලාහ්ගෙන් සරණ පතයි.

- ☐ දෙමාපියන් සාමාන්‍ය යෙන් තම දරුවන්ට එරෙහිව ඔහු/ඇය කෙතරම් අයහපත් වුවත් කිසිවක් නොපතයි. එහෙත්, තම දරුවාගේ අකාරුණික ක්‍රියාවන් ඉවසීමේ සීමාව ඉක්ම වන්නේ නම්, අවසානයේ දරුවන්ට විරුද්ධව අල්ලාහ්ගේ සරණ පතන්නට ඔවුන්ටද සිදු වෙයි.

- ☐ තම දරුවන්හට කරුණාව දැක්විය යුතු දෙමාපියන් ඒ වෙනුවට ඔහුට ශාප කරන්නටත්, ඔහුට විරුද්ධව යාච්ඤා කරන්නටත් යෙදෙන්නේ නම්, ඔවුන්ගේ කම්පනය හට ගන්නට හේතු වූ දරුවාගේ පාපය ගැන වටහා ගත හැක.
- ☐ මෙවැනි සියලු අවස්ථාවන් හි කෙරෙන පැතුම් අල්ලාහ් පිළිගන්නා බවද, ඒවාට වහාම පිළිතුරු දෙන බවද මෙම හදීසය පවසයි.
- ☐ එමෙන්ම දෙමාපියන්හට අකාරුණිකව ක්‍රියා කරන දරුවන්හට, මෙම හදිසය බලවත් අවවාදයක් ලෙසද සැලකිය යුතුයි.

## 9. දෙමාපියන් සඳහා දරුවෙකුගේ යාච්ඤාව

දෙමාපියන් සඳහා දරුවෙකුගේ යාච්ඤාව අල්ලාහ් ඉෂ්ට කරයිද? මෙයට පිළිතුරු “ඔව්“ යනු වේ. *“මාගේ ස්වාමිනි, කුඩා කල සිට මා රැක බලා ගත් ඔවුන් (මගේ දෙමාපියන්) වෙත ඔබේ කරුණාව දක්වනු මැනව.“* යනුවෙන් ප්‍රාර්ථනා කරන ලෙස 17 : 24 අල් කුර්ආන් වාක්‍ය අපට අණ කරයි. අපගේ ප්‍රාර්ථණාවෙන් දෙමාපියන්හට සෙතක් සිදු

නොවන්නේ නම්, මේ ආකාරයෙන් යාච්ඤා කරන ලෙස අල්ලාහ් පවසයිද?

"කෙනෙක් අපවත් වූ විට කරුණු තුනක් හැර, ඔහුගේ සියලු ක්‍රියාවන් අහෝසි වනු ඇත. ඒවා නම්, නොකඩවා සිදු කරන කුසල් (සදකා) ක්‍රියාවක්, සමාජයේ දැනුම (අධ්‍යාපනය) වර්ධනය කිරීම සඳහා ඔහු කළ සේවය, සහ අල්ලාහ්ගෙන් තම දෙමාපියන් සඳහා යහපත් දරුවෙක් කරන යාච්ඤාව වේ." යැයි මුහම්මද් සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ පැවසූ බව අබූ හඅරෙයිරා රලියල්ලාහු අන්හු ගෙන් බුහාරි, මුස්ලිම්, අබූ දාවූද් සහ අන් නසායි වාර්තා කළහ.

- ☐ මහජනයාගේ ප්‍රයෝජනය සඳහා කෙනෙක් ඉදි කරන පොදු ළිඳ, පිං තාලිය හෝ ආලෝකය සැපයීම යනාදිය සදකා සමහරකි. මහජනයා මෙවැනි පහසුකම් මගින් ප්‍රයෝජන ලබන විට එහි කුසල මළ අයට එකතු වේ. දැනුම සඳහා කරන සේවාවන්හී පර්යේෂණ, පොත් පත් ලිවීම, සහ මුද්‍රණය කිරීම යන කරුණු අඩංගු වේ.

- ☐ මෙහිදී සැලකිය යුතු තවත් වැදගත් කරුණක් ඇත. එනම් කෙනෙක් ජීවත්ව සිටියදී කළ යහ ක්‍රියාවෙන් ජනතාව ප්‍රයෝජන ලැබ ඒ සඳහා අල්ලාහ්ගෙන් ප්‍රාර්ථනා කළත් නැතත් මරණයෙන්

පසුවද ඔහුට කුසල් එකතු වන නමුත් මළවුන්ගෙන් සහන පැතීමෙන් ජීවතුන් අතර සිටින අයට කිසිදු සැතක් සිදු නොවන අතර, මේ අය අල්ලාහ්ගේ කෝපයටද පත්වනු ඇත. මළවුන්ගෙන් සහන පැතීම අල්ලාහ්ට සමාන තැබීමේ ෂිර්ක් යන පාපයක් බව කුර්ආන් පවසයි.

"මගේ දෙමාපියන් මිය ගොස් අවසානයි. ඒ අය වෙනුවෙන් මගෙන් ඉටුවිය හැකි යුතුකම් කිසිවක් තිබේ දැ?" යි කෙනෙක් මුහම්මද් සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන්ගෙන් විමසීය. "ඔව්. කරුණු හතරක් ඇත. ඒ දෙදෙනා වෙනුවෙන් සමාව පතා අල්ලාහ්ට ප්‍රාර්තනා කිරීම, ඒ අයගේ කැමැත්ත ඉෂ්ට කිරීම, ඒ අයගේ මිත්‍රයන්හට කරුණාව දැක්වීම සහ ඒ අය මගින් ලැබුණු ඥාතීන් සමඟ සුහදව නෑකම් සම්බන්ධතා පැවැත් වීම." යැයි නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ පැවසුහ.

☐ මෙහි ප්‍රධාන කරුණු දෙමාපියන් වෙනුවන් අල්ලාහ්ගෙන් සමාව පතා දරුවෙක් අවංකව යාච්ඥා කිරීම වේ. හජ් හෝ උම්රා වන්දනාව අවසන් කළ කෙනෙක්, අපවත් වූ අය වෙනුවෙන් හජ් හෝ උම්රා කළ හැකි බව නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් උපදෙස් දී ඇති

හෙයින් මේ ක්‍රියාවන්ද දෙමාපියන් සඳහා කරන යාච්ඤාවක් ලෙස සැලකේ.

- මේවා හැර නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන්ගේ ආදර්ශයට එකඟ නොවන වෙනත් ක්‍රියාවන් සියල්ල, ඉස්ලාමයේ නැති නවීන දෙයක් ආගමට එකතු කිරීමේ බිද්අා නම් පාප ක්‍රියාවක් බව සලකන්න.

- දෙමාපියන් මගින් ලැබූ ඥාතීන් ගැන සැලකිලි නොදැක්වීම වර්තමාන සමාජයේ බහුලව සිදු වන බව අපි දකිමු. මේ නිසා සමාජයේ අසමගිය සහ අසහනය හටගන්නටද නොයෙකුත් ප්‍රශ්න පැන නගින්නටද ඉඩ ඇත.

 මෙවැනි සමාජයක් ඉස්ලාම් අනුමත නොකරන බව මුස්ලිම්වරු මතකයේ තබා ගත යුතුය.

# 10. නෑ සම්බන්ධකම අගය කිරීම

*"සියලු ප්‍රාණීහු මරණය භුක්ති විඳින්නෝය. යළි නැගිටින දිනයෙහි ඔබ උපයා ගත් දෙයින් ඵල විපාකය ගෙවනු ලැබේ. යමෙක් අපාය ගින්නෙන් ඈත් වනු ලැබ ස්වර්ගයට ඇතුළු කරනු ලබන්නේද,*

*ඇත්තෙන්ම ඔහු ජය ලැබුවේය.* "යැයි කුර්ආන් වාක්‍ය 3: 185 පවසයි.

ඉහත සඳහන් කුර්ආන් වාක්‍ය පෙන්වන ජයග්‍රහණයට ළඟා වන්නට මඟ සලස්වන කරුණු සියල්ල මුස්ලිම්වරයෙකුට බොහෝ වැදගත් බව කවුරුත් පිළිගනී. මෙනිසා නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් තම අනුගාමිකයන්ට ඒ සඳහා මාර්ගය පැහැදිලි කර දුන්හ.

දිනක් කාන්තාරයේ ගම්බද (බෙදුවින්) අරාබි ජාතිකයෙක් මුහම්මද් සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් ගෙන් "ස්වර්ගයට සමීප වීමට සහ අපාය ගින්නෙන් ඈත් විමට මඟ කුමක් දැයි මට පවසන්න" යැයි ඉල්ලුම් කළේය. "අල්ලාහ්ට කිසි කෙනෙක් හෝ කිසි දෙයක් හවුල් නොකර, අල්ලාහ්ට පමණක් වැඳ පිදුම් කරනු. ඔහුට පමණක් නොකඩවා සලාහ් කර, සකාත් බදු ද ගෙවනු. ඒ සමඟ නෑ සම්බන්ධ කම පෝෂණය කරනු." යැයි නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් ඔහුට පිළිතුරු දුන් බව අබි අයියූබ් අල් අන්සාරි රලියල්ලහු අන්හු දන්වා අල් බුහාරි වාර්තා කරයි.

කෙනෙකුගේ සමිප සහ දුර ඥතීන් 'රහ්ම්' යන අරාබි පදයෙන් හඳුන්වනු ලැබේ. රහීම් යන පදයේ මුල් අර්ථය අනුකම්පා සහ දයාලු භාවය වේ. "මම අර් රහ්මාන් (පරම දයාලු) වෙමි. මම නෑකම මවා (රහීම්)

එයට මගේ නමින් මූලාරම්භය ලැබූ නමද දුන්නෙමි. ඒ නම පෝෂණය කරන්නේ කවරෙක්ද, ඔහුට මම ආශීර්වාද කරමි. එය කපා හරින්නේ කවරෙක්ද, මම ඔහු කපා හරින්නෙමි.“ යැයි අල්ලාහ් පවසන බව නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන්ගේ හදිස් අල් කුද්සියක් අබ්දුල් රහ්මාන් ඉබ්න් අව්ෆ් රලියල්ලහු අන්හු දන්වා අදබ් අල් මුෆ්රද් හී අල් බුහාරි සඳහන් කරයි.

- අල් කුර්ආන් අවවාද කරන අපාය ගින්නෙන් ආරක්ෂා ලබන්නට, දේව විශ්වාසය සහිතව ආගමික කටයුතු වල නිරත වීමට අමතරව, නෑයන් සමඟ සුහද සම්බන්ධකම් පැවැත් වීමේ වැදගත්කම ගැනද, මෙම කුද්සි හදීස් සඳහන් කරයි.

- නෑ සම්බන්ධකමේ වැදගත්කම පිළිබඳව නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන්ගේ තවත් වැදගත් හදීසයක් දෙස බලමු. “නෑ සම්බන්ධකම අල්ලාහ්ගේ ආශීර්වාදයන්ගෙන් කොටසකි. එය පෝෂණය කරන්නා අල්ලාහ්ගෙන් ත්‍යාග ලබයි. එය කපා හරින්නා අල්ලාහ්ගෙන් (ඈත්ව) කපා හරිනු ලබයි.“ මෙම හදීසය අයිෂා රලියල්ලහු අන්හා තුමියගෙන් අල් බුහාරි වාර්තා කළේය.

- මෙහිදී නෑයන් යනු කවුරුන් දැයි ප්‍රශ්නයට නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන්ගෙන් පිළිතුරු සොයමු. නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන්ගෙන් වරක් බකර් ඉබ්න් අල් හරීත් අල් අන්සාරි රලියල්ලහු අන්හු මෙම ප්‍රශ්නය ඇසූ විට, "ඔබේ මව සහ පියා, සොයුරියන් හා සොහොයුරන්, ඉන්පසු අනිත් නෑ පිරිස. මෙම නෑකම පවත්වා ගෙන යෑම සහ එය පෝෂණය කිරීම ස්ථිර යුතුකමක් වේ." යනුවෙන් එතුමාණන් පිළිතුරු දුන්හ. අල් බුහාරි, අත් තිරිමිදි සහ අබූ දාවූද් වාර්තා කළහ.
- මෙම හදීස් හි නෑයන් අතර ප්‍රධාන තැන ගන්නේ කවුරුන් දැයි ක්‍රමානුකූලව පන්වා දී ඇත. මෙහි දී කාන්තා පක්ෂයට මුල් තැන දී ඇති ආකාරය බලන්න. මේ අනුව මවට පසු පියාද, සොයුරියට පසු සොහොයුරාද ඉන් පසුව අනිත් ඥාතීන්ද කෙනෙකුගේ සැලකිල්ලට හිමි කරුවෝ වෙති.

# 11. නෑකම අගේ කොට සැලකීම

"තම ආහාරයේ වර්ධනය දකින්නටද, දිගු කලක් ජීවත් වීමටද කැමති කෙනෙක්. නෑයන් අතර

සම්බන්ධතාව සුහදව පැවැත්විය යුතු“ යැයි නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් පැවසූ බව අනස් ඉබ්නු මාලික් රළියල්ලාහු අන්හු දන්වා අල් බුහාරි වාර්තා කරයි.

“අල්ලාහ් කෙරෙහි බිය බැතිමත්ව, තම නෑයන් සමඟ සම්බන්ධකම සුහදව පවත්වන කෙනෙක්, දීර්ඝ ජීවිතයද, ධනය වර්ධනය වීමද, පවුලේ අයගේ ආදරයද ලබයි.“ යනුවෙන් නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් පැවසූ බව අබ්දුල්ලාහ් ඉබ්න් උමර් රළියල්ලාහු අන්හු දන්වා අල් බුහාරි වාර්තා කරයි.

- ඉහත සඳහන් හදීස් වදන් දෙකම මෙලොව ජීවිතයට අදාළ කරුණු ගැන සඳහන් කරයි. මෙලොව සියලු සම්පත් උසස් ලෙස මිනිසා සලකන අතර, තමා උපයන සියල්ල අල්ලාහ්ගෙන් ලැබූ ආශීර්වාදයක් බව මුස්ලිම්වරයෙක් සලකයි.
- කෙනෙකුගේ රැකියාව, වෙළඳ ව්‍යාපාරය, දේපොළ වැනි දෙයින් පමණක් ඔහුට ධනය එකතු නොවන බවද, අල්ලාහ්ගේ උපකාරයෙන් සහ ආශීර්වාදයෙන් මේවා ලබා ගන්නට හැකි වූ බවද මුස්ලිම්වරු විශ්වාස කරති.

- කිසිම දෙයක් අහේතුවෙන් සිදු නොවන බව ඉස්ලාම් පවසයි. මේ නිසා වාසනාව යන වචනයට ඉස්ලාම් හී ඉඩ නැත. *"සියලු දේම (ඒවාට නියමිත) ප්‍රමාණයන් සහිතව නිර්මාණය කළේ ඔහුය. (අල්ලාහ්ය)"* යනුවෙන් පවසන 87:2 අල් කුර්ආන් වැකිය දෙස බලන්න.

- "නෑකම බිඳ දමන කිසිවෙක් ස්වර්ගයට ඇතුලු නොවන්නේය." යන නබි වදන ජුබෙයිර් ඉබ්න් මුතිම් රලියල්ලාහු අන්හු දන්වයි. මුස්ලිම් වරයෙක් තම ජීවිත කාලය මුළුල්ලේම මහන්සි දරන්නේ ස්වර්ගයට ඇතුළු වීමේ භාග්‍ය ලබන්නටයි. තම ඥාතීන් ගැන සැලකිලි නොදැක්වූ හේතුවෙන් ඔහුගේ සියලු ක්‍රියාවක්ම අපතේ යෑමට හැකි බව මෙම හදීසය අපට අවවාද කරයි.

- සෑම බ්‍රහස්පතින්දා සවස (සිකුරාදාට පෙරවූ රාත්‍රියන්හි) මිනිසාගේ ක්‍රියාවන් අල්ලාහ් ඉදිරියේ තබනු ලැබේ. "නෑකම බිඳ දමන කෙනෙකුගේ ක්‍රියාවන් කිසිවක් ඔහු (අල්ලාහ්) පිළි නොගනී." යැයි නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් පැවසූ බව අහ්මද් සහ අල් බුහාරි වාර්තා කළහ.

- ඉහත සඳහන් වදන් කිහිපයකින් නැකම සුහදව පැවැත් වීමෙන් සහ එය වර්ධනය කිරීම තුළින් අල්ලාහ්ගේ අනුග්‍රහය සහ ආශීර්වාදය නිසැකව ලැබෙන බවද, නැකම බිඳ දමන කෙනෙකුට අල්ලාහ්ගේ කෝපය හා දඬුවම හිමි වන බවද පැහැදිලිව පෙන්වා ඇත.
- "කෙනෙකුට උපකාර කිරීමට නිතර කැමැතිව සිටන්න. විශේෂයෙන් ඥාතීන්හට කරුණාව දක්වන්න. එසේ කළ නොහැකි නම්, යහපත් දේ කර අයහපත් දෙයින් වළකින්න. එයද කරන්නට අපොහොසත් නම් හොඳ දේ පමණක් හැර අන් කිසිවක් කථා කිරීමෙන් ඔබේ දිව රැක ගන්න." යනුවෙන් නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් කෙනෙකුට උපදෙස් දුන් බව අල් බරා ඉබ්න් අසිබ් රලියල්ලාහු අන්හු දන්වා අහ්මද් සහ අල් බයිහකි වාර්තා කළහ. මෙම ඉතාමත් පැහැදිලි හදිස් වදන ගැන විග්‍රහ කිරිමට අවශ්‍ය නැත.
- මෙලොව ජීවිතයෙහි සාමය ලබන්නටද, මරණයෙන් පසු ස්වර්ගයට ආතුළු වන්නටද, ඉහත සඳහන් ක්‍රියා මාර්ගය අවශ්‍ය වන බව නබි

සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් පැවසූ ආකාරය ඉතා පැහැදිලි බව නොපෙනේද?

## 12. කරුණාවට පිළිතුර සතුරුකම වන්නේ නම්

කරුණාව දක්වන කෙනෙකුට පවා වෙනස්කම් කරන්නට හා සතුරුකම් කරන්නට යෙදෙන ඇතැම් ඥාතීන් සිටිති. මෙම කළගුණ නොතැකීම නිසා සමාජයේ අසහනය පැන නඟී. මෙවැනි අසාධාරණයට භාජන වන කෙනෙක් පසුවන මානසික තත්ත්වය කුමක් ද? අසාධාණකම් කරන ඥාතීන් සමඟ එලෙසම අසාධාරණව හැසිරීමට කෙනෙක් පෙළඹීම ස්වාභාවිකයි. එහෙත් මෙහිදී නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් පෙන් වූ මාර්ගය කුමක් දැයි බලමු.

දිනක් මිනිසෙක් මුහම්මද් නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් වෙතට පැමිණ "අල්ලාහ් ගේ රසූල් සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණී! මගේ ඥාතීන්ගේ සම්බන්ධකම මම අගේ කොට සළකන නමුත්, ඔවුහු මාව ඈත් කර තබයි. මම ඔවුන්හට කරුණාව දැක් වුවත් ඔවුහු මාහට වෙනස්කම් කරති. ඔවුන් මට අසාධාරණකම් කරන නමුත්, මම තවමත් ඉවසමි." යැයි පැමිණිලි කළේය.

එවිට නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන්, “ඔබ පවසන්නේ සැබෑවක් නම් ඔවුන් දැවෙන ගිනි අළු කෑමට සිදුවනු හා සමානයි. ඔබේ යහ ක්‍රියාවන් ඉදිරියටත් පවත්වා ගෙන ගියේ නම්, ඔවුන්ට එරෙහිව අල්ලාහ්ගේ සහය ඔබට නොකඩවා ලැබෙන බව නිසැකයි.“ යනුවෙන් පැවසුහ. අබු හුරෙයිරා රලි අල්ලාහු අන්හු ගෙන් අල් බුහාරි, මුස්ලිම් සහ අහ්මද් වාර්ථා කළහ.

- ඇතැම් ඥාතින් අතර මෙවැනි අයහපත් හැසිරීම් තිබීම අපි දකිමු.
- ඇතැම් ඥතීන්ගේ මෙවැනි අසාධාරණ හැසිරීම නිසා පවුලේ සාමාජිකයන් අතර සමගිය හා සුහදතාව වෙනුවට, අසහනය, අමනාපය සහ ගැටුම් සිදුවීමට පටන් ගන්නා බව කොයි කාටත් පෙනේ.
- මෙවැනි අවස්ථාවන් හී ඉදිරියටත් කරුණාව දක්වන ලෙසද එසේ කරන කෙනෙකුට අල්ලාහ්ගේ සහය නොකඩවා ලැබෙන බවද නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් උපදෙස් දුන්හ.
- මෙවැනි අයහපත් නෑයන්ගේ ක්‍රියා මාර්ගය කවදා හෝ හෙළිවන බවද, එවැනි අවස්ථාවකදි තමන්

ජීවත් වන සමාජයේ පිළිකුලට ඔවුන් භාජනය වන බවද අපට දැක ගත හැක.

- එපමණක් නොව උදව් උපකාර කරන නෑයෙකුට වෙනස්කම් හෝ සතුරුකම් කරන අයට ගිනි අළු කෑමට සිදු කරන අල්ලාහ්ගේ දඬුවම ගැනද නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් අවවාද කළහ.

# 13. කාන්තාවන්ට යහපත් සැලකිලි

ඉස්ලාමයට පෙර වූ පැරණි සමාජයන් හී කාන්තාවන් මහා අපරාදයන්ට ලක් වූ පිරිසක් බව කවුරුත් දනී. ගැහැණු දරුවෙකුගේ උපත පියෙකුට සිදුවූ විශාල අවනම්බුවක් බව සැලකුණි. දුවෙක් ඉපදුනු විගස, පියා විසින් පණ පිටින් වළ දැමීමේ පාපයද ඇතැම් අවස්ථාවන් හී සිදු වුණි. මෙම විපාකයෙන් මිදුණු ගැහැනු දරුවෙකුට තිබෙන එකම අනාගතය විවාහක ජීවිතයයි. ඇගේ පුරුෂයා ඇයට සලකන්නේ භාණ්ඩයක් හා සමාණවයි. කාන්තාවක් දරුවෙක්, විශේෂයෙන් පුතෙක් වැදුවේ නැත්නම්, එයට වැරදිකාරිය ඇය පමණයි. ඇගේ සැමියා මළ විට ඔහුට හිමි දේපළ සහ භාණ්ඩයන් හා සමානව ඇයද සළකනු ලැබීම එම යුගයේදී සාමාන්‍ය ලෙස පිළිගත්

සිරිතක් විය. මේ හේතුන් නිසා ස්ත්‍රීන් විශාල පිරිසක් තම ජීවිතයේ දුක හැර අන් කිසිවක් නුදුටු අතර, ඇතැම් වාසනාවන්ත කාන්තාවන්ට පමණක් මෙවැනි අයහපත් දේවලින් මිදීමට හැකි වුණි.

මෙවැනි පහත් සැලකීම් පැරණි අරාබි සමාජයට පමණක් සීමා වුණා යැයි නොසිතන්න. ලොවේ දියුණු වූ යැයි සලකනු ලබන සමාජයන් හි පවා කාන්තාවන්ට හිමි විය යුතු ගෞරවය හා සාධාරණ සැලකිලි නොලැබුණි. පැරණි යුරෝපයේ විවාහයෙන් පසුව ඇය සහ ඇගේ සියලු දේපළ, ඇගේ සැමියාට හිමි වූණු අතර ඇගේ පෙළපත් නාමයද වෙනස් කර, තම සැමියාගේ නාමය භාවිත කිරීමෙන් ඇගේ උපත් අයිතියද පැහැර ගනී. ලංකාවේ දේපොළ රැකගනු පිණිස සහෝදරයන් දෙදෙනෙකුටම එක කාන්තාවක් විවාහ කර දුන් ඉතිහාසය තවමත් අමතක වී නැත.

භාරත දේශයේ හින්දු සමාජයේ රූමත් තරුණියන් දේව දාසි යන නමින් හින්දු දේවස්ථානයන් හී වහල් ජීයිතයට විකුණනු ලැබ, එහි පූජකයන් සහ ගමේ උසස් කුලයට අයත් ධනවතුන්ගේ විනෝද භාණ්ඩයක් බවට පත් ව, අවසානයේ ගණිකා නිවෙස් වල තම ජීවිතයේ අවසාන කාලය ගෙවීම අද පවා සිදු වන බව වාර්ථා වේ.

19වන ශත වර්ෂයේ යුරෝපයේ කාන්තාවන්ට ලැබුණු නිදහසින් පසුව විශාල වෙනසක් දක්නට

ලැබුණි. කලකට පසු එහි කාන්තාවෝ පිරිමින් හා සමාන ස්ථානයක් ලබා ගත්හ. මේ සඳහා අවශ්‍ය අණ පනත් සකස් කරන ලද නමුත් මෙයින් වෙනත් ක්‍රමයක ගසා කෑමකට දොර විවෘත වුණි. දියුණු ලෙස අද සැලකෙන බොහෝ රටවල කාන්තාවන් රාගික භාණ්ඩයක් බවට පත් ව සිටිති. අඩ නිර්වස්ත්‍රව පෙනී සිටින කාන්තාවන්ගේ රූපය වෙළඳ දැන්වීම් පුවරු සහ රූපවාහිණී තිරයේ ප්‍රදර්ශන කරන ආකාරය කවුරුත් දන්නා රහසකි. නවීන සමාජයේ කාන්තාවන් තම නිවසෙන් පිට වී රැකියා කිරීමට අවශ්‍ය වී තිබෙන අතර, කර්මාන්ත ශාලාවන් හී සහ පිටරටවල මෙහෙකාර සේවයේ නිරත වන කාන්තාවන්ගේ වේතනයෙන් යැපෙන පවුල් අප්‍රමාණය. මෙසේ රැකියා කරන කාන්තාවන්ගේ දුක කියා නිම කළ නොහැක.

පිරිමින් හැ ස්ත්‍රීන්ට සමාන තැන දුන් ඉස්ලාමිය සමාජයන් හී පවා කාන්තාවන් දුක් විඳින බව අපි දකිමු. මෙයට හේතුව ඉස්ලාමිය ගති පැවතුම් මෙම සමාජයෙන් දුරස් වීමයි. බටහිර රටවල් මෙයට ඉස්ලාමයට එරෙහිව චෝදනා නඟන්නට යෙදෙන නමුත් ඔවුන්ගේ සමාජයන් හී ද කාන්තාවන්හට කරන අපරාධයන්ට සීමාවක් නැත. ලොව සෑම රටකම විශේෂයෙන් බටහිර සමාජයන් හී උගත් පිරිස අතර ඉස්ලාම් වේගයෙන් පැතිරී ගෙන එන බව කවුරුත් දනී. සිය කැමැත්තෙන් ඉස්ලාමය තුළට පිවිසෙන

නවක මුස්ලිම්වරුන් අතර 80% උසස් අධ්‍යාපන ලත් වෘත්තියක යෙදෙන කාන්තාවන් බව සලකන විට කාන්තාවන්හට ඉස්ලාම් දක්වන විශේෂ ගෞරවයට වෙනත් සාක්ෂියක් අවශ්‍ය වන්නේද?

කාන්තාවන්ට අයිතිවාසිකම් ලබා දුන්නා පමණක් නොව, ඔවුන්ට කරුණාවෙන් සැලකිය යුතු බව නබි සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් තුමාණන් පිරිමින්ට නිතර මෙන් මතක් කළේය. කාන්තාවන් ගැන ඉස්ලාම් දක්වන මත කුමක් දැය් මෙහිදි සඳහන් කිරීම උචිතයි. “දූවරුන් තිදෙනෙක් සිටින කෙනෙක් ඉවසීමෙන් හා කරුණාවෙන් තමාට හැකි වන පරිදි ඒ අය හදා වඩා ගත්තේ නම්, ඒ අය ඔහුට අපාය ගින්නන් ආරක්ෂාව සපයති.“ යැයි නබි සල් තුමාණන් පැවසූ බව උක්බා බින් ආමර් රලියල්ලාහු අන්හු දැන්විය.

“දූ වරුන් දෙදෙනෙක් සිටි මුස්ලිම්වරයෙක් ඒ දෙදෙනා කරුණාවෙන් හදා වඩා ගත් විට ඔහුට ස්වර්ගයට ඇතුළු වන්නට ඒ දෙදෙනා මාර්ගය සලස්වති.“ යනුවෙන් නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් පැවසූ බව ඉබ්න් අබ්බාස් රලියල්ලාහු අන්හු දැන්විය. මෙම හදීස් වදන් දෙකම ඉබ්න් මාජා සහ අල් බුහාරි වාර්තා කළහ.

- මෙවැනි හදිස් මගින් තම දැරියන්ට කරුණාව දක්වන ලෙස නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම්

තුමාණන් තරයේ උපදෙස් දුන්හ. මෙහිදි පළමුවන හදීසය දැරියන්ගේ උපත පිළිබඳව එදා සමාජයේ පැවතුනු මතය වෙනස් කරන්නට යෙදෙයි.

- පළමු වන දරුවා දුවෙක් වූ විට එයින් ප්‍රශ්නයක් මතු නොවෙයි. එහෙත් දෙවැනි හා තුන්වන දරුවන්ද දූවරුන් නම් එම පවලේ සතුට වෙනුවට අසහනය පැන නගින්නට ඉඩ ඇත. මෙවැනි වැරදි හැඟීම් අප සමාජයේ අද පවා දකින්නට තිබේ.
- මෙවැනි අවස්ථාවන් හී වැරදිකාරිය බිරිඳ බව චෝදනා නඟන්නට යෙදෙන අයට, ගැහැනු දරුවන් සතුටික් පිළිගත යුතු බවද, දූ වරුන් පියෙකුට අපාය ගින්නෙන් ආරක්ෂාව දෙන බවද මෙම හදීසය පෙන්වයි.
- මෙහි සඳහන් දෙවන හදිසය දූ වරුන් දෙදෙනෙකු බලා ගැනීම තුළින් පියෙකුට ස්වර්ගය හිමි වන බව පෙන්වයි.
- දඩුවමින් බේරෙනු පිණිස තම රාජකාරිය ඉටු කරන මිනිසුන් අපි දකිමු. මෙහිදී සිය කැමැත්තෙන් කෙනෙක් දූ වරුන්ට කරුණාව දක්වන විට, එහි පතිඵල වශයෙන් අල්ලාහ්ගේ

සතුට ලබා ගැනීමේ භාග්‍ය හිමි වීම බව කිසිදු සැකයක් නැත.

## 14. කෙනෙකුගෙන් යැපෙන කාන්තාවන්

"දැරියන් තිදෙනෙක් හෝ සොයුරියන් තිදෙනෙක් සිටින මුස්ලිම් වරයෙක් ඒ අය කරුණාවෙන් බලා ගත්තේ නම්, ඔහු අනිවාර්ය යෙන්ම ස්වර්ගයට ඇතුළු වන්නට වරම ලබයි." යනුවෙන් නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් පැවසූ බව සර්ද අල් කුද්රි රලියල්ලාහු අන්හු දන්වා අබූ දාවූද්, අහ්මද් සහ අල් බුහාරි වාර්තා කළහ.

- ➢ කරුණාවෙන් සලකන්නට පියෙක් නොමැති බොහෝ තරුණ කාන්තාවන් සමාජයේ සිටින අතර, මෙම අසරණ පිරිසගේ තත්ත්වය ගැන ඉහත සඳහන් හදීසය පෙන්නුම් කරයි.
- ➢ පියෙක් තම දූ වරුන්ට සැලකිලි දැක්වීම ස්වාභාවිකයි. එමෙන්ම සමාජයේ යැපීමට මාර්ගයක් නොමැති කාන්තාවන්ගේ වගකීම ඔවුන්ගේ පියාට පසුව සොයුරන් වෙත ඉස්ලාම් පවරා ඇති බව දන්නේ කී දෙනෙක්ද?

- නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් මෙම හදීස් මගින් කාන්තාවන් සියලු දෙනා ගැන සඳහන් කළහ. මෙහිදී කෙනෙක් තම හැකියාවට එකඟව කාන්තා පිරිස රැක බලා ගැනිම උසස් ලෙස සලකනු ලැබේ. කිසිම කාන්තාවන් තම ඥාතීන්ගේ නොසැලකිල්ලට භාජන විම ඉස්ලාම් අනුමත නොකරයි.
- දික්කසාද වූ කාන්තාවක් පියාගේ නිවසට නැවත පැමිණෙන කල ඇය ආදරයෙන් පිළි ගැනීම නිවසේ සිටින සෑම කෙනෙකුගේම යුතුකම වේ. ඇතැම් විට එම කාන්තාව කිසිදු වරදක් නොකර ඇගේ පවුල් ජීවිතය විනාශ වන අවස්ථාවන්ද ඇත. මෙවැනි කරදරයන්ට භාජනය වූ කාන්තාවකගේ මානසික තත්ත්වය ගැන අවබෝධ කර ගන්නට ඇයට හැර අන් කිසිවෙකුට අපහසුය.
- “උසස්තම සදකාව (දන් දීම) කුමක් දැයි පවසන්නද?“ යනුවෙන් දිනක් නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් සුරාකා ඉබ්න් මාලික් රලියල්ලාහු අන්හු ගෙන් විමසුහ. “ඔව් නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමණි“ යැයි සුරාකා පිළිතුරු දුන් විට, “ඔබේ දුවෙක් යැපීමට

කිසිවෙක් නොමැතිව ඔබ වෙතට පැමිණෙන කල්හී ඇය ආදරයෙන් බලා ගැනීම." යැයි නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් පැවසූ බව ඉබ්න් රවාහා රලියල්ලාහු අන්හු දන්වා අල් බුහාරි, අහ්මද්, ඉබ්න් මාජා සහ අන් නසායි වාර්තා කළහ.

- මෙවැනි අවස්ථාවක තම දියණියට සිය කැමැත්තෙන් කරුණාව දක්වන පියෙකුට අල්ලාහ් ත්‍යාග දෙන බව මෙම හදීසය පවසයි.
- දික්කසාද වූ දියණියක් නිවසට පැමිණීම බරක් ලෙස සලකන මෙම යුගයේ, ඇය ආදරයෙන් බලා ගැනීමෙන් පියෙකුට ස්වර්ගයට මාර්ග විවෘත වන බව නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් පෙන්වූහ.

# 15. අසල් වැසියන්ට යහපත් වීම

"ජිබ්රීල් (අලෛ) අසල් වැසියන් සමඟ කාරුණිකව සිටින ලෙස මට නිතර නිර්දේශ කළ ප්‍රමාණයට අසල් වැසියන් මගේ උරුමක් කාරයන් බවට පත් වෙයිද කියා මට සිතුනි." යැයි නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් පවසා,

අයිෂා රලියල්ලාහු අන්හා තුමිය දැන් වූ බව අල් බුහාරි, මුස්ලිම් සහ මාලික් වාර්තා කළහ.

"අල්ලාහ් සහ අවසාන දිනය කෙරෙහි විශ්වාස කරන කෙනෙක් අසල් වැසියන්හට කාරුණික විය යුතුයි. අල්ලාහ් සහ අවසාන දිනය කෙරෙහි විශ්වාස කරන කෙනෙක් ආගන්තුකයන්ට ගෞරවයෙන් සැලකිය යුතුයි. අල්ලාහ් සහ අවසාන දිනය කෙරෙහි විශ්වාස කරන කෙනෙක් හොඳ දෙයක් පවසන්නට නොහැකි නම් නිශ්ශබ්දව සිටිය යුතුයැ." යි නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් පවසා අබූ හුරෙයිහි අල් කුසායි රලියල්ලාහු අන්හු දැන් වූ බව අල් බුහාරි, මුස්ලිම් සහ අහ්මද් වාර්තා කළහ.

- අල්ලාහ්ගේ අණට කීකරු වන සමාජයක් ගොඩ නැගීම පමණක් නොව යහ ගුණය අගය කරන සෑම කෙනෙකුම අත්‍යවශ්‍ය අංගයක් ලෙස සලකන, සමගියට මඟ පෙන්වන සමාජයක් ස්ථාපිත කිරීම ඉස්ලාමයේ අරමුණ වේ.

- මෙහි මුල් පියවරක් වශයෙන් අසල්වාසීන් තමන් අතර සමගියෙන් ජීවත් වීමට ඉස්ලාම් මඟ සලස්වයි. සෑම කෙනෙකුටම සමාජය කෙරෙහි යුතුකම් හා වගකීම් තිබෙන අතර ඒවා ඉටු කිරීම තුළින් සෑම කෙනෙකුටම සමාජයෙන් ආරක්ෂාව ලැබෙයි. නිතර රණ්ඩු දබර වන අසල්වාසීන්ගෙන්

හැකි පමණ ඈත් වී සිටීමටද, එසේ සිටින්නට නොහැකි වූ විට වෙනත් පළාතකට ගොස් ජීවත් වීමටද කවුරුත් වෙහෙසෙන බව අපි දකිමු.

- මේ හේතුවෙන් උසස්තම ගුණාංගයන් සහිත සමාජයක් ගොඩ නැගීමට මුල් පියවර වශයෙන් අසල් වාසීන් අතර සමගිය තහවුරු කරන්නට නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ යෙදුණෝය.
- අපට මෙන් අසල් වාසීන්ටද අයිතිවාසිකම් තිබෙන බව අපි පිළි ගත යුතුයි.
- යහ ක්‍රියාවන් කිසිවක් කිරීමට නොහැකි කෙනෙක් නිශ්හබ්දව සිටීමත් යහ ක්‍රියාවක් ලෙස සැලකෙන බව නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් පැවසුහ.
- අසල් වැසියන්ට මෛත්‍රිය දැක්වීම ඊමාන් යන දේව විශ්වාසය හා සම්බන්ධ කරුණක් බවද මෙම හදිසය අපට පෙන්වයි.

## 16. යහපත් අසල් වැසියක් වන්නේ කෙසේද?

"තම අසල් වැසියා කුස ගින්නේ සිටියදී තම කුස පිරෙන්න ආහාර අනුභව කරන කෙනෙක්, (දේව විශ්වාසය සහිත) මූමින්වරයෙක් නොවන්නේය." යනුවෙන් නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් පැවසූ බව අබ්දුල්ලාහ් ඉබ්න් අබ්බාස් රලියල්ලාහු අන්හු දන්වා අල් බුහාරි වාර්තා කරයි.

අසල් වැසියන්ට කරුණාව දැක්වීමේ අවශ්‍යතාව ගැන පවසන්නට මෙයට වඩා පැහැදිලි වාක්‍යයක් තිබේද?

- සමාජයේ සමගිය වර්ධනය කරන, ඉස්ලාම් දහමට පටහැනි නොවන සියලු කරුණු අසල් වැසියෙකුට බලපානවා ඇත. අසල් වැසියෙක් මුණ ගැසුනු විට ඔහට සලාම් කියා ආචාර කිරීම, ඔහුගේ සුව දුක් විමසීම සහ ඔහුට උදව්වක් අවශ්‍ය වූ විට හැකි නම් එය ලබා දීම, ඔහු සමඟ සුහදව කථා කිරීම, ඔහුගේ ඥාතියෙක් හෝ මිතුරෙක් මිය ගිය විට කනගාටුව ප්‍රකාශ කිරීම, ඔහුගේ නිවසේ සතුටුදායක දෙයක් සිදු වුවහොත් ඔහුට සුබ පැතීම, ඔහුගේ පවුලේ මරණයක් සිදු වූ විට එයට සහභාගි වීම යනු මෙයින් සමහරකි. ඒ සමඟ ඔබෙන් සිදු වන යම් කරදරයක් පිළිබඳව ඔහු පැමිණිල්ලක් කළ හොත්, එයට හැකි අයුරින් සහන සැලසීම උතුම්ය. ඔහුගේ නිවසට හිරු එළිය ලැබෙන්නට

බාධාවන සේ ඔබේ නිවස උසට ඉදි නොකළ යුතුයි.

- මුස්ලිම් සමාජයේ කවුරුත් ආහාර සහ කුඩා ත්‍යාගයන් හුවමාරු කර ගන්නා බව රහසක් නොවේ.මෙවැනි ත්‍යාග කෙතරම් සුළු වුවත් සතුටින් පිළිගත යුතුයි. අසල් වැසියන් අතර මෙවැනි සැලකීම් පවතින්නේ නම්, සමාජය තුළ සුහදතාව සහ සමගිය පැතිරෙන අතර, මුළු සමාජයම මෙයින් ප්‍රයෝජන ලබයි. මෙවැනි සමාජයක දුප්පත් අයට උපකාර වන්නට කිහිප දෙනෙක් ඉදිරිපත්පත් වෙති. එය සිදු වුවහොත් මහලු අය සහ වැන්දඹු අය කථා කරන්නටවත් කිසිවෙක් නොමැතිව අනාථයන් මෙන් වැඩිහිටි නිවාසයන් හි හුදගලාවේ කාලය ගෙවීමට සිදු නොවේ.
- මෙවැනි යහපත් සමාජයන් සෑම ගමකම ගොඩ නැඟීම ඉස්ලාම් හී අරමුණයවේ. නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් අසල් වැසියන් සමඟ ආදරයෙන් සිටීම දේව විශ්වාසය හා සම්බන්ධ කර උපදෙස් දුන්නේ මේ නිසාය.

# 17. අසල් වැසියන් අතර අයහපත් හැසිරීම

වරක් නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් අනියම් ලිංගික සම්බන්ධකම ගැන විමසුහ. එයට සහාබාවරු “ එය තහනම් දෙයකි. අල්ලාහ් සහ ඔහුගේ නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් එය සම්පූර්ණයෙන් තහනම් කර ඇත.“ යනුවෙන් පිළිතුරු දුන්හ. එවිට නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ “කෙනෙක් තම අසල් වැසියාගේ බිරිය සමඟ අයුතු සම්බන්ධකම් පැවැත්වීම, කාන්තාවන් දහ දෙනෙකු සමඟ අනියම් ලිංගික සම්බන්ධකම් පැවැත් වීමට වඩා මහ අපරාධයක් වේ.“ යනුවෙන් පහදා දුන්හ. ඉන් පසුව සොරකම් කිරීම සම්බන්ධව විමසුහ. එයට සහාබාවරුන්, “එය තහනම් කළ දෙයකි. අල්ලාහ් සහ ඔහුගේ නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් එය සම්පූර්ණයෙන් තහනම් කර ඇත.“ යනුවෙන් පිළිතුරු දුන්හ. එවිට නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ “කෙනෙක් තම අසල් වැසියාගේ නිවසින් සොරකම් කිරීම, ගෙවල් දහයකින් සොරකම් කිරීමට බඩා බරපතල අපරාධයකි.“ යනුවෙන් පහදා දුන්හ. මෙය මික්දාද් අල් අස්වද් රලියල්ලාහු අන්හු දන්වා අහ්මද් සහ අල් බුහාරි වාර්තා කළහ.

අසල් වාසීන් සෑම කෙනෙකුම, සෑම විටම යහපත් ලෙස හැසිරෙන බව කිසිවෙක් නොකියයි. අසල් වාසීන්ගේ ඕපාදූප ගැන සිතර සෙවිල්ලෙන් සිටින අය

ඕනෑ තරම් සිටිති. නිවසක කරදරයක් සිදු වූ විට එය ගැන මුලින්ම දැන ගන්නේ අසල් වැසියන්ය. පහත් ගති පැවතුම් සහිත ඇතැම් අය තම අසල් වැයාගේ නිවසේ මතු වන ප්‍රශ්න වලින් අයුතු ප්‍රයෝජන ගන්නා අවස්ථාවන්ද ඇත. මෙවැනි අය කරදරයකට ලක් වූ අසල් වැසියාට පිහිට වීම වෙනුවට, එ වැනි අවස්ථාව තුළින් තවත් විනාශයන්ට මඟ පාදයි.

- මෙම හදිස් වදන් තුළින් කෙනෙක් අසල් වාසීන්ට කරන පාප ක්‍රියාවන්, තවත් කෙනෙකුට කරන එවැනි පාප ක්‍රියාවන් මෙන් දහ ගුණයක් හා සමානව සැලකෙන බව නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ පෙන්වා දී ඇත. කෙනෙක් තම අසල් වාසීන් සමඟ සමීපයෙන් ආශ්‍රය කිරීම ස්වාභාවිකයි. මෙ මගින් ඔවුන්ගේ සියලු අභ්‍යන්තර තොරතුරු දැන ගන්නටද අවස්ථාවන් ඇත. මෙම දැනුම අකටයුත්තක් සඳහා උපයෝගී කරගන්නට කෙනෙක් සිතීම ඉතාමත් පහත් ක්‍රියාවකි.
- මෙසේ කියන්නට තවත් හේතුවක් ඇත. එනම්, තම අසල් වැසියාගේ කරදරයකට පිහිට විය යුතු කෙනෙක්, ඒ වෙනුවට ඔහුට තවත් කරදර හා

අසහන හට ගන්නට හේතුවක් වීම ඉස්ලාම් කිසිසේත් අනුමත නොකරයි.

- වරක් නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන්ගේ බිරිය වන ආයිෂා රලියල්ලාහු අන්හා තුමිය, "නබි තුමනි! මට අසල් වාසීන් දෙදෙනෙක් සිටිති. මේ දෙදෙනා අතර මම ත්‍යාග දිය යුත්තේ කාහටද?" යැයි විමසුවාය. එයට නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන්, "ඔබේ දොරට ආසන්නව දොර තිබෙන නිවසට" යැයි පිළිතුරු දුන්හ. අබු දාවූද් සහ අල් බුහාරි වාර්තා කළහ.
- "ඉඩකඩ සහිත නිවස, යහපත් අසල් වාසින් සහ ප්‍රවාහන පහසුකම් යනාදිය කෙනෙකුගේ සතුටට හේතු වන කරුණු කිහිපයක් වේ." යැයි නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් පැවසූ බව නාෆි ඉබ්න් අබ්දුල් හාරිත් රලියල්ලාහු අන්හු දන්වා අල් බුහාරි, අහ්මද් සහ අල් හාකිම් වාර්ථා කළහ.
- යහපත් අසල් වාසීන් සිටින පළාතක ජීවත්වීම වැදගත් බව කවුරුත් දනිති. අලුත් නිවසක පදිංචියට යන්නට පෙර අසල් වැසියන් ගැන කවුරුත් සොයා බලන්නේ එනිසාය. තමාට

නොගැළපෙන අයහපත් අසල් වාසීන් අතර ජීවත් වන්නට සිදු වූ කෙනෙකුගේ ජීවිතය අසහනයෙන් පිරෙන බව නිසැකයි.

- "දෙවියනි, මම වාසය කරන තැන අයහපත් අසල් වාසීන්ගෙන් (සිදුවන උවදුරින්) ආරක්ෂා පතමි." යැයි නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ අල්ලාහ්ගෙන් යාච්ඤා කළ බව අබූ හුරෙයිරා රලියල්ලාහු අන්හු පවසයි.
- කෙනෙකුගේ ජීවිතයේ සාමය පවතින්නට අසල් වාසීන්ගේ හැසිරීම බොහෝ දුරට බලපාන බව නිසැකයි. අයහපත් අසල් වාසීන්ගෙන් අපි ආරක්ෂා පතනවා මෙන් ඔවුන් ද අපෙන් ආරක්ෂා දෙන ලෙස පතන්නේ නම්, එතැන අයහපත් ලෙස හැසිරෙන්නේ අපි බව අවබෝධ කර ගෙන යහපත් අසල් වැසියෙක් විමට වග බලා ගත යුතුයි.

## 18. මිනිසුන් අතර ශ්‍රේෂ්ඨතම අය

මිනිසුන් අතරින් ශ්‍රේෂ්ඨතම අය කවුදැයි නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන්ගෙන් ප්‍රශ්න කළ විට "දේව භක්තියෙන් උසස් අය අල්ලාහ් ඉදිරියේ ශ්‍රේෂ්ඨ අය වෙති." යැයි එතුමාණන් පිළිතුරු

දුන්හ. “අපි විමසන්නේ ඒ අය ගැන නොවෙයි.“ කියා සෙනඟ කිහ. එවිට, “ඒ අය අතරින් අල්ලාහ්ගේ මිත්‍රයාගේ මුණුබුරා හා නබි වරයෙකු ගේ පුතෙක් හා නබිවරයෙක් වන යූසුෆ් (අලෛ) ශ්‍රේෂ්ඨතම කෙනෙකි.“ යැයි නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් පිළිතුරු දුන්හ. “අපේ ප්‍රශ්නය එතුමා ගැන නොවේ.“ යැයි සෙනඟ කීවෝය. එයට නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ, “අඥාන (ජාහිලියියා) යුගයේ පවා යහපත් ලෙස ජීවත් වී, ඉස්ලාම් ගැන ගැඹුරු අවබෝධයක් සමඟ ඉස්ලාමිය යුගයේ ද යහපත් ලෙස ජීවත් වන්නේ නම් ඔවුහු ශ්‍රේෂ්ඨ අය වෙති.“ යනුවෙන් පිළිතුරු දුන්හ.

- දේව භක්තිය සහිතව එහි අවශ්‍යතාවන් ඉෂ්ට කිරීමෙන් කෙනෙක් අල්ලාහ් ඉදිරියෙහි උසස් විය හැකි බවද, මෙය සිදු කිරීමට කිසිදු බාහිර බලපෑමක් නැති බවද ඉස්ලාම් පවසයි.

  ඉස්ලාමයට පෙර වූ අඥාන (ජාහිලියියා) යුගය මෙන් පැරණි සමාජයන් හී පවා ඉතා යහපත් ලෙස ජීවත් වූ අය සිටියහ. මෙවැනි අය යම් ප්‍රතිපත්තියක් හා පිළිගත් සදාචාරයක් සහිතව ජීවත් වූහ. උසස් ගුණාංගයන් සමඟ ජීවත් වූ මේ පිරිස තම සමාජයේ ගෞරවයට ලක් වූ අතර, ඒවායින් තොර වූ අය අපකීර්තියට පත් වූහ.

- උසස් ගුණාංගයන් සහිතව ජීවත් වූ මෙම පිරිස ඉස්ලාම් ගැන ගැඹුරු අවබෝධයකින් යුතුව ඉස්ලාමිය යුගයේද යහපත් ලෙස ජීවත් වන්නේ නම්, ඔවුන් මිනිසුන් අතරින් ශ්‍රේෂ්ඨ බව නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් පැවසූ බව මෙම පිළිතුරු අපට පැහැදිලි කරයි.
- ප්‍රාණයක් නොමැති බාහිර නැමදුම් සහ සම්ප්‍රදායන් ඉටු කිරීමෙන් අල්ලාහ්ට සමීප විය හැකි බව සිතන අයට මෙම හදීසය යථාර්ථය පහදා දෙයි.
- ජාහිලියියා නම් අඥාන අන්ධකාරයෙන් ඉවත් වූ සහාබා වරුන් ඉස්ලාම් පෙන් වූ අලෝකයේ ගමන් කිරීමට අවශ්‍ය මාර්ගය සෙවූහ. අල්ලාහ් වෙත නොසැලෙන විශ්වාසය තැබූ මේ උතුම් සහාබාවරුන්ට, යහපත් ගුණාංගයන් හී අවශ්‍යතාව රසූල් සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් පහදා දුන්හ.

# 19. සුවයක් නොමැති රෝගයක්

මුහම්මද් සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ හජ් වන්දනාවේ යෙදුණු විට, එතුමා මුල් වරට හමු වීමට බොහෝ අය පැමිණියහ. ඒ අයගේ සියලු ප්‍රශ්න වලට පිළිතුරු දුන් නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා "අල්ලාහ්ගේ බැතිමතුනි! අල්ලාහ් සියලු දේ පහසු කර ඇත. ඒවා ඉටු කිරීමෙන් කිසිදු පාපයක් සිදු නොවේ. හේතුවක් නොමැතිව අනුන් ගැන ඕපා දූප කථා කරන තැනැත්තෙක්, ස්වේච්ඡාවෙන් පාපයට වැටී විනාශය පවරා ගනී." යැයි පැවසූහ.

ඒ සෙනඟ අතරින් කෙනෙක් " නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමණී! අපි අසනීප වූයේ නම් වෙදකම් කර ගත යුතු දැ?" යි විමසූ විට, " ඔව්. අල්ලාහ්ගේ බැතිමතුනි! සුව කිරීමට බෙහෙතක් නොමැති කිසිදු රෝගයක් අල්ලාහ් මවා නැත. එකම එක රෝගයක් හැර." යනුවෙන් පැවසූහ. එම රෝග කුමක් දැයි සෙනඟ විමසූ විට, "මහලු වයස." යනුවෙන් නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් පිළිතුරු දුන්හ. උසාමා ඉබ්න් ෂරීක් රලියල්ලාහු අන්හු දන්වා අල් බුහාරි, අබු දාවූද්, තිර්මිදි සහ ඉබ්න් මාජා වාර්තා කළහ.

➢ සාමාන්‍ය ජනතාව පවා නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන්ට සමීප වී ඕනෑම ප්‍රශ්නයකට පිළිතුරු ලබා ගත් ආකාරය මෙම සිද්ධිය

පෙන්වයි. මෙවැනි අවස්ථාවන් හී මිනිසුන් නොනැඟ නමුත් වැදගත් කරුණු කෙරෙහි ඔවුන්ගේ අවධානය නබි සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් තුමාණන් යොමු කළහ. ඒ සමඟ හේතුවක් නොමැතිව කෙනෙකුට විරුද්ධව ඕපාදූප කථා කිරීමේ බරපතළ පාප ක්‍රියාව ගැනද ඒ අයට පහදා දුන් ආකාරය දෙස බලන්න.

- සාමාන්‍ය යෙන් මිනිසුන් එකතු වී කථා කරන විට නොදැනු වත්වම සිදු කරන පාපය ඕපාදූප කථා කිරීමයි. මෙම පාපයට කවුරුත් පහසුවෙන් ලක් වෙති. කෙනෙක් නැති තැනක ඔහු ගැන යමක් පවසා විහිළු කිරීමට සමහරු යෙදෙයි. මෙම අවස්ථාවන් හී අනිත් අයද සිනහ වෙන්නටත්, එයට විස්තර එකතු කරන්නටත්, කථාව රසවත් කරනු පිණිස බොරු පවා ගොතා කියන්නටත් යෙදෙන අවස්ථාවන්ද ඇත. කෙනෙක් ගැන බොරු ගොතා, මුසාවාද කීම වැනි දෙයක් සිදු වන විට මෙම පාපය කරන තැනැත්තා තමා දුෂ්කර තත්ත්වය කරා ඇදී යන බව මතකයේ තබා ගත යුතුයි.

- *“විශ්වාසවන්තයිනි! ඕපාදූප කථා කිරීමෙන් වළකිනු. ඔබේ මිය ගිය සොයුරාගේ මළ සිරුරෙහි මස් කන්නට ඔබ කැමති වේද?“* යන අල් කුර්ආන් හි 49:12 වාක්‍ය මගින් තම මළ සොයුරෙකුගේ මස් අනුභව කිරීම හා සමාන කර පෙන්වීමෙන් මෙම ක්‍රියාව කෙතරම් විශාල පාපයක් දැයි දැන ගත හැක.
- රෝගයක් හට ගත් කෙනෙක් දුර්වල වීම ස්වභාවිකයි. මහලු වයසට පත් වන කෙනෙක් ක්‍රමයෙන් දුබල වීම පමණක් නොව අවසානයේ මරණයටද පත් වෙයි. ඒ නිසා, මහලු වයස අසනීපයක් හා සමාන කිරීමෙන් මිනිසාට මරණය ගැන මතක් කර, සෑම කෙනෙක්ම මරණයට පෙර, අල්ලාහ්ගේ සමාව අයැදිමින් ඔහුගේ ආශීර්වාදය ලබා ගත යුතු යැයි නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් මතක් කර දුන්හ.
- මිනිසාට ලැබුණු උසස්තම දායාදය ‘යහපත් හැසිරීම‘ බව පෙන්වා දීමට විශේෂ හේතුවක් ඇත. කෙනෙකුගේ ජීවිතයේ සෑම මොහොතකම විශේෂයෙන් අන් අය සමඟ ආශ්‍රය කරන අවස්ථාවන් හී යහපත් ලෙස හැසිරීම ඉතා වැදගත්

කරුණකි. සෙසු අය සමඟ ගෞරවයෙන් ආශ්‍රය කිරීම දේව විශ්වාසයේ අංගයක් බව නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් වරක් පැවසූහ. එනිසා ‘යහපත් හැසිරීම වර්ධනය කර ගන්නට අපට අල්ලාහ්ගේ උපකාරය ලැබේවා.‘ යැයි ප්‍රාර්ථනා කරමු.

## 20. උසස්තම ත්‍යාගය ගෙන දෙන ආදරය

නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන්ට ආදරය කිරීම උසස්තම ශිලය බව මුස්ලිම් සමාජයෙහි සියලු දෙනාම පවසති. නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාට ආදරය නොදක්වන කෙනෙක් සැබෑ මුස්ලිරයෙක් නොවන බව කවුරුත් අපට කියයි. අල්ලාහ්ගෙන් රැගෙන ආ ඉස්ලාම් දහම අපට ඉගෙන් වූ එතුමාට අවංක ආදරය දැක්වීම තුළින් මරණයෙන් පසු ස්වර්ගය ලබන මාර්ගය තිබෙන බවද මේ අය අපට කියති. සාමාන්‍ය කථාවන් හී සහ උත්සව පවත්වා නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන්ගේ ගුණ වර්ණනා කියමින්, අනිත් අයට මෙහි වැදගත්කම පහදා දෙන්නට යෙදෙන මෙම අයගේ කථා හා අදහස් අවංක බවට කිසිදු සැකයක් නැත. මේ අයගෙන් නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන්ට ආදරය දැක්වීම ගැන මෙතරම්

කථා කරන්නේ ඇයි දැයි ප්‍රශ්න කළහොත්, ස්වර්ගයට යෑමට කෙටි මාර්ගය එය බව මේ අය පිළිතුරු දෙති. මෙයට අදාළ පහත සඳහන් හදීස් වදනද ඔවුන් සඳහන් කරති.

“අබූදර්, ඔබ ආදරය කරන අය සමඟ ඔබ සිටින්නේය.“ යනුවෙන් නබි සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් තුමාණන් පැවසූ බව අබූදර් අල් ගිෆ්ෆාරි රළියල්ලාහු අන්හු දන්වා අල් බුහාරි, අහ්මද් සහ වෙනත් අය වාර්තා කළ මේ හදීසය අනුව නබි සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් තුමාණන්ට ආදරය දැක් වුව හොත් එතුමා සමඟ අපටත් ස්වර්ගයට පිවිසිය හැක.

එසේ නම්, ස්වර්ගයට ඇතුල් වීමට ආගමික නීති රීති හරියාකාරව අනුගමනය කරන ලෙසද, වැඩිවැඩියෙන් කුසල් ක්‍රියා කරන ලෙසද, කවුරුත් අපට නිතර මතක් කරන්නේ ඇයි? මෙයට පිළිතුරු සොයන්නට මෙම හදිස් හී සම්පූර්ණ විස්තර දෙස සලකා බැලිය යුතුයි.

අබූ දර් අල් ගිෆ්ෆාරි රළියල්ලාහු අන්හු මුස්ලිම් බවට පත් වූ මොහොත පටන් ඉස්ලාමයේ සේවය සඳහා විශාල පරිත්‍යාග කළ කෙනෙකි. මදීනා නුවර සිට කිළෝ මීටර් දහසක් පමණ දුර පිහිටි අරාබි දේශයේ තබූක් නම් පලාතට ඇතුළු වූ සතුරු සේනාවට එරෙහිව සටනට යෑමට මුස්ලිම් වරුන්ට

වරක් සිදු වුණි. ගිනියම් අව්ව නිසා ප්‍රවාහන පහසුකම් නොමැති අයට එම ගමනට සහභාගි වීමට කිසිදු මාර්ගයක් නොතිබුණි. අබූ දර් රලියල්ලාහු අන්හු තුමාට සිටියේ ඉතා දුබල ඔටුවෙකු නිසා, ඉතිරි සේනාව සමඟ වේගයෙන් ගමන් කිරීමට ඔහු අපොහොසත් විය.

තම දුබල ඔටුවා මත ගමනේ යෑමට නොහැකි බව දැන ගත් විගස තම බඩු බාහිරාදිය හිස මත තබා ගෙන කාන්තාරයේ වේගයෙන් පයින් ඇවිද ගෙන ගොස්, සේනාව නැවති විවේක ගන්නා ස්ථානයට ඔහු පැමිණියේය. ඔහු මෙසේ කිරීමට එකම හේතුව ඉස්ලාමිය සමාජය ස්ථිර අත්තිවාරමක් මත ගොඩ නඟන්නට සෑම වෙහෙසක්ම දරන නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් හා සමීපයෙන් සිටින්නට තිබුණු ආශාව පමණි. එහෙත් තම වෑයම ප්‍රමාණවත් නොවන බවද, තමාට වඩා අනෙක් අය යහ ක්‍රියාවන්හී බොහෝ ඉහළින් සිටින බවද ඔහුට සැකයක් තිබුණු හෙයින් මේ ගැන නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන්ගෙන් විමසුවේය.

අබූ දර් රලියල්ලාහු අන්හු තුමාගේ වාර්තාව අනුව, "අල්ලාහ්ගේ රසූල් සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණනි! අනිත් අයට ආදරය කරන නමුත් ඒ අයගේ යහ ක්‍රියාවන් හා සමානව ක්‍රියා කළ නොහැකි මනිසෙකුගේ තත්ත්වය කුමක් ද?" යැයි ප්‍රශ්න කළෙමි. එවිට "අබූ දර්! ඔබ ආදරය කරන අය සමඟ

ඔබ සිටින්නේය.“ යනුවෙන් නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් පිළිතුරු දන්හ. අල් බුහාරි, අහ්මද් සහ වෙනත් අය වාර්තා තළහ.

- ආදරය වාචිකව පැවසීම පමණක් නොව ක්‍රියාවෙහි ද දැක්විය යුතු යැයි අබු දර් රලියල්ලාහු අන්හු දන්නා බව මුහම්මද් නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් දැන සිටියහ. එමෙන්ම යහ ක්‍රියාවන් ඉටු කිරීමට තමාට හැකි සෑම ආකාරයෙන්ම අබු දර් රලියල්ලාහු අන්හු වෙහෙසන බවද දැන සිටි නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ ඔහුගේ සැකය දුරු කිරීමට මෙලෙස පිළිතුරු දුන්හ.

- ඉහත සඳහන් පසුබිම මත මෙම හදිසය අපි වටහා ගත යුතුය. වචන රාශියක් මුවින් පිට කළ පමණින් කෙනෙකුට ආදරය දැක් වූ බව කිව නොහැක. එම ආදරය ක්‍රියාවෙහි යෙදීමෙන් තම වචනයට ප්‍රාණවත් බවක් දිය යුත බව කවුරුත් පිළිගනී.

- ස්වර්ගයේ රසූල් සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් සමඟ සමීපයෙන් සිටිය හැකි එකම මාර්ගය, ඉස්ලාම් අනුමත කළ යහ දේ ඉටු කිරීම සහ තහනම් කළ දෙයින් ඉවත් වීම තුළින්, එතුමාට

ආදරය දැක්වීමෙන් පමණක් බව මෙම හදීසය පෙන්නුම් කරයි.

# මුළු ලොවම පිළි ගත් සදාචාරයන් කිහිපයක්

# 2වන කොටස

ඉමාම් අල් බුහාරිගේ අදබ් අල් මුෆ්රද් ග්‍රන්ථයෙන් තෝරා ගත් මාතෘකා කිහිපයක්

## සිංහල පරිවර්තනය
## ජාසිම් ඉබ්න් දඉයාන්

## විෂය මාලාව - 2

21. ස්වර්ගයට යැමට ඉතාම කෙටි මාර්ගය
22. ශ්‍රේෂ්ඨතම මුස්ලිම් පවුල
23. අනාථ දරුවෙකුගේ වැන්දඹු මව
24. අනාථ දරුවෙකුට තරවටු කිරීම
25. සමාජයේ පවතින වැරදි මත ගැන පහදා දීම
26. අලංකාරවත් ගති පැවතුම්
27. සේවකයන් සමඟ ආහාර ගැනීම
28. උපකාරයට ප්‍රතිඋපකාර කිරීම
29. මිනිසාට සහ අල්ලාහ්ට කෘතඥවීම
30. සලාහ් මෙහෙය වීමට ඉමාම් කෙනෙක් තෝරා ගැනීම
31. අල්ලාහ්ගෙන් ත්‍යාග ලබන විවිධ මාර්ග
32. මෙලොව සහ මතු ජීවිතයේ යහපත් අය
33. සොහොයුරෙකුගෙන් අයුතු ප්‍රයෝජන ලබන්නා
34. අයිතිකරුගේ අනුමැතිය නොමැතිව යමක් ගැනීම
35. සමාජයේ සාමය පැතිරීම
36. යහ ක්‍රියාවක් සඳහා මග පෙන්වීමේ අගය

37. අල්ලාහ් වෙත මුළුමනින් රැඳී සිටීම

38. සතුරාට සමාව දීම

39. උපදේශකවරුන් දෙපිරිසක්

40. උතුම් ආත්මයක අවසාන වදන්

# 21. ස්වර්ගයට යැමට ඉතාම කෙටි මාර්ගය

“වැන්දඹු ස්ත්‍රියක් සහ දුගී අය රැක බලා ගන්නා කෙනෙක් අල්ලාහ්ගේ මාර්ගයේ ජිහාද් කරන්නෙක් හෝ නෆිල් සලාතයෙහි යෙදීම, දහවල් කාලයේ උපවාසයේ යෙදීම සහ රාත්‍රි කාලයේ නැගිට සලාහ් කිරීම වැනි කුසල් ක්‍රියාවන් හී නිතර යෙදෙන කෙනෙක් හා සමාන වේ.“ යනුවෙන් නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ පැවසූ බව අබූ හුරෙයිරා රලියල්ලාහු අන්හු දන්වා අල් බුහාරි, මුස්ලිම් සහ අනිත් විද්වතුන් වාර්තා කළහ.

- මුළු සමාජයම සෑම පුද්ගලයෙකු ගැනද, සෑම පුද්ගලයෙකුම තම සමාජය ගැනද සැලකිලි දක්වන, එක්සත් සමාජයක් ගොඩ නඟන්නට ඉස්ලාම් මඟ පෙන්වන බව අපි කවුරුත් කියන කථාවකි. මෙය ඉතා අලංකාරවත් වාක්‍යයක් වන අතර, මෙය ක්‍රියා කරන්නේ කෙසේ දැයි සලකා බැලිය යුතුයි.

- ශරීර ශක්තිය සහිතව, නිෂ්පාදනයට දායක වන තරුණ පිරිසට සමාජය සැලකිල්ලක් දැක්වීමට හේතුවක් ඇත. මෙම පිරිස තම අවශ්‍යතාවන් තමන්ම නිපදවා ගන්නා අතර තම අයිතිවයාසිකම්

ලබා ගනු පිණිස සටන් කිරීමටද සූදානම් ව සිටිති. මේ කොටසට හිමි අයිතිවාසිකම් ලබා දීමෙන් සමාජයේ නිෂ්පාදනයේ වැඩිවීම් ද පිරිවැය අඩුවීම් ද සිදු කළ හැකි බව සමාජයේ කවුරුත් දනී.

- එහෙත් සමාජයේ සිටින දුබල අයට සලකන්නේ කවරෙක්ද? උදාහරණයකට මෙම සමාජයේ අනාථ වූ දුප්පත් දරුවෙක්, රැකවරණ දෙන්නට කිසිවෙක් නොමැති වැන්දඹු කාන්තාවක් වැනි අයගේ තත්ත්වය කුමක් ද? මෙම පිරිසගේ අයිතිවාසිකම් ලබා දෙන්නට ඉදිරිපත් වන්නේ කවුරෙක්ද?
- බොහෝ රටවල වැඩිහිටි නිවෙස් ද අනාථ දරුවන් සඳහා ළමා නිවෙස්ද ස්ථාපිත කර ඇති අතර, කැමති පවුලකට මෙවැනි අනාත දරුවන් තම නිවෙස් හී හදා වඩා ගන්නට නීති මාර්ග සලසා මුදල්ද වැය කරති. මුදලින් සහ නීති මාර්ගයෙන් ඇතැම් අවශ්‍යතාවන් පමණක් සපයන්නට හැකි වන නමුත්, කෙනෙකුගේ මානසික අවශ්‍යතාවන් සියල්ල ඉටු කළ හැකි බව කිසිවෙක් නොපවසයි.
- සමාජ සේවය නිසි ලෙස ඉටු කිරීමටත්, සමාජයේ දුබල පාර්ශවයේ මානසික අවශ්‍යතාවන්ට සහන

සලසන්නටත් කරුණාව සහ මෛත්‍රියට ප්‍රධාන තැන දෙන මිනිසුන් අවශ්‍ය බව නිසැකය. තමා ඉටු කරන්නේ අල්ලාහ් උසස් ලෙස සලකන සේවයක් යන දැනුම සහිතව මෙම පිරිස තම සේවයේ නිරත වන විට ඒ අය ලබන සතුට ඉමහත්ය. මෙම හැඟීමට මිලයක් නියම කළ නොහැක.

- අසරණ හා දුබල ජනතාවට සහන සලසන්නට සෑම සමාජයකම බලපෑමක් තිබෙන අතර, ඉස්ලාම් හී තවත් වැදගත් කරුණක් ඇත. එය තමයි ඉහත සඳහන් කළ නබි වදන පෙන් වන කරුණු. මෙහිදී මුහම්මද් (සජ්) තුමාණන් උදාහරණ දෙකක් පෙන්වා දී ඇත. ජිහාද් නම් ශුද්ධ වූ සටනක පා තබන කෙනෙක් අල්ලාහ්ගේ මාර්ගයේ තම ජීවිතය පුද කරන්නට සූදානම් බව ප්‍රකාශ කරයි. මෙම ගමනේ දී ඔහු මරණයට පත් වුවහොත් ඔහුට ස්වර්ගය ලැබෙන බව නිසැකයි. එමෙන්ම අනිවාර්‍ය නැමදුම් සහ උපවාසයට අමතරව නෆිල් සලාවන්හී යෙදීම, දහවල් කාලයේ අතිරේක උපවාසයේ නිරත වීම, සහ රාත්‍රී කාලයේ නැගිට සලාහ් කිරීම යන ආගමික වතාවත් හී නිතර යෙදෙන කෙනෙකුටද,

අල්ලාහ්ගෙන් උසස්තම ත්‍යාගය වන ස්වර්ගය ලැබෙන බව මෙම හදිස් මගින් නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් පෙන්වා දි ඇත.

- තම අතේ ඇති මුදල් යොදා ලෞකික දේ ලබා ගනු පිණිස කවුරුත් තරඟ කරන මේ යුගයේ, මෙම හදීස් වදන කෙතරම් වැදගත් ද? සමාජයේ අසරණ හා දුබල අයට මෛත්‍රිය දැක්වීමෙන් එම පිරිස සඳහා තම මුදල් වැය කිරිමෙන් මෙලොවෙහි ආර්ථික ලාභයක් නොලැබෙන නමුත් අල්ලාහ් වෙත තම මුදල තැන්පත් කිරීමෙන් අල්ලාහ්ගෙන් ඔහුට මිල කළ නොහැකි අගනා තිළිණ ලැබෙන බවට නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් ශුභ ආරංචියක් දැන් වූහ.
- මිනිසාට සේවය කිරීමෙන් අල්ලාහ්ට සේවය කළ හැකි බවද ඒ තුළින් අල්ලාහ්ගේ ආදරය සහ කරුණාව ලබා ගන්නට පහසු මාර්ගයක් තිබෙන බවද මෙම හදිසය පෙන්වයි.
- සමාජයේ සිටින මෙම අසරණ කොටසට පිළිසරණ වීමෙන් ස්වර්ගයට මාර්ගය විවෘත වන බවද නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් පෙන්වූහ.

# 22. ශ්‍රේෂ්ඨතම මුස්ලිම් පවුල

"මම සහ අනාථ දරුවෙකුගේ භාරකරු, ස්වර්ගයේ මෙලෙස සිටින්නෙමු." යැයි පැවසූ මුහම්මද් සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් තුමාණන් දබරැඟිල්ල සහ මැද ඇඟිල්ල ළං කර පෙන් වූ බව අල් බුහාරි සහ අනිත් හදීස් විද්වතුන් වාර්තා කළහ. අනාථ දරුවෙකුගේ භාරකරු අල්ලාහ් ගෙන් ලබන උසස් තම ත්‍යාගය ගැන මෙම හදීසය පවසයි.

මෙම හදීසය පැහැදිලි කරන තවත් නබි වදනක් ඇත. "මුස්ලිම් සමාජයේ ශ්‍රේෂ්ඨතම නිවස අනාථ වූ කෙනෙකුට කරුණාව දක්වන අය සිටින නිවස වේ. එමෙන්ම මුස්ලිම් සමාජයේ ඉතා පහත් නිවස අනාථ වූ කෙනෙකුට හිංසා කරන අය සිටින නිවස වේ. අනාථ දරුවෙකුගේ භාරකරු සහ මම, ස්වර්ගයේ මෙලෙස නිටින්නෙමු" යැයි පැවසූ නබි සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් තුමාණන් ඇඟිලි දෙක ළං කර පෙන් වූ බව අබූ හුරෙයිරා (රලි) ගෙන් අල් බුහාරි, මුස්ලිම් සහ ඉබ්නු මාජා යන හදිස් විද්වතුන් වාර්තා කළහ.

- මෙයට පෙර සඳහන් කළ හදීස් වදන් හී ඇතැම් කරුණු වැදගත් යැයි ඉස්ලාම් සලකන බවත්, දුබල හා අසරණ ජනතාවට සැලකිලි දක්වනු පිණිස අවශ්‍ය නීති රීති සකන් කර ඇති බවත් මේ පිරිසට කරන සේවය පිළිබඳවත් පෙන්නුම් කරන ලදී.

- නිති රීති තැනීමෙන් පමණක් සියලු දෙනාම තම යුතුකම හරියාකාරව ඉෂ්ට කරන බව කිසිවිටක නොසිතන්න. අනාථ දරුවෙක් තම අයිතිවාසිකම් කුමක් ද යන්න පවා නොදනී. ඒවා දැන සිටියත්, ඒ ගැන ඉල්ලීමක් කිරීමට ඇතැම් විට ඔහුට නොහැක. ඔහුගේ අසරණ තත්ත්වය ගැන නිතර මතක් කරන භාරකරුවෙකුගෙන් තම හිමිකම් ඉල්ලන්නේ කෙසේද? උදාහරණයක් වශයෙන් පියාගේ මරණය සිදු වූයේ දරුවාගේ අවාසනාව යැයි දොස් පවරන ඇතැම් අකාරුණික අය, මේ අසරණ දරුවාගේ ඉදිරියේද ඒ බව ප්‍රකාශ කරති. එ නිසා අනාථ දරුවෙකුට කෑම් බීම්, ඇඳුම් පැලඳුම්, නවාතැන් යනාදිය සැපයීමට අමතරව භාරකරුවෙක් එම දරුවාට ආදරය හා මෛත්‍රිය දැක්විමද අවශ්‍ය බව පැහැදිලි වේ.

- අනාථ දරුවකු රැකබලා ගැනීමේ අතිරේක වියදම් හා වගකිම සතුටින් භාර ගන්නා අයට අල්ලාහ්ගෙන් ලැබෙන බවට පොරොන්දු වන ත්‍යාගය කෙනෙක් භාර ගත් වගකීම නිසි ලෙස ඉටු කරන්නට තවත් දිරි ගන්වයි. අනාථ දරුවෙක් රැකබලා ගැනීමේ දී විවිධ කරුණු ගැන සැලකිය යුතුයි. අනාථ දරුවෙක් බලා ගැනීම සඳහා

අතිරේක වියදම් දරන කෙනෙක්, එම වියදම දරන්නේ තම දරුවෙකු සඳහා නොවන බවද, එම දරුවාගෙන් ඒ වෙනුවෙන් අනාගතයේ කිසිවක් බලා පොරොත්තු විය නොහැකි බවද දනී. මෙහි දී අමතර වියදමක් දැරීම පමණක් නොව අසීරු වගකීමක්ද භාරකාරයා විසින් ඉටු කරනු ලබයි.

- වැදගත් යැයි ඉස්ලාම් සලකන කරුණක් ගැන තම අනුගාමික යන්ට පොළඹවන්නට අවශ්‍ය වන විට, එය ඉටු කිරීමෙන් අල්ලාහ්ගෙන් ලබා ගත හැකි ඉමහත් ත්‍යාග ගැන මුහම්මද් සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් තුමාණන් මතක් කළහ. මුහ්ම්මද් සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් තුමාණන් ඉතාමත් කරුණාවන්ත කෙනෙකි. සමාජයේ දුබල ජනතාව කෙරෙහි මෛත්‍රිය දැක් වූ එතුමාණන්, ඒ අය සමාජයේ නිසි සැලකිලි ලබන බවට වග බලා ගත්හ. අනාථ දරුවන්හට මුස්ලිම් සමාජයේ සෑම සැලකිල්ලක්ම ලබා දිමටද, මෙවැනි යහපත් ක්‍රියාවන් සඳහා මිනිසුන් ඉදිරිපත් කර වීමටද එතුමා දිරි ගෙන්වුහ.
- මරණයෙන් පසු ජීවිතයේ ලැබෙන ත්‍යාගය මුස්ලිම් වරයෙකුට බොහෝ වැදගත් සහ සැබෑ

දෙයක් වන අතර, ඒ සඳහා වෑයම් කිරීම උතුම් ක්‍රියාවකි. “අනාථ දරුවෙකු බලා ගන්නෙකුට ලැබෙන ත්‍යාග කුමක් ද?‘ යන ප්‍රශ්නය මෙහිදී අදාළ වේ.

- අල්ලාහ්ගේ නිවේදනය ලොවට ගෙන දෙන්නට තෝරා ගනු ලැබූ අවසාන නබි මුහම්මද් සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් තුමාණන්, එම රාජකාරිය ඉටු කිරීම සඳහා මහත් වෙහෙස දරා විශාල පරිත්‍යාග කළහ. ගුරුවරුන් අතරින් ප්‍රධාන තැන ගන්නා එතුමාණන් ස්වර්ගයේ උසස්තම ස්ථානයක් ගනී. අතේ ඇඟිලි එකිනෙකට ළඟින් පිහිටුවා තිබෙන්නා සේ අනාථ දරුවෙකුගේ භාරකරු ස්වර්ගයේ තම ළඟින් සිටින බව පැවසීමෙන් එම ක්‍රියාව අල්ලාහ් අගය කොට සලකන බව පහදා දුන්හ. මෙවැනි ත්‍යාග ලබා ගන්නට සෑම මුස්ලිම් වරයෙකුම ඉදිරිපත් වන බව නිසැකයි.

- අල්ලාහ්ගේ සමාව ලැබ ස්වර්ගයට පිවිසීමට මුස්ලිම්වරු තම ජීවිත කාලය මුළුල්ලේ වෙහෙසෙති. මෙහිදී අල්ලාහ්ගේ සමාව පමණක් නොව ස්වර්ගයේ උසස්තම ස්ථානයක්ද ස්ථිරව

ලබා ගැනීමේ පහසු මාර්ගයක් තිබෙන බව නබි සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් තුමාණන් පෙන්වා දුන්හ.

- ඇතැම් නිවෙස් වල පවුලේ ප්‍රධානියා වන පියා, අනාථ බවට පත් වූ ඥාතියෙක් නිවසට එකතු කර ගත් විට එය අමතර බරක් ලෙස සලකන ඔහුගේ බිරිය මෙයට විරුද්ධ වන අවස්ථාවන්ද ඇත. නිවසේ සිටින දරුවන්ද පියාගේ ආදරය සම්පූර්ණයෙන් තමා වෙතට පමණක් යොමු වීමට මෙම අමුත්තා බාධාවක් වන බව සිතිය හැක. නිවසේ අනෙකුත් සාමාජිකයන්ගේ වෙනස් කමට ලක් වන අනාථ දරුවාගේ සිත සනසනු පිණිස පියා සුළු වශයෙන් හෝ වෑයම් කළහොත්, එය ඔහුගේ දරුවන්ගේ ඊර්ෂ්‍යාව තවත් වැඩි කළ හැක. මෙහිදී මවගේ මතය කුමක් දැයි දරුවන් දැන ගත්තේ නම්, එම අනාථ දරුවාට ඔවුන් අකාරුණික ලෙස හිරිහැර කරන්නටද ඉඩ ඇත.

- මෙවැනි සියලු අතවරයන්ගෙන් අනාථ දරුවන් රැකගනු පිණිස, මෙම අසරණ අයට කරුණාව හා මෛත්‍රිය දක්වන නිවසේ සාමාජිකයන්ට ස්වර්ගයේ උසස්තම ස්ථානයක් හිමි වන බවද, ඒ

නිවස මුස්ලිම් සමාජයේ ශ්‍රේෂ්ටතම නිවසක් බවද නබි සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම් තුමාණන් පෙන්වා දුන්හ.

## 23 අනාථ දරුවෙකුගේ වැන්දඹු මව

"තම ස්වාමි පුරුෂයාගේ මරනයෙන් පසු විශාල කරදරවලට මුහුණ දී තම දරුවන් හදා වඩා ගන්නා දුප්පත් වැන්දඹු ස්ත්‍රීය සහ මම ස්වර්ගයේ මෙලෙස සිටින්නෙමු." යැයි පැවසූ නබි සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම් තුමාණන් තම ඇඟිලි ළං කර පෙන් වූ බව අල් බුහාරි වාර්තා කරයි.

පියාගේ මරණය හේතුවෙන් අනාථ වූ දරුවෙකුට තවත් කරදර රාශියකට මුහුණ දෙන්නට සිදු වන අවස්ථාවන්ද ඇත. තරුණ වයස හා හැඩරුව සහිත ඔහුගේ වැන්දඹු මව, පවුලේ නඩත්තුව, ආරක්ෂාව හෝ වෙනත් අවශ්‍යතාවන් මත තව පිරිමියෙකු සමඟ විවාහ වීම එක් කරදරයකි. මෙය සිදු වූ විට අමතර වගකීම් කිහිපයක් ඇය මත පටවනු ලබයි. ඇගේ නව සැමියා, ඇගේ දරුවාගේ අවශ්‍යතාවන් සපයන නමුත්, තමාට සේවය කිරීම ඇගේ ප්‍රධාන රාජකාරිය විය යුතු යැයි සැමියා සිතයි. දෙවන විවාහයෙන්ද ඇයට දරුවන් ලැබුණේ නම්, තමාට දාව ඉපදුනු දරුවන්ට සේවය කිරීම තමාගෙන් යැපෙන ඇගේ හා ඇගේ දරුවාගේ පුධාන රාජකාරිය විය යුතු යැයි ඇගේ නව සැමියා නිතර බලාපොරොත්තු වෙයි. මෙවැනි දේ අපි

සාමාන්‍ය යෙන් දකින අතර, මෙහිදී ඇගේ අනාථ දරුවා බලවත් මානසික පීඩනයට පත්වන බව නැසිකයි.

වැන්දඹු වූ මේ මව විවාහ නොකළේ නම්, ඇගේ අනාථ දරුවාට මෙවැනි ප්‍රශ්නයක් මතු වීමට අවස්ථාවක් නැත.

පිරිමියෙකුගෙන් වෙන් වීමෙන් පසුව තම අවශ්‍යතාවන් ගැන පමණක් සලකා දරුවන් අතරමං කරන බටහිර කාන්තාවන් ගැනද බලා ගන්නට හෝ ආදරය දක්වන්නට කිසිවෙක් නොමැතිව, සමාජයේ දූෂණයන්ට භාජන වීමෙන් අනතුරුව, මහා අපරාධයන්ට සහභාගි වී, අවසානයේ සමාජයට විශාල තර්ජනයක් බවට පත් වී සිටින, අතරමං වූ දරුවන් ගැනද ඒ රටවල විවිධ වාර්තාවන් සඳහන් කරයි. මෙවැනි තත්ත්වය අපේ රටේ ද මෑතකදී සිදුවීම මහත් අවාසනාවකි.

- වින්දඹු වු මවක් නැවත විවාහ වීම සුදුසු නැති යැයි මෙම හදීසය කිසිසේත්ම නොපවසයි.

- ඒ වෙනුවට තම දරුවන්ගේ යහපත වෙනුවෙන් වැන්දඹු ස්ත්‍රියක් සිය කැමැත්තෙන් පියවරක් ගන්නා විට, අල්ලාහ්ගෙන් විශේෂ ත්‍යාග ලබන බව මෙම හදීසය පහදා දෙයි.

- මව හා සමානව අන් කිසිවෙක් දරුවෙකුට ආදරය නොදක්වන බව කවුරුත් දනී. පියාගේ ආදරය අහිමි වූ තම දරුවන් වෙනුවෙන් තම ජීවිතය කැප කරන්නටත් ඒ සඳහා ඕනෑම පරිත්‍යාගයක් කරන්නටත් දුප්පත් තරුණ ස්ත්‍රියක් ඉදිරිපත් වන්නේ නම්, එය ඉටු කිරීමට දැඩි ආත්ම ශක්තියත් සහ නිර්භිතකමත් අවශ්‍ය බව නිසැකයි.

- මෙම ආත්ම පරිත්‍යාගයේ ප්‍රතිඵලය අල්ලාහ් ගෙන් ලැබෙන ස්වර්ගය බව මෙම හදීසය පැහැදිලි කරයි.

## 24. අනාථ දරුවෙකුට තරවටු කිරීම

සෑම දරුවෙකුම යහ ගුණායන් හා යහපත් හැසිරීම් ඉගෙන ගත යුතුයි. අනාථ වූ දරුවෙකුටද මෙම අවශ්‍යතාව ඉවත දැමිය නොහැක. දඬුවම් නොලැබෙ කෙතරම් දුරට සීමාව ඉක්මවන්නට හැකිදැයි ඇතැම් දරුවන් පරීක්ෂා කර බලති. වැරදි ක්‍රියාවකට නියමිත දඬුවම නොලැබූ දරුවෙක් එම වරද නැවත කරන්නට පෙළඹෙන අතර, කාලයකින් පසු එම දරුවා අයහපත් කෙනෙකු බවට පත් වී තමා ජීවත්වන සමාජටද තර්ජනයක් බවට පත් විය හැක. මෙය මහත් අසතුටුදායක කරුණකි. අනාථ දරුවෙකුට අමතර ආදරය දැක්විය යුතු නමුත් වරදක් කළ විට එම වරද

පෙන්වා දී එය නිවැරදි කිරීම සඳහා අවවාද හෝ සුදුසු දඬුවම නොලැබූ එම දරුවාගේ අනාගත ජීවිතය විනාශ වූයේ නම්, ඔහුගේ භාරකරු තම වගකීම හරියාකාරව ඉටු නොකළ බවට කවුරුත් දොස් පවසන බව නිසැකයි. එසේ නම් තමා භාරව සිටින අනාථ දරුවෙකුගේ වරදට මව දඬුවම් කළ හැකිද?

කෙනෙක් මුහම්මද් සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම් තුමාණන් වෙත පැමිණ, ''නබි තුමාණනි! මම හදා වඩා ගන්නා අනාථ දරුවෙකුට දඬුවම් කරන්නට මට හැකිද?'' යැයි විමසුවේය. එයට නබි සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම් තුමාණන්, ''ඔබට දාව උපන් දරුවෙකුට දඬුවම් ලැබිය යුතු වරදක් ඔහුද (අනාථ දරුවා) කළා නම් පමණි.'' යැයි ඔහුට පිළිතුරු දුන් බව ආයිෂා (රලි) අන්හා තුමිය දන්වා අල් බයිහකි වාර්තා කරයි.

තමා භාරව සිටින අනාථ දරුවෙකුට දඬුවම් දෙන භාරකරු තමා ඒ දරුවාට ඇත්ත වශයෙන් ආදරය කරනවාද, දරුවා හදා වඩා ගත්තේ ඔහුට යහපතක් කිරීමේ අපේක්ෂාවෙන්ද යන්න ප්‍රශ්න කළ යුතු බව ආගමික විද්වතුන් කියති. මෙම ප්‍රශ්නයට ''ඔව්'' යනුවෙන් අවංකව කෙනෙකුට පිළිතුර දිය හැකි නම් අවශ්‍ය අවස්ථාවන් හී එම දරුවාට දඬුවම් දිය හැකි බවද මෙම විද්වතුන් පවසති.

# 25. සමාජයේ පවතින වැරදි මත ගැන පහදා දීම

"ශක්තිමත් කෙනෙක් ලෙස ඔබ සලකන පුද්ගලයා කවුද?" යැයි නබි සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම් තුමාණන් වරක් ප්‍රශ්න කළහ. "තව කෙනෙකුට ජරාජය නොවූ කෙනෙක්." යැයි සහාබාවරු පිළිතුරු දුන්නෝය. එවිට එතුමාණන්, "නැත. තම කෝපය මැඩපවත්වා ගත හැකි පුද්ගලයා අති ශක්තිමත් කෙනෙක් වේයැ" යි පැහැදිලි කළහ. අබ්දුල්ලාහ් ඉබ්න් මස්ඌද් (රලි) දන්වා අල් බුහාරි සහ අබූ දාවුද් වාර්තා කළහ.

- අල්ලාහ්ගේ නිවේදනය සමඟ පැමිණි අවසාන රසූල් වරයා වශයෙන් දේව නියෝග සියල්ල මිනිසාට පැහැදිලි කිරීම මුහම්මද් සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම් තුමාණන් වෙත පැවරුණි. මෙම වගකීම විවිධ මාර්ගයෙන් එතුමාණන් ඉටු කළහ. ඇතැම් අවස්ථාවන් හී යම් කරුණක් ගැන සහාබා වරුන්ගෙන් ප්‍රශ්න කළහ. ඒ අය එවකට සමාජයේ පවතින මතය හෝ එම මතය පදනම් කොට පිළිතුරු දෙති. එවිට නිවුරදි පිළිතුරු සපයා සමාජයේ වැරදි මතය පැහැදිලි කරන්නට හෝ අලුත් තේරුමක් දෙන්නට නබි සල්ලල්ලාහු

අලෙයිහි වසල්ලම් තුමාණන් එම අවස්ථාව ප්‍රයෝජනට ගනී.

- සෑම සමාජයක්ම සෑම විටම මිනිසාගේ ශාරීරික ශක්තිය සමඟ ඔහුගේ බලය සම්බන්ධ කරයි.මළල ක්‍රීඩා වැන විවිධ තරඟ පවත්වා මෙවැනි පුද්ගලයින් තොරා ගනී. මෙවැනි අය නොව සැබැවින්ම ශක්තිමත් පුද්ගලයා කවුදැයි මෙම අවස්ථාවේ දී නබි සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් තුමාණෝ පෙන්වා දුන්හ.
- කෝපයෙන් අන්ධ වූ කෙනෙක් තමා කියන්නේ හෝ කරන්නේ කුමක් දැයි නොදනී. කෝපය සන්සුන් වූ පසු, තම ක්‍රියාව ගැන පසුතැවිලි වන අවස්ථාවන්ද අප්‍රමාණය.අධික කෝපයට පත් වූ කෙනෙක්, විවාහය දික්කසාද කිරීම, කෙනෙකුට පහර දීම, ඇතැම් අවස්ථාවන් හී මිනි මැරීම වැනි බරපතළ වැරදි ක්‍රියාවන් හී යෙදී සිය ජීවිතය පමණක් නොව තමා ආදරය කරන අයගේ ජීවිතයන්ද විනාශ කරන අවාසනාවන්ත සිද්ධීන් අපි දනිමු.
- සියලු අවස්ථාවන් හී කෝපය මැඩ පවත්වා, පාලනය කිරීම අපහසු ක්‍රියාවකි. සෑම සමාජයකම

සෑම යුගයකදීම ඉතා සුළු පිරිසකට කෝපය පාලනය කරන්නට හැකි වන අතර, මෙම සුළු පිරිස ගැන ලොවට හඳුනා දෙන අදහසින් නබි සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් තුමාණන් මොවුන් "ඉතාමත් ශක්තිමත් අය" වන බව පෙන්වා දුන්හ.

## 26. අලංකාරවත් ගති පැවතුම්

"ආරාධනාවක් ලැබුණු විට එය පිළිගන්න. ත්‍යාගයක් ලැබුණු විට එය ප්‍රතික්ෂේප නොකරන්න. සෙසු මුස්ලිම්වරුන්ට පහර නොදෙන්න." යැයි නබි සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් තුමාණන් පැවසූ බව අබ්දුල්ලාහ් ඉබ්න් මස්ඌද් (රළි) දන්වා ඉමාම් අහ්මද්, අල් බුහාරි සහ ඉබ්න් හිබ්බාන් යන අය වාර්තා කර ඇත.

මෙම කෙටි හදීසය තුළින් නබි සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් තුමාණන් සමාජයට වැදගත් පාඩමක් උගන් වන බව වටහා ගන්නේ කී දෙනෙක්ද?

විවාහයක් වැනි මංගල උත්සවය සඳහා ලැබෙන ආරාධනාව පිළි ගත යුතු බවට සියලු මුස්ලිම් ආගමික විද්වතුන් එකඟ වෙති. එයට හේතු ද පැහැදිලිය. ඉස්ලාමීය සමාජයක සියලු දෙනාම සහෝදරයන් ලෙස සලකණු ලැබේ. සහෝදරයෙකුගේ ජීවිතයේ විශේෂ කරුණක් සඳහා පවත් වන උත්සවයකදී

සහභාගි වන ලෙස ඉස්ලාම් පවසයි. කෙනෙකුට මංගල්‍යයක් සිදුවන වට හෝ දරුවෙක් ලැබුණු විට එය සමාජයේ සියලු දෙනාටම සතුට ගෙන දෙන ශුභ ආරංචියකි.මෙ වැනි අවස්ථාවන් හී උත්සවයක් පවත්වා, ආහාර සපයන ලෙස ඉස්ලාම් නිර්දේශ කරයි. මෙම උත්සවය පැවැත්වීම මනමාලයාට අනිවාර්‍ය වන අතර, එයට ආරාධනාවක් ලැබූ අය, සුදුසු හේතුවක් නොමැතිව සහභාගි නොවී මඟ හැරිය නොයුතුයි. එමෙන්ම කෙනෙකුගේ සමීප නෑයෙකුගේ මරණයක් සිදු වූ විට, සමාජයේ සියලු දෙනාගේ ශෝකයට එය හේතුවක් වේ.

මේවා හැර වෙනත් හේතුන් සඳහා පවත්වන උත්සවයන්ට සහභාගි වීම පිළිබඳව මුස්ලිම් විද්වතුන් අතර සුළු මත භේද තිබුණත් ආරාධනාවක් ලැබුණු විට එය පිළි ගත යුතු යැයි පවසන්නට හේතුන් රාශියක් ඇත. උත්සවය පවත්වන කෙනෙක් සාමාන්‍ය යෙන් ආහාර වැඩි ප්‍රමාණයක් සූදානම් කරයි. ආරාධිත යින් සුළු පිරිසක් පමණක් උත්සවයට සහභාගි වුවහොත් ඔහු දැරූ වියදම් සහ මහන්සිය අපතේ යයි.

උත්සවය පවත්වන අය අපකීර්තියට පත් කිරීමේ අපේක්ෂා වෙන් ඇතැම් සමිප ඥාතින් උත්සවයට සහභාගි නොවන අවස්ථාවන්ද ඇත. තවත් සමහර නෑයින් උත්සවයට සහභාගි වන නමුත් එහිදී අශෝභන ලෙස හැසිරීමෙන් උත්සවය පවත්වන අයව නොයෙකුත් පීඩාවට පත් කරයි.

මෙවැනි ක්‍රියාවන් නිසා මත භේද වැඩිවීමටත්, අමනාපකම් උග්‍ර වීමටත් මඟ පෑදෙයි. මෙවැනි අසමගිතාවන් ඉවත් කිරීමටද, සමාජයේ සියලු දෙනා අතර නෑ සබඳතා වර්ධනය කිරීමටද ඉස්ලාම් පෙන්වන මාර්ගය ඉතා පහසුය. ආරාධනා කරන තැනැත්තා අමනාපය බිඳ දමන්නට මුල් පියවර ගන්නා අතර, එය පිළි ගැනීම එම පියවර තහවුරු කිරීමක් වේ. මෙ මගින් මිත්‍රත්වය යළි ආරම්භ වන්නට සුදුසු වාතාවරණයක් සකස් වෙයි.

ආරාධනාවක් ප්‍රතික්ෂේප කළ හැකි අවස්ථාවන් තිබේද? සුප්‍රසිද්ධ මුස්ලිම් විද්වතෙක් වන ඉමාම් අන් නවවි මෙසේ පවසයි. "ඉස්ලාම් අනුමත නොකළ මාර්ගයෙන් උපුටා ගත් මුදලින් ආහාර සපයන බවට සැකයක් තිබුණේ නම් හෝ ඔහු සමාජයේ ධනවතුන්ට පමණක් ආරාධනා කරන බව දැන සිටියේ නම්, හෝ ආශ්‍රයට නුසුදුසු අය සමඟ ළඟින් ගැවසෙන්නට සිදු වන්නේ නම්, හෝ නීති විරෝධි ක්‍රියාවකට තම සහයෝගය පතන්නට මෙම උත්සවය මගින් ඇතැමුන් බලා පෝරොත්තු වන බව දැනුණේ නම්, ආරාධනාව ප්‍රතික්ෂේප කළ හැක. තවද තහනම් ආහාර පානාදිය හෝ රන් රිදි වලින් සාදන ලද උපකරණ භාවිත වනවා නම්, සිත නොරිදෙන සේ ආරාධනාව ප්‍රතික්ෂේප කළ හැක. මන්ද, මේවා නබි සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම් තුමාණන්ගේ උපදෙස් වලට එරෙහිව කරන ක්‍රියාවන් බව සැලකේ."

මෙම හදිස් හී "ත්‍යාගයක් ලැබුණු විට එය ප්‍රතික්ෂේප නොකරන්න" යන දෙවන කොටස බලවත් නිර්දේශයක් බව විද්වතුන් විශාල පිරිසක් පිළි ගන්නා නමුත් විනිශ්චය කරුවෙකුට ත්‍යාගයක් ලැබුණු විට එය භාර ගැනීම තහනම්ය. සමාජයේ නීතිය සාධාරණව පැවැත්විය යුතු බව ඉස්ලාම් තරයේ පවසයි. මිනිසුන් සාමාන්‍ය යෙන් තමන්ට පක්ෂව තීන්දුවක් ලබා ගන්නා අපේක්ෂාවෙන් හැර වෙන හේතුවකට විනිශ්චය කරුවෙකුට ත්‍යාගයක් නොදෙයි. එම ත්‍යාගය නිසා තමා දෙන තීන්දුව කිසිසේත් වෙනස් නොවන බව විනිශ්චය කරු විශ්වාස කරන නමුත් ඇතැම් විට ඔහු විසින් දෙනු ලබන විනිශ්චයෙන් එක් පක්ෂයට පාඩුවක් සිදු විය හැකි නිසා, තම තනතුරේ ගෞරවය රැකගනු පිණිස විනිශ්චය කරුවෙකුට මෙවැනි ත්‍යාග කිසිවක් භාර ගත නොහැක.

මේ අතර විනිශ්චය කරුවන්ටද සමාජයේ ඥාතීන් සහ හිත මිතුරන් සිටින අතර සාමාන්‍ය ජනයා තම නෑයන් හා හිත මිතුරන්ගෙන් ලබන තෑගි බෝග වැනි දේ භාර ගන්නට මේ අයට අයිතියක් නැද්ද? මෙයට පිළිතුරු නම් විනිශ්චය කරුවන් තමා ජීවත්වන සමාජයෙන් සම්පූර්ණයෙන් ඈත්ව ඉවත් වී ජීවත් විය යුතු බව ඉස්ලාම් නොපවසයි. ඔවුන්ද අන් පුරවැසියන් මෙන් සාමාන්‍ය ජීවිතයෙහි යෙදිය යුතු අතර, තම නෑ හිතවතුන් පිළිබඳ යම් නීතිමය ප්‍රශ්නයක් මතු වූ විට

එම ප්‍රශ්නය හෝ නඩුව වෙනත් කෙනෙකුට පැවරීම වඩාත් සුදුසු යැයි ඉස්ලාම් පවසයි.

මෙම හදීස් හී අවසානයේ සඳහන් “සෙසු මුස්ලිම් අයට පහර නොදෙන්න“ යන කොටස ගැන බලමු. මුස්ලිම්වරුන් අතර යහපත් හා කාරුණික හැසිරීම් ස්වභාවිකව තිබිය යුතු බවද, මුදලින් හා ශාරීරිකව බලවතෙක් දුබල කෙනෙකුට පහර දී හිරිහැර නොකළ යුතු බවද මෙම හදීසය පවසයි. ඇත්ත වශයෙන්ම දුබල පිරිස ඉස්ලාමීය සමාජයේ රැකවරණය ලැබූ පිරිසක් බව සැලකේ.

වැරදි කළ කෙනෙකුට නීති මාර්ගයෙන් උසාවියෙන් දෙන දඬුවම ගැන මෙහිදී සඳහන් නොවන බව සලකන්න. උසාවියෙන් නිසියාකාරව නඩු විභාග කර වැරදිකරුට නිත්‍යානුකූලව පවරන දඬුවම ඔහු කළ වරදට සහ ඔහු සහ ඔහු වැනි අයගෙන් සමාජයේ ඉතිරි ජනයා ආරක්ෂා කරනු පිණිස ගත් පියවරක් හෙයින්, මෙය ඉස්ලාම් දහමට අනුකූල බව සැලකිය යුතුය.

## 27.සේවකයන් සමඟ ආහාර ගැනීම

“ඔබේ සේවකයෙක් ආහාර ගෙන ආ විට ඔබ සමඟ කෑමට වාඩි වන ලෙස ඔහුට පැවසිය යුතුයි. ඔහු (සේවකයා) එයට කැමති නොවුවා නම් ඔහුට ආහාර ස්වල්පයක් දිය යුතුය.“ යි මුහම්මද් සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම් තුමාණන් පැවසූ බව අබූ හුරෙයිරා

(රලි) දන්වා අල් බුහාරි, මුස්ලිම් සහ අබු දාවුද් වාර්තා කළහ.

ඉහත සඳහන් හදීසියේ අවසානයේ, ‘‘එයට හේතුව ලිප් ගින්නේ දැවී, එම ආහාරය පිළියෙල කළේ ඔහුය.‘‘ යැයි නබි සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම් තුමාණන් පවසු බව මික්දාම් (රලි) දන්වා අන් නසායි සහ අහ්මද් වාර්තා කළහ.

- තම සේවකයාට ආහාර සඳහා වාඩි වන ලෙස අණ කරන්නට හෝ ආහාර සුවල්පයක් දී, ඉවත් කරන්නට කෙනෙකුට හිමිකම් තිබෙන අතර, එසේ අණ කළහොත් ස්වකයා එය පිළිපැදිය යුතු බව මෙම හදීසිය පැහැදිලි කරමින් ඉමාම් ෂාෆි කීවේය.

- ඇතැම් අවස්ථාවන්හී දී සේවකයෙක් තම ස්වාමියාට දක්වන ගෞරවය හේතු කොට ගෙන තනිවම හෝ සිය පවුලේ අය සමඟ කෑම කන්නට කැමැති වනු ඇත. එවිට එම සේවකයාට ආහාර ස්වල්පයක් දී ඉවත් වන්නට ඉඩ දිය යුතුය.

- ආහාර පිළියෙල කළ සේවකයාට එම ආහාරයෙන් කොටසක් කෑමට හිමිකමක් ඇති බව මෙම හදිසියේ ප්‍රධාන අර්ථය වේ. මෙම අයිතිය තම සේවකයන්ට කිසිවිටක නොදෙන - ඉතිරි වී වීස

කරන ආහාරය පවා සේවකයන්ට නොදෙන හාම්පුතුන් අප සමාජයේ තවමත් සිටින බව අපි දනිමු. ඒ අය කරන්නේ වැරදි සහ පාප ක්‍රියාවක් බව මෙම හදීසය පෙන්නුම් කරයි.

- කෙනෙක් තම පවුලේ අයට සහ සේවකයන්ට දෙන ආහාරය සදකා ලෙස සැලකෙන හෙයින් එම ක්‍රියාව තුළින්ද අල්ලාහ්ගේ සතුට ලබා ගත හැක.
- සමාජයේ සේවකයින්ට සහ දුගී අයට ඉස්ලාම් දක්වන සැලකිල්ලට මෙය තවත් උදාහරණයක් වේ.

## 28. උපකාරයට ප්‍රති උපකාර කිරීම

“උපකාරයක් ලැබූ කෙනෙක් එයට ප්‍රති උපකාර කළ යුතුයි. එය කළ නොහැකි කෙනෙක් උපකාර කළ අයට ප්‍රශංසා කර, තම ස්තූතිය ප්‍රකාශ කළ යුතුයි. තමන්ට අයත් නොවන ආභරණයක් පැලඳ ගත් කෙනෙක් අසත්‍ය වස්ත්‍ර දෙකක් පැලඳ ගත් කෙනෙක් බව සැලකේ.“ යැයි නබි සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් තුමාණන් පැවසූ බව ජාබර් ඉබ්නු අබ්දුල්ලාහ් (රළි) දන්වා අල් බුහාරි, අබූ දාවූද් සහ අත් තිර්මිදි වාර්තා කළහ.

- ඥාතීන් සහ අසල් වැසියන් අතර උපකාර කිරීම හා තෑගි හුවමාරු කර ගැනීම සමාජයේ පොදුවේ පවතින සිරිතකි. තමා ලැබූ උපකාරයට වඩා උසස් ප්‍රති උපකාරයක් කිරීම මුහම්මද් නබි (සල) තුමාණන්ගේ සිරිතකි. අපටත් එසේ කරන ලෙස මෙම හදිස් මගින් එතුමාණන් උපදෙස් දෙන්නේ, සමාජයේ සමගිය තවත් තහවුරු කරනු පිණිසයි. උපකාර ලැබ, එයට කිසිවිටක ප්‍රති උපකාරයක් නොකරන කෙනෙකුට සමාජයේ හොඳ නාමයක් නොලැබෙන බව කවුරුත් දනී.
- ප්‍රති උපකාර කිරීමට හැකියාවක් නොමැති කෙනෙක්, කළ හැකි අවම දේ කුමක් දැයි ඉහත සඳහන් හදීස් හි නබි සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් තුමාණන් පෙන්වා දුන්නේය. එනම්, උපකාර කළ කෙනෙකු නැති ස්ථානයක ඔහු ගැන ප්‍රශංසා කිරීමෙන් ඔහුට අවංක ස්තූතිය ප්‍රකාශ කිරීමයි.
- උපකාර කළ කෙනෙකුට ප්‍රති උපකාර කිරීමට නොහැකි වූ විට, ඔහු වෙනුවෙන් අල්ලාහ් වෙත ප්‍රාර්ථනා කරන ලෙස නබි සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් තුමාණන් තවත් අවස්ථාවක උපදෙස්

දුන් බව අබ්දුල්ලාහ් ඉබ්න් උමර් දන්වා අල් බුහාරි, අබූ දාවූද්, අන් නසායි සහ අහ්මද් වාර්තා කළහ.

➢ කෙනෙක් ඉදිරියේ ඔහු ගැන ගුණ වර්ණනා කර ප්‍රශංසා කිරීම ඉස්ලාම් අනුමත නොකරන අතර කෙනෙක් නැති තැනක ඔහු ගැන ඕපාදූප කථා කිරීමද අනුමත නොකරයි. ඒ සමඟ කෙනෙක් කළ උපකාරය සඳහන් නොකර සඟවන්නෙක් ගුණ මකුවෙකු ලෙස ඉස්ලාම් හී සැලකෙන හෙයින් තමා ලැබූ උපකාරය සැඟවීම පිළිකුල් සහගත ක්‍රියාවක් බව ඉස්ලාම් පෙන්වා දෙයි.

➢ මෙම හදිස් හී අවසාන කොටස කෙනෙකුට වැරදි මතයක් දීමට හෝ කෙනෙක් මුළා කිරීමට ක්‍රියා කිරීම ගැන පවසන නමුත්, තෑගි පිළිබඳ මාතෘකාව හා එය සම්බන්ධ කිරීමට හේතුවක් ඇත. එනම්, ඇතැම් කාන්තාවන් තමන්ට අයත් නොවන ආභරණක් පැලඳගෙන, තම ස්වාමි පුරුෂාගෙන් විශේෂ සැලකිලි ලබන බව අනුන්නට පෙන්වන්නට වැයම් කරන බව අපි දනිමු. මේ නිසා අනිකුත් කාන්තාවන්ගේ සිත් තුළ තරඟකාරි ස්වභාවය සහ ඊර්ෂයාව හට ගන්නට මඟ පැදෙයි. මිනිසෙකුගේ බිරියන් දෙදෙනෙක් සිටින නිවසක

ඔවුන්ගෙන් එක් කෙනෙක් මෙලෙස පැලඳ ගත් විට, සිදු විය හැකි ප්‍රශ්න ගැන වටහා ගත හැක.

- මෙම තත්ත්වය පහදා දෙනු පිණිස, තමාට අයත් නොවන ආභරණයක් පැලඳ ගත් කෙනෙක් අසත්‍ය වස්ත්‍ර දෙකක් පැලඳ ගත් කෙනෙක් බව සඳහන් කළ නබි සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම් තුමාණන්, ඒ තැනැත්තා (හෝ තැනැත්ති) හිස සිට පා දක්වා බොරුවෙන් පිරුණු කෙනෙක් බව පෙන්වා දුන්හ. ඔවුන්ගේ අරමුණ සමාජයේ අසහනය පැතිරීම වන අතර, එයින් සමාජයට කිසිදු යහපතක් සිදු නොවේ.

## 29.මිනිසාට සහ අල්ලාහ්ට කෘතඥ වීම

“තමාට උපකාර කළ කෙනෙකුට කෘතඥ නොවන කෙනෙක් අල්ලාහ්ට ගුණ මකු කෙනෙක් බවට පත්වන්නේය.“ යි මුහම්මද් නබි සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම් තුමාණන් පැවසූ බව අබූ හුරෙයිරා (රලි) දන්වා අල් බුහාරි, අබූ දාවූද්, අත් තිර්මිදි සහ ඉබ්නු මාජා වාර්තා කළහ.

- අප දෛනික ජීවිතයේ නොයෙකුත් අවස්ථාවන් හී විවිධ අයගෙන් උදව් උපකාර ලබා ගැනීම නිතර සිදු වන බව දනිමු. මෙම සියලු උදව් උපකාර

ලබන්නට අපට අයිතියක් තිබෙන බව කිව හැකිද? උදව් උපකාර කරන්නෙකුට අපි ස්තූතිය පල කරන විට එයින් සතුටු වන ඔහු යළි උදව් උපකාර කිරීමට ඉදිරිපත් වීම ස්වභාවිකයි.

- එමෙන්ම අල්ලාහ්ගෙන් අපි ලබන අසීමිත උපකාර සඳහා අල්ලාහ්ට ප්‍රශංසා කළ යුතු බව අපි අතර බොහෝ දෙනෙක් නොදනිති. බලන්නට දෑස්, සවන් දෙන්නට කණ් සහ අනිකුත් අවශ්‍යතාවන්ට විවිධ අවයවන් දුන් අල්ලාහ්ට අපි ප්‍රශංසා කළ යුතු බව කිවහොත් ඇතැම් අය අප දෙස මවිතයෙන් බලන්නට ඉඩ ඇත. මේ සියල්ල ලබන්නට තමන්ට අයිතියක් තිබෙන බව මේ අය සලකන හෙයින්, මේවා සඳහා අල්ලාහ්ට ප්‍රශංසා කළ යුතු බව ඔවුන් සිතන්නේද නැත.

- මේ සියලු වරප්‍රසාද සඳහා අල්ලාහ්ට අපි ප්‍රශංසා කළ යුතු වේ. අපි කරන ප්‍රශංසා හේතුවෙන් අල්ලාහ්ට කිසිදු ලාභයක් හෝ වැඩි වීමක් සිදු නොවන නමුත් අල්ලාහ්ට ප්‍රශංසා නොකිරීම නිසා මිනිසා තුළ තිබෙන, කළ ගුණ නොතකන පහත් භාවය පෙන්නුම් කරයි.

➢ මිනිසෙක් තමාට කළ උපකාරයට කෘතඥ වීමේ පුරුද්දක් නොමැති කෙනෙකු අල්ලාහ්ගෙන් හිමි වූ, කියා නිම කළ නොහැකි ආශිර්වාදයන් කිසිවකට කෘතඥ වනු ඇතැයි බලා පොරොත්තු විය නොහැක. තවද තමාට මිනිසෙක් කළ උපකාරයට කෘතඥ වන කෙනෙක්, එම මිනිසාගේ මාර්ගයෙන් තමාට කළ උපකාරය සඳහා අල්ලාහ්ට කෘතඥ වන කෙනෙකු බවට පත් වනු ඇත.

## 30. සලාහ් මෙහෙය වීමට ඉමාම් කෙනෙකු තෝරා ගැනීම

“ඔබේ නිවසේ අයට ආගම පිළිබඳව ඔබ ඉගෙන ගත් දේ කියා දෙන්න. මම කෙසේ සලාහ් කළ බව ඔබ දුටුවේද, ඒ අයුරින් සලාහ් කරන්න. වෙලාව පැමිණි විට සලාහ් සඳහා අදාන් (ඇරයුම්) කියන්න. ඔබ අතරින් වැඩි මහල් කෙනෙකු ඉමාම් වශයෙන් සිට සලාහ් මෙහෙය වන්න.“ යි මුහම්මද් සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම් තුමාණන් පැවසූ බව මාලික් ඉබ්න් අල් හුවෙයිරිත් (රළි) දන්වා හදිස් පිළිබඳ විද්වතුන් හය දෙනාම වාර්තා කළහ.

➢ ඉස්ලාම් හී දෙවන කුලුන වන සලාහ් නැමදුම මුස්ලිම් වරුන්ගේ ජීවිතයේ අත්‍යවශ්‍ය ස්ථානයක්

දරණ බව පෙන්වනු පිණිස, “මුස්ලිම් වරුන් හා මුස්ලිම් නොවන අය අතර තිබෙන වෙනස සලාහ් ඉටු කිරීමයි.“ යනු මුහම්මද් සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම් තුමාණන් පැවසුහ.

- මෙම හදීසය කරුණු කිහිපයක් ගැන අපට පැහැදිලි කරයි. සලාහ් කරන්නේ කෙසේද?, සලාහ් වෙහි වේලාවන් කුමක්ද? සලාවෙහි නිරත වන විට පැවසිය යුතු දේ කුමක්ද? සලාවෙහි වැරැද්දක් සිදු වූ විට එයට පිළියම කුමක්ද? යන කරුණු පමණක් නොව, සලාහ් කිරීමට කායිකව අපොහොසත් කෙනෙක් සලාහ් කරන්නේ කෙසේද යන කරුණු පවා මුහම්මද් සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම් තුමාණන් විස්තරාත්මකව පෙන්වා දී ඇත.

- අල්ලාහ් අංග සම්පූර්ණව පහළ කළ ආගම වන ඉස්ලාම් හී තව කෙනෙකු සම්පූර්ණ කළ යුතු යැයි පවසන්නට කිසිවක් ඉතිරි වී නැත. මේ නිසා සලාහ් ක්‍රියාවෙ හි නිරත වන කෙනෙකුට කිසි කළක තමා කැමති ආකාරයට එය ඉටු කළ නොහැක. එසේ යමෙක් කරන්නේ නම්, ඉස්ලාම්

සම්පූර්ණ නොවූ බව පවසන මහා පාපයට පත් වන බව ඔහු මතක තබා ගත යුතුයි.

- සලාහ් වෙලාව පැමිණි විට එය දන්වන අදාන් කියන්නට ඕනෑම කෙනෙක් වයස හෝ දැනුම නොතකා ඉදිරිපත් විය හැකි අතර, අදාන් හී පවසන වචන කිසිවක් වෙනස් කළ නොයුතුයි. එහෙත් ඉදිරියේ සිට සලාහ් මෙහෙය වන ඉමාම් වශයෙන් කටයුතු කරන්නා පිළිබඳ ඇතැම් වැදගත් කරුණු ගැන නබි සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් තුමාණන් පෙන්වා දුන්හ.

- මෙ විෂය පිළිබඳව තිබෙන අනිකුත් හදිස් වදන් ගැනද සලකා බලන කල් හී, කුර්ආනය නිවැරදිව පාරායනය කිරීමට හැකි තැනැත්තා ඉමාම් ලෙස ඉදිරිපත් විය යුතු බව පැහැදිලි වේ. එක හා සමානව කුර්ආන් පාරායන කළ හැකි දෙදෙනෙක් සිටියේ නම්, එයින් වැඩි මහල් තැනැත්තා ඉමාම් ලෙස සිට ගත යුතු නමුත්, මෙහි දී වයසෙන් පමණක් වැඩි තැනැත්තා ගැන සැලකීම වැරදිය. තම ජීවිතය මුළුල්ලේම පාප ක්‍රියාවන් හී යෙදී මැතක දී ඉස්ලාමිය ජීවිතයට පා තැබූ මහලු තැනැත්තාට වඩා, ඉස්ලාමිය දැනුම සහිතව දිගු

කලක් පාප ක්‍රියාවන්ගෙන් ඈත් වී ජීවත් වූණු කෙනෙක් ඉමාම් වශයෙන් කටයුතු කිරීමට සුදුස්සෙක් බව සලකන්න.

- උසස් ගුණාංගයන් සහිතව යහපත් ලෙස ජීවත්වන තරුණයන්ට නායකත්වය පිරිනමා, ඔවුන්ට ඉස්ලාම් දක්වන ගෞරවය මෙම හදිසය අපට පැහැදිලි කරයි.

## 31.අල්ලහ්ගෙන් ත්‍යාග ලබන විවිධ මාර්ග

අබු දර් (රලි) වරක් මුහම්මද් සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් තුමාණන්ගෙන් “උසස්තම ක්‍රියාවන් කුමක්දැ?“ යි ප්‍රශ්න කළ විට “අල්ලාහ් ගැන විශ්වාසය තැබීම සහ ඔහුගේ මාර්ගයේ ශ්‍රමය යෙදීම.“ යැයි නබි සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් තුමාණන් පිළිතුරු දුන්හ. “(නිදහස් කිරීමට) වඩා සුදුසු වහලා කවුදැ?“ යි ප්‍රශ්න කළ විට “වටිනාකමින් අධික බව ඔහුගේ හිමිකරු විසින් සලකනු ලබන්නෙක්යැ.“ යි එතුමාණන් පිළිතුරු දුන්හ. “මේවා කිසිවක් කිරීමට මට නොහැකි නම්, කුමක් කරන්නදැ?“ යි විමසූ විට “කෙනෙකුගේ ජීවනෝපාය සඳහා කිසිවක් කරන්නට පුහුණුවක් නොමැති කෙනෙකුට උදව් අපකාර කරන්න“ යි නබි සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් තුමාණන් පිළිතුරු දුන්හ. “මෙය පවා කිරීමට මට නොහැකි නම් කුමක් කරන්නදැ?“ යි විමසූ විට

“අනුන් හට හානි සිදු කිරීමෙන් වලකින්න. මෙය ඔබ විසින් ඔබටම කර ගන්නා පිනක් වේ“ යැයි නබි සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම් තුමාණන් පිළිතුරු දුන්හ. අල් බුහාරි, මුස්ලිම්, අහමද් සහ අනිත් අය වාර්තා කළහ.

නබි සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම් තුමාණන්ගේ අනුගාමිකයන් කුසල් ලැබෙන ක්‍රියාවන් ඉටු කිරීමට නිතරම සෙවිල්ලේ සිටියාක් මෙන් එයට අවශ්‍ය ආගමික දැනුම වර්ධනය කර ගැනීමටද විශේෂ ළැදියාවක් දැක් වූහ.

- ☐ උසස්තම ක්‍රියාව දේව විශ්වාසයැ යි මුලින්ම සඳහන් කිරීමෙන් කෙනෙකුගේ ජීවිතයේ දේව විශ්වාසය වැදගත් ස්ථානයක් දරණ බව නබි සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම් තුමාණන් පෙන්වා දුන්හ. අප සෑම ක්‍රියාවක්ම දේව විශ්වාසය පදනම් කොට ගෙන ඇරඹිය යුතු බව මෙයින් පැහැදිලි වේ. දේව විශ්වාසයෙන් තොරව කෙනෙකු කරන ඕනෑම දෙයකින් ඔහුට කිසිදු ඵලක් සිදු නොවන බව අල් කුර්ආන් පවසයි. එමෙන්ම අල්ලාහ් කෙරෙහි විශ්වාසය තැබූ කෙනෙකු එය තම දෛනික ජිවිතයේ ක්‍රියාවෙහි නොයෙදුණේ නම් ඔහුගේ දේව විශ්වාස යෙන්ද කිසිදු ඵලක් නොමැත. එනම් මුස්ලිම් වරයෙකුගේ

ජීවින මාර්ගය දේව විශ්වාසයෙන් වෙන්ව ක්‍රියාකළ නොහැකි බව සලකන්න.

- ☐ ජිහාද් යනු යුද්ධයක සටන් කිරීම පමණක් බව ඇතැම් මුස්ලිම් වරු ඇතුළු බොහෝ දෙනෙක් සිතන නමුත්, දෛනික ජිවිතයේ ඉස්ලාමය පිළිපදින්නට කෙනෙක් කරන වෑයමද, ඒ සඳහා ඔහු කරන පරිත්‍යාගයන්ද ජිහාද් ලෙස සැලකේ. අල්ලාහ්ගේ මාර්ගයේ සටන් කිරීම සඳහා තම ජීවිතය පවා පරිත්‍යාග කිරිමට කෙනෙක් ඉදිරිපත් වීම ජිහාද් හි අවසාන පියවර වේ.

- ☐ වහලෙක් නිදහස් කිරීම යන්නෙන් කරුණු දෙකක් අදහස් කෙරේ.වහල් භාවය නම් පීඩාව ඉස්ලාමයට වර්ෂ දස දහස් ගණනකට පෙර සෑම රටකම පොදුවේ පැවතුණු බව මතකයේ තබා ගත යුතුයි. සෑම අවස්ථාවකම වහල් භාවය සමාජයෙන් තුරන් කිරීමට ඉස්ලාම් වෙර දැරීය. නොයෙකුත් පාපයන් සඳහා වහලෙක් නිදහස් කිරීමෙන් අල්ලාහ්ගේ සමාව සහ සතුට උපයා ගත හැකි බව ඉස්ලාම් පෙන්වයි. ඒ සමඟ වටිනාකමින් අධික වහලෙක් නිදහස් කිරීම තුළින් අල්ලාහ්ගේ සතුට ලබා ගත

හැකි බවද නබි සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් තුමාණන්ගේ හදිස් වදන පෙන්වයි.

- මෙවැනි පරිත්‍යාග කිරීමට ආර්ථිකව හා කායිකව අපොහොසත් වුවත් අල්ලාහ්ගේ සතුට පතන බොහෝ දෙනෙක් සිටිති. සමාජයේ අනිත් අයට උදව් උපකාර කිරීමෙන් අල්ලාහ්ගේ ආශිර්වාදය මෙම අයටද ලබා ගත හැකි බව නබි සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් තුමාණන් පෙන්වූහ.

- සුළු රැකියාවකින් ලැබෙන වේතනයෙන් පවුලක් නඩත්තු කිරීමට මහන්සි ගන්නා අය අපි දකිමු. එමෙන්ම කිසිදු රැකියාවක් කිරීමට නුපුහුණු අයද අප අතර සිටිති. අනුන් වෙත අත නොපාන මේ අය තව කෙනෙකුගෙන් ලැබෙන ඕනෑම උදව් උපකාරයක් අගේ කොට සලකති. මෙවැනි අයට සුළු වශයෙන් හෝ පිහිට වීමෙන් අල්ලාහ්ගේ සතුට ලබා ගත හැකි බවද මෙම හදිසය පෙන්වයි.

නොයෙකුත් හේතූන් නිසා මේවා කිසිවක් කිරීමට අපොහොසත් පිරිසක්ද අප අතර සිටින බව අපි දනිමු. මේ අය ගැන ප්‍රශ්න කළ විට කිසිවෙකුට කිසිදු හානියක් නොකිරීම පවා කුසල් ක්‍රියාවක් යැයි නබි සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් තුමාණන් පැවසූහ. අනුන් හට හානි සිදු කිරීමෙන්

යම් වාසියක් ලබා ගත හැකි නම් එම වාසිය පතා ඕනෑම අපරාධයක් සිදු කිරීමට පසුබට නොවන අද සමාජයට, අනුන් හට හානි සිදු නොකිරීමෙන් කුසල් එකතු කර ගන්නටද, අල්ලාහ්ගේ ආශීර්වාදය ලබා ගන්නටද මාර්ග තිබෙන බව නබි සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම් තුමාණන් පෙන්වා දුන්හ. මෙය ඕනෑම කෙනෙකුට පහසුවෙන් කළ හැකි වනු ඇත.

## 32. මෙලොව සහ මතු ජීවිතයේ යහපත් අය

"මෙලොව ජීවිතයේ යහපත් අය මතු ජීවිතයේද යහපත් අය වෙති. එමෙන්ම මෙලොව ජීවිතයේ අයහපත් අය, මතු ජීවිතයේද අයහපත් අය වෙති." යැයි මුහම්මද් සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම් තුමාණන් පැවසූ බව කබිස්සා (රලි) දන්වා අල් බුහාරි වාර්තා කරයි. මෙම හදීසය අරාබි බසින් ප්‍රසිද්ධ ව්‍යවහාර වදනක් බවට පත් ව ඇත.

මිනිසාගේ යහ ගුණය වර්ධනය කිරීම ඉස්ලාමයේ සියලු ඉගැන් වීම්හි අරමුණ වේ. පරිසරය, සමාජය, ආර්ථික හා කර්මාන්ත යන කුමන දෙයක් වෙනස් වුවත් මිනිසා ස්වාභාවිකව අගය කරන යහ ගුණයන් සියල්ල එදා මෙන් අදත් වෙනස් නොවී පවතී. අවංකභාවය, සත්‍යතාව, මෛත්‍රිය, දුගීන්ට සරණ වීම,

විශ්වාස වන්තභාවය යන යහ ගුණයන් ඒවායින් කිහිපයකි. මේ සියලු යහ ගුණයන් තම දෛනික ජීවිතයේ අනුගමනය කරන ලෙස ඉස්ලාම් පොලඹවයි.

- ☐ සියලු ජනයාම යහ ගුණය අගය කරති. ඒවා සමාජයක අනිවාර්ය අංගයක් බවට ඉස්ලාම් පත් කරන්නේ විනිශ්චය දිනය සහ මරණයෙන් පසු ජීවිතය කෙරෙහි මුස්ලිම්වරුන්ගේ අවධානය යොමු කරමින්ය.

- ☐ මරණයෙන් පසු යළි නැගිට මෙලොව ජීවිතයේ තමා කළ සියලු ක්‍රියාවන් සඳහා විනිශ්චයට භාජනය වන බව මුස්ලිම්වරු දනති. එම ක්‍රියාවන් කෙතරම් සුළු වුවද ඔහු/ඇය එදින ඒවායේ වගකීම භාර ගෙන පිළිතුරු දිය යුතුය. ඉන් අනතුරුව කෙනෙකුට ස්වර්ගය හෝ නිරයේ ගින්න හිමි වනු ඇත. මෙම අවසාන දිනයේ බැරෑරුම් කම ගැන හඳුනා ගැනීම තුළින් කෙනෙකුගේ දේව විශ්වාසය සහ ඔහු සමාජයේ නිරත වන ආකාරය රැඳී පවතී.

- ☐ අවසාන දිනය ගැන නිතර විමසිල්ලෙන් සිටින කෙනෙකු කිසි විටක තම මරණය ගැන අමතක නොකරයි.

☐ ඕනෑම මොහොතක කෙනෙකුට මරණය සිදු විය හැකි අතර, ඔහුගේ සියළු ක්‍රියාවන් මරණය සිදු වූ එම මොහොතේදි ඇණ හිටියි.

☐ මේ තත්ත්වය කෙනෙකට අවබෝධ වූ මොහොත සිට, මරණයට පෙර ඉටු කළ යුතු සියලු කුසල් ක්‍රියාවන් ඔහු ආරම්භ කළ යුතු අතර, තම ජීවිතයේ කිසිදු අවස්ථාවක එය අමතක කළ නොහැක. මෙම සූදානම් වීමේ මුල් පියවර වන්නේ කුසල් ක්‍රියාවන් පමණක් ඉටු කිරීම සහ සියලු අකුසල් ක්‍රියාවන් ගෙන් ඉවත්වීමයි.

☐ යහපත් දේ අගය කිරීම සෑම කෙනෙකුගේම ස්වාභාවික ගුණයකි. මෙම ස්වභාවික ගුණය වර්ධනය කිරීම තුළින් කෙනෙකුට තම යුතුකම ඉෂ්ට කිරීමට පමණක් නොව මතු ජීවිතයේදීද එයින් ඵලක් ලබා ගත හැකි මාර්ගය තිබෙන බව පෙන්වා දීමෙන්, මිනිසාගේ ජීවිතයට නව අරමුණක් දෙන්නට යෙදෙයි. මේ මගින් සෑම කෙනෙකුම වර්තමාන ජිවිතය සහ අනාගත ජීවිතය අල්ලාහ්ගේ පිහිටෙන් සාර්ථක කර ගනී.

මෙය තවත් පැහැදිලි කිරීමට හර්මලා ඉබ්න් අබ්දුල්ලාහ් (රලි) දන්වන තවත් හදිස් වදනක් දෙස

බලමු. "වරක් මුහම්මද් සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම් තුමාණන්ගෙන්, 'මට ඔබ තුමා දෙන උපදෙස් කුමක්දැ?' යි විමසුවෙමි. එවිට නබි සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම් තුමාණන් 'හර්මලා! යහ දේ කරන්න, අයහපත් දෙයින් වළකින්න' යැයි පිළිතුරු දුන්හ. මම නැවත වරක් ළං වී, 'නබි සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම් තුමාණනි! මම කුමක් කළ යුතු බව ඔබ තුමාණන් නිර්දේශ කරන්නේදැ?' යි ඇසුවෙමි. එවිට එතුමාණෝ, 'හර්මාලා! සියල්ල හැර දමා ඔබ ගිය පසු, (මරණයෙන් පසු) මිනිස්සු ඔබ ගැන කුමක් කිව යුතු දැයි ඔබ කැමති වන්නේද, එය පමණක් කරන්න. එමෙන්ම ඔබ ගැන මිනිස්සු කුමක් පැවසීම ගැන ඔබ අකැමැති වන්නේද එය නොකරන්න.' යි පිළිතුරු දුන්හ. මම නිවසට ගොස් නබි සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම් තුමාණන්ගේ වදන ගැන කල්පනා කළ විට සියලු යහපත් දෙයක්ම එහි අඩංගු වී තිබෙන බව පහදා ගත්තෙමි." අදබ් අල් මුෆ්රද් ග්‍රන්ථයෙහි අල් බුහාරි වාර්තා කරයි.

- ☐ මෙම උපදෙස් හර්මලා (රලි) තුමාට මෙන්ම, ආගම්, ජාති හෝ පංති භේදයෙන් තොරව අප සියලු දෙනාටම යෝග්‍ය බව පෙනේ.

- ☐ නබි සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම් තුමාණන් මෙම හදිස් දෙක මගින් යහ දේ කිරීම තුළින් මෙලොව ජීවිතයට පමණක් නොව මතු

ලොවෙහිදී ද ලාභ ලබා ගත හැකි බව පෙන්වා දුන්හ. මෙලොව ජීවිතය මතු ජීවිතය සමඟ සම්බන්ධ කර ඉස්ලාම් පෙන්වන මාර්ගය මෙයයි.

## 33. සොහොයුරෙකුගෙන් අයුතු ප්‍රයෝජන ලබන්නා

"කවරෙකු හෝ මුස්ලිම් වරයෙකුගෙන් අයුතු ලෙස ආහාර වේලක් ලබන්නේද, ඒ වෙනුවට දැවෙන ගින්නෙන් ඒ හා සමාන ආහාරයක් බුදින්නට අල්ලාහ් ඔහුට මඟ සලසයි. කවරෙකු හෝ මුස්ලිම් වරයෙගෙන් අයුතු ලෙස ඇඳුමක් ලබන්නේනද, ඒ වෙනුවෙන් දැවෙන ගිනි ඇඳුමක් අඳින්නට අල්ලාහ් ඔහුට සිදු කරයි. කවරෙකි මුස්ලිම් වරයෙකු ගැන අයහපත් දේ පවසන්නේද අවසාන දිනයේදී අල්ලාහ් ඔහු ගැන අයහපත් දේ පවසනු ඇත." යැයි මුහම්මද් සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම් තුමාණන් පැවසූහ. මෙම හදිසය අහ්මද්, අබූ දාවූද් සහ අදබ් අල් මුෆ්රද් හී අල් බුහාරි වාර්තා කර ඇත.

- ☐ මෙම හදීස් හි නබි සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම් තුමාණන් සඳහන් කරන්නේ ආහාර සඳහා ආරාධනාවක් ලැබ, එය පිළි ගත් කෙනෙකු ගැන නොව මුස්ලිම් වරයෙකුගේ වැරදි හෝ අඩු පාඩු හෝ කේලම් පවසා වැරදි මාර්ගයෙන් තම

අවශ්‍යතාවන් (ආහාර හෝ ඇඳුම්) ලබා ගන්නට වෑයම් කරන මුස්ලිම් වරුන්ට අවවාද කරනු පිණිසයැ යි සලකන්න.

"මුස්ලිම් වරයෙක් තවත් මුස්ලිම් වරයෙකුගේ සොයුරෙක් වේ." යැයි නබි සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් තුමාණන්ගේ වදන සමඟ සසඳා මෙම හදිසය පහදා දෙන විට, හදිස් විද්වතුන් පහත සඳහන් කරුණු කෙරෙහි අප අවධානය යොමු කරති.

- ☐ තම මිතුරෙක් සමඟ කෙනෙක් අමනාප වී සිටින බව දැන ගෙන ඔහු වෙතට ගොස්, මිත්‍රයාට විරුද්ධව ඕපා දූප, කේලම් හා ඔහුගේ අඩු පාඩු යන දේ පවසා, එම තැනැත්තා සතුටු කිරීමට වෑයම් කරන මුස්ලිම් වරයෙකු පිළිබඳව මෙහි දී සඳහන් වේ. මෙම පහත් ක්‍රියාවෙන් සතුටු වූ කෙනෙක්, මෙම මුස්ලිම් වරයාට ආහාර, ඇඳුම් හෝ වෙනත් යම් දෙයක් සපයන්නට යෙදෙයි. එනම්, මෙම මුස්ලිම්වරයා තම මිත්‍රයා නැති ස්ථානයක ඔහු ගැන ඕපා දූප පවසා ඔහු ව පාවා දීමෙන් මේවා ලබා ගත් බව නිසැකයි.

- ☐ වැරදි මාර්ගයෙන් ලබා ගත් බව සැලකෙන මෙවැනි වාසියට අල්ලාහ්ගේ ආශීර්වාද නොලැබෙන අතර ඔහුගේ දූකට ද මෙය හේතුවක්

වෙයි. අවසාන දිනයේ අල්ලාහ් ඔහු ලබා ගත් මෙම වාසිය වෙනුවට නිරයේ ගින්නෙන් පිළිතුරු සපයයි. මෙය ඉතාමත් අවාසනාවන්ත තත්ත්වයක් බව කවුරුත් දනිති.

- යමෙක් ගැන හෝ තමා ගැන අනුන් ගේ සිතේ උසස් මතයක් ඇති කරන අදහසින්, බොරු ගොතා බොරු ගුණවර්ණ පවසා මිනිසුන් ගේ සිත් දිනා ගෙන, ඉන් අනතුරුව ඒ අය මුළා කිරීමට හා අයුතු වාසි ලබන්නට උත්සාහ කරන අයහපත් ක්‍රියාවන් ගැන මෙම හදීසයේ අවසාන කොටස සඳහන් කරයි. මෙ වැනි ප්‍රොඩාවන් හී යෙදෙන අය ගැන ද, සමාජය ගසා කෑමෙන් ඒ අය රැස් කරන ධනය ගැනද අපි දනිමු. අවසාන දිනයේ සියලු අය ඉදිරියේ ඔවුන් බොරුකාරයෝ බවට අල්ලාහ් හෙළි දරව් කරයි.

- අල්ලාහ්ගේ ආදරය නොපතා සමාජයේ තමා ගැන උසස් මතයක් ගොඩ නගන අරමුණකින් යහපත් කෙනෙක් ලෙස පෙනී සිටීම සහ හැසිරීම අප අතර ඇතැම් අයගේ පුරුද්දකි.මෙ තුළින් අයුතු ලාභ හා වාසි ලබා ගැනීමටද ඔවුන් බලා පොරොත්තු වෙති.

- අවසාන් දිනයේ මෙවැනි සියලු අයෙගේ සැබෑ ස්වරූපය හෙළිදරව් කරන බව අල්ලාහ් පොරොන්දු වෙයි.

## 34. අයිතිකරුගේ අනුමැතියෙන් තොරව යමක් ගැනීම

මෙම මාතෘකාව පිළිබඳව නබි සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම් තුමාණන්ගේ වදනක් දෙස බලමු. “ඔබේ මිතුරෙකුට හිමි කිසිම දෙයක් විහිළුවට වුවද නොගන්න. ඔහුට හිමි කෝටු කෑල්ලක් වුවද ගත්තේ නම් එය ආපසු දෙන්න.“ අබූ දාවුද්, තිර්මිදි සහ අදබ් අල් මුෆ්රද් ග්‍රන්ථයේ අල් බුහාරි වාර්තා කර ඇත.

- ඉතා සමීප මිතුරෙකුගෙන් පවා ඔහුගේ අනුමැතියෙන් තොරව විහිළුවට වුවද කිසිවක්, එය කුඩා කෝටු කෑල්ලක් වුවද නොගන්නා ලෙස මෙම හදීසය පැහැදිලි කරයි.

- හදීන් විද්වතුන් මෙම හදීසය පහදා දීමට යොදා ගත් උදාහරණය දෙස බලමු. නිදා සිටින කෙනෙකුගේ ඇතැම් මිතුරන් ඔහුගේ යමක් විහිළුවට සඟවා, ඔහු නින්දෙන් අවදි වී එය සොයා කලබල වුවහොත්, ඔහුට විහිළු කර සිනහ වෙන්නට යෙදෙති. මෙම අවස්ථාවෙහි අවට සිටින

අයද මෙයට සහභාගි වෙති. මෙලෙස කවුරුත් සතුටු ලබන්නේ ඔහුගේ සිත් වේදනාව මතය.

- ☐ ආරම්භයේදී මිතුරන් යමක් ගත්තේ හානියක් හෝ පැඩුවක් සිදු කිරීමට නොව විහිළුවට වුවද, දැන් ඔහුව විහිළුවට ලක් කරමින් විනොද වන්නේ සැබෑවටයි.

- ☐ මෙලෙස මිතුරන් සහ තවත් පිරිසක් විනෝද වන්නේ එක් අයකුගේ සිත් වේදනාව මත බව කාටත් පෙනී යයි. විහිළුවට ආරම්භ කළ ක්‍රියාවක් සීමාව ඉක්මවා කෝපයට තුඩු දී අවසානයේ බරපතළ හානි සිදු වූ අවස්ථාවන් ගැනද අපි දනිමු. විශ්ව විද්‍යාලයන්හී නවක වද යන නාමයෙන් එක් පිරිසකගේ සතුට උදෙසා තවත් පිරිසකට සිදු කරන පීඩනය මෙවැන්නකි. මෙහිදී ජීවිත හානි කිහිපයක් සිදු වූ බව අපි දනිමු.

- ☐ නබි සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් තුමාණන් ගේ හදිසයේ සඳහන් වන්නේ කිසිදු වටිනාකමක් නොමැති “කුඩා කෝටු කෑල්ලක්“ ය. මෙවැනි සුළු දෙයක් පවා අයිතිකරුගේ අනුමැතියෙන් තොරව ගත්තේ නම්, වහාම ආපසු දිය යුතු බව මෙහිදී පෙන්වා දි ඇත.

☐ මෙවැනි අල්ප දෙයක් ගැන පවා අමතක නොකර, එය ගැන සඳහන් කරමින් සියලු මුස්ලිම්වරු අතර අන්‍යෝන්‍ය සහෝදරත් වය ගොඩ නඟන්නට ඉස්ලාම් මඟ පෙන්වයි. මෙම සහෝදරත්වය බිඳ දමන්නට එහි සාමාජිකයින් කවරෙක් හෝ යෙදුනේ නම් එය විශාල පාපයක් බව සලකන්න.

☐ මුස්ලිම්වරයෙකුගේ දේපළ හා ප්‍රාණය මෙන් ඔහුගේ ගෞරවයද පවිත්‍ර දෙයක් බවද, ඒවාට හානි සිදු කිරීමට කිසිවෙකුට අයිතියක් නැති බවද රසූල් සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම් තුමාණන් හජ් වන්දනා සමයේ කළ දේශනාව මතක තබා ගත යුතුයි.

## 35. සමාජයේ සාමය පැතිරීම

මහම්මද් සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම් තුමාණෝ අල්ලාහ්ගේ නාමයෙන් දිවුරා "සැබැවින්ම ඔබ මුස්ලිම් වන තුරු ස්වර්ගයට ඇතුළු නොවන්නේය. ඔබ අතර එකිනෙකාට ආදරය දක්වන තුරු, ඔබ මුස්ලිම් බවට පත් නොවන්නේය. ඔබ අතර ආදරය ඇති වන්නට සාමයේ පැතුම පතුරන්න. කෙනෙකුට ජිළිකුල් කිරීම දැලි පිහියක් හා සමානය. එ බැවින් එයින් ඈත්ව ඉවත් වන්න. එම දැලි පිහියෙන් කෙස් ඉවත් කෙරෙන බව නොපවසමි. එහෙත් එය

(දැලි පිහිය) ඔබේ දේව විශ්වාසය සම්පූර්ණයෙන් ඉවත් කරයි.“ යනුවෙන් පැවසූ බව අබූ හුරෙයිරා (රලි) දන්වා මස්ලිම්, අබූ දාවූද්, ඉබ්න් මාජා සහ අදබ් අල් මුෆ්රද් ග්‍රන්ථයෙහි ඉමාම් බුහාරි වාර්තා කළහ.

- ☐ නබි සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් තමාණන් අල්ලාහ්ගේ නාමයෙන් දිවුරා යමක් පවසන්නේ නම් එය තම උපදෙස් හී වැදගත්කම පෙන්වනු පිණිසයි. එ වැනි අවස්ථාවන් හී අනුගාමිකයන් එයට විශේෂ උනන්දුවෙන් සවන් දෙති.

- ☐ මෙම හදීසයේ ආරම්භයේ තම අනුගාමිකයන් ඇතැම් ක්‍රියාවන් ඉටු කරන තුරු ඔවුන් පතන ස්වර්ගය කිසි දිනක නොලැබෙන බව නබි සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් තුමාණන් පැවසූහ. එනම් සවර්ගය හිමි කර ගන්නට ප්‍රථමයෙන් කෙනෙක් සැබෑ එකම දෙවියා කෙරෙහි විශ්වාසය තබන මුස්ලිම්වරයෙක් විය යුතුය. අල්ලාහ් කෙරෙහි විශ්වාසය කුමක් දැයි කිසිවක් නොදන්නා කෙනෙක්, අල්ලාහ්ගෙන් පමණක් හිමි වන ස්වර්ගය ගැන විශ්වාස කරන බව බලාපොරොත්තු විය හැකිද?

- නබි සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම් තුමාණන් ගේ අනුගාමික යන් ඉස්ලාමය පිළිබඳව ආරම්භයේ ලැබූ අවබෝධයෙන් පසුව අල්ලාහ් කෙරෙහි විශ්වාසය තබා මුස්ලිම් වරුන් බවට පත් වූහ. සැබෑ මුස්ලිම් වරයෙකු වීමට දේව විශ්වාසය පමණක් නොව, තවත් අවශ්‍යතාවන් කිහිපයක් තිබෙන බව නබි සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම් ඒ අයට පෙන්වා දුන්හ.

- තම අනුගාමකයන්ට අධිකව සලාහ් ඉටු කරන ලෙස හෝ  උපවාසයේ අධික කාලයක් යෙදෙන ලෙස හෝ අධික ලෙස දන් දෙන ලෙස හෝ උපදෙස් නොකළ එතුමාණන් ඒවා වෙනුවට මුස්ලිම් වරුන් තමන් අතර ආදරය හා මෛත්‍රිය දක්වන තුරු සැබෑ මුස්ලිම්වරුන් වශයෙන් පත් නොවන බව පැවසූහ.

- ඉස්ලාමිය ඉගැන්වීම් සහ ඉස්ලාම් අගය කරන ගුණාංගයන් ගැන දන්නා කෙනෙකු අනුගාමිකයන් අතර සහෝදරත්වය වර්ධන කරනු පිණිස ඉස්ලාම් පෙන්වන මාර්ගයෙ හි අමුත්තක් නොදකී. මුස්ලිම්වරු තම සොයුරන්ට ආදරය දැක්වීමේ අවශ්‍යතාව සඳහන් කළ නබි සල්ලල්ලාහු

අලෛයිහි වසල්ලම් තුමාණන් අනාගත පරපුරටද එම මර්ගය කරා ඇරයුම් කළහ.

- සොයුරන් අතර සාමය පැතිරීම යනු ආදරය වර්ධනය කිරීමේ එක් මාර්ගයකි. "අස්සලාමු අලෛයිකුම්" යන පැතුමෙහි අර්ථය "ඔබට සාමය හිමිවේවා." යන්නයි. මුස්ලිම්වරු අතර පැතුම් අධිකව කියනු ලබයි. සලාම් නොහොත් සාමය අල්ලාහ්ගේ  අලංකාරවත් නාමයක් වන අතර කෙනෙකුට සාමය පතන්නේ අල්ලාහ්ගෙන් ලැබෙන සාමය සහ සහනය සඳහාය. මෙම පැතුම ලැබූ කෙනෙක් එය හා සමාන හෝ එයට වඩා අලංකාරවත් වචනයෙන් පිළිතුරු දිය යුතුයි. මෙම පැතුම් හුවමාරුවෙන් මිනිසුන් අතර සෙනෙහස වර්ධනය වීමද ගැටුම් අඩු විමද සිදුවනු ඇත.

- මිනිසුන්ට පිළිකුල් කිරීම දැලි පිහියක් හා සමාන කළ නබි සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම් තුමාණන් එම දැලි පිහියෙන් ඉවත් වන්නේ කෙනෙකුගේ කෙස් නොව ඔහුගේ දේව විශ්වාසය නම් ඊමාන් බව පහදා දුනී. මිනිසුන්ට පිළිකුල් කිරීම ඉස්ලාමිය සමාජයේ පැතිරුනේ නම්, වැරදි හෝ නිවැරදි මාර්ගයෙන් එකිනෙකාට හානි සිදු

කිරීමට කවුරුත් පෙලඹෙති. එසේ පෙලෙඹෙන විට හෝ හානියක් සිදු කරන විට ඔහු තම ඊමාන් නම් දේව විශ්වාසයට එරෙහිව ක්‍රියා කරයි. මිනිසුන්ට පිළිකුල් කිරීම සමාජයක් තුළ පැතිරුණේ නම් එම සමාජයෙන් දේව විශ්වාසය සම්පූර්ණයෙන් ඉවත් වන බව නබි සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම් තුමාණන් පෙන්වා දුන්හ.

- ඉමානය නම් දේව බිය බැතිමත්කම ඉවත් වූ සමාජයක ඕනෑම පාප ක්‍රියාවක් පහසුවෙන් සිදු වන අවාසනාවන්ත තත්ත්වය අපි සෑම සමාජයකම දකිමු. එවැනි තත්ත්වයට භාජන විමේ අනතුරෙන් අල්ලාහ් වෙත ආරක්ෂා පතමු.

## 36. යහ ක්‍රියාවන් සඳහා මඟ පෙන්වීමේ අගය

අබූ අල් අන්සාරි (රලි) පහත සඳහන් හදීසය දන්වයි. “මිනිහෙක් නබි සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම් තුමාණන් වෙතට පැමිණ, ‘මීට පෙර කිසි දවසක නොසිටි තත්ත්වයකට මම අද පත් ව සිටිමි. මගේ ප්‍රවාහනය සඳහා යමක් සලසා දිය හැකිද?‘ යි විමසුවේය. එවිට නබි සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම් තුමාණන් ‘ඔබට ප්‍රවාහන සපයන්නට මට නොහැක.

එහෙත්, අසවලා වෙතට ගියහොත් ඔහුගෙන් ඔබේ ප්‍රවාහනයට අවශ්‍ය දේ ලබා ගත හැකිවේ.‘ යැයි පවසා සහාබාවරයෙකුගේ නමක් සඳහන් කළෙහ. නබි සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම් තුමාණන් ගේ උපදෙස් මත එහි ගොස් තම අවශ්‍යතාව ලබා ගත් ඔහු, නබි සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම් තුමාණන් වෙතට හැරී පැමිණ ඒ බව දැන් වූ විට, එතුමා ‘කෙනෙකුට යහපතක් ලබා ගන්නට මඟ පෙන්වන කෙනෙක් එම යහපත් ක්‍රියාව ඉටු කරන්නා හා සමාන කුසල් උපයා ගනී.‘ යැයි පැවසූහ. මුස්ලිම්, තිර්මිදි, අබූ දාවූද් සහ අදබ් අල් මුෆ්රද් හී අල් බුහාරි වාර්තා කර ඇත.

- ☐ අරාබි දේශයේ නායකයා වුවත්, මුහම්මද් සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම් තුමාණන් ස්වේච්ඡාවෙන් දිළිඳුකම තෝරා ගත් බවද, ලෞකික සම්පත් කිසිවක් එතුමාණන් සතුව නොතිබූ බවද අප කටුරුත් මතකයේ තබා ගත යුතුයි.

- ☐ මේ හේතුවෙන් ප්‍රවාහන පහසුකම් ඉල්ලුම් කළ තැනැත්තා ගේ ඉල්ලීම නිත්‍යානුකූල බව නබි සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම් තුමානන් දැන ගත් නමුත් එය ඉෂ්ට කළ නොහැකි තත්ත්වයක එතුමාණන් සිටියහ.

- ඒ නිසා අවම වශයෙන් ඔහුගේ අවශ්‍යතාව ලබා ගත හැකි මාර්ගයක් ඔහුට පෙන්වා දුන්හ.

- කෙනෙකුට උපකාර කළ නොහැකිවන අවස්ථාවක එම අවශ්‍යතාව ලබා ගත හැකි මාර්ගය ඔහුට පෙන්වීම, උපකාරයක් කිරීම හා සමාන කුසල් ක්‍රියාවක් බව තම අනුගාමියන්ට නබි සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම් තුමාණන් පෙන්වා දුන්හ.

- කෙනෙකුට මෙලෙස මාර්ගයක් පෙන්වන තැනැත්තා උපකාර කළ තැනැත්තා හා සමාන පිනක් උපයන බව එතුමාණන් සඳහන් කළහ.

- කෙනෙකුට උපකාරයක් නොකිරීම පමණක් නොව, එය ලබා ගත හැකි මාර්ගය පවා සඟවා තබන්නට හෝ වසා දමන්නට කටයුතු කරන අයහපත් ජනතා පිරිසක් සෑම සමාජයකම සිටිති. මේ අය ඉස්ලාමය ඉගැන්වීමට පටහැනිව ක්‍රියා කරන බව මෙහිදී පැහැදිලිව පෙනේ.

- අල්ලාහ්ගේ ආදරය උපයන්නට විවිධ මාර්ගයන් තිබෙන අතර යමෙකුට කුසල් එකතු කළ හැකි

වන්නේ මිනිසාට හා සමාජයට සේවය කිරීමෙන් පමණක් යැයි සලකන්න.

## 37. අල්ලාහ් වෙත පවරා මුළුමනින් රැඳී සිටීම

මුහම්මද් සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම් තුමාණන් ගැන අල් කුර්ආනයේ සඳහන් කරන අයුරින්ම යුදෙව් වරුන්ගේ ආගමික ග්‍රන්ථය වන තව්රාත්හී ද සඳහන් වී තිබෙන ඇතැම් විස්තර පිළිබඳව අබ්දුල්ලාහ් ඉබ් අම්ර් අල් ආස් (රළි) වරක් සඳහන් කළේය. කුර්ආනයේ සූරා ආල ඉම්රාන් 159 වන වාක්‍යයහි "මුතවක්කිල්" ලෙස මුහම්මද් සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම් තුමාණන් ගැන සර්ව බලධාරි අල්ලාහ් සඳහන් කර ඇත. අල්ලාහ් කෙරෙහි සම්පූර්ණ විශ්වාසය සහිතව තම සියලු කරුණු ඔහු වෙත පවරන්නා යනු මෙම පදයේ අර්ථය වේ. මෙහි සැබෑ තේරුම නම් කුර්ආනයේ අල්ලාහ් පවසන සියල්ල සැබැවින්ම විශ්වාස කිරීම යන්නයි.

"ඔවුන්ට අවශ්‍ය ආහාර සකස් නොකළ කිසිම ජීවියක් අල්ලාහ් මෙම මහ පොළොවෙහි මවා නැත." යැයි අල් කුර්ආන් පවසන හෙයින් එම වාක්‍යය සම්පූර්ණයෙන්ම විශ්වාස කිරීම මුතවක්කිල් කෙනෙකුගේ ලක්ෂණයකි. සියලු පිවීන් සඳහා අවශ්‍ය ආහාර පානාදිය මේ මහ පොළොව මත අල්ලාහ්

සූදානම් කර අවසාන යැයි මෙම වාක්‍ය පෙන්වන නමුත් මිනිසුන් තම ආහාර ලබා ගැනීම සඳහා කිසිදු වෑයමක් දැරීමට අවශ්‍යතාවක් නොමැති බව මෙම වාක්‍ය කිසිසේත් අදහස් නොකරන බව සලකන්න.

- ☐ මෙහි සැබෑ අර්ථය වන්නේ සෑම කෙනෙකුටම අවශ්‍ය ආහාර පානාදිය මහ පොළෝවෙහි අල්ලාහ් සකස් කර තිබෙන අතර, ඒවා ලබා ගන්නට සෑම කෙනෙක් නිත්‍යානුකූලව වෑයම් කළ යුතුය යන්නයි.

- ☐ අල්ලාහ් විසින් වෙන් කරන ලද ආහාරයේ තම කොටස කෙසේ හෝ ලැබෙන බවද, එය උපයනු පිණිස කිසිදු ක්‍රියාවක් නොකරන බවද පවසා නිවසෙහි සහ මස්ජිදයෙහි කාලය ගෙවන මිනිසෙක් ගැන ඉමාම් අහමද් ඉබ්න් හම්බල් ගෙන් කෙනෙක් ප්‍රශ්න කළ විට "මේ මිනිසා දැනුම නොමැති කෙනෙකි. 'මගේ ආහාරය මගේ හෙල්ල (ආයුධ උපකරණ) සෙවණැල්ලේ අල්ලාහ් තබා ඇත.' යැයි මුහම්මද් සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් තුමාණන් වරක් පැවසූහ. තමාට හිමි ආහාර කොටස ලබා ගනු පිණිස එතුමා කුමක් හෝ ක්‍රියාවක නිරත වූ බව එහි අර්ථය වේ. තවද, "ඔහු අල්ලාහ්ගෙන් යැපිය යුතු සැබෑ අයුරින් (ඔහු

වෙත සියලු කරුණු පවරා) යැපෙන්නේ නම්, පක්ෂීන්ට ආහාර සපයන්නා සේ ඔබටද ඔහු (අල්ලාහ්) ආහාර සපයනු ඇත. හිමිදිරියේ නිරාහාරව කූඩු වලින් ඉගිලී යන පක්ෂීන් සවසට කූඩු වලට හැරී පිවිසෙන්නේ කුස පුරවා ගෙනයැ." යි නබි සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම් තුමාණන් පවසා ඇත. මෙහිදී පක්ෂීන් කුසගින්නට ආහාර සොයා කූඩු වලින් බැහැර යෑම ගැන සඳහන් කිරීම ඉතා වැදගත්ය. මේ ගැන නිසි අවබෝදය ලැබූ සහාබාවරු තමන් දන්නා රැකියාවන් හී, ඒවා වෙළෙඳාම හෝ ස්වයං රැකියාව හෝ වැටුපක් සඳහා කරන රැකියාවක් හෝ වේවා නිරත වූහ." යැයි ඉමාම් අහමද් පිළිතුරු දුන්හ.

☐ අල්ලාහ් වෙත සැබැවින් රැඳී සිටින්නෙක් කිසි දෙයක් ගැන භය නොවිය යුතු බවද, රැකියාවක් සඳහා යෑමට අවශ්‍ය නැති බවද (සූෆිවරුන් ලෙස හැඳින් වන) ඇතැම් මුස්ලිම්වරු පවසති. මෙම සංකල්පය සම්පූර්ණයෙන් වැරදි බව ආගමික විද්වතුන් සියලු දෙනාම සලකති. මේ කරුණු පහදා දෙනු පිණිස, "ආහාර වලින් අගනා ආහාරය කෙනෙක් තම ශ්‍රමයෙන් උපයා ගත් ආහාරය වේ. දාවූද් (අලෛයිහි අස්සලාම්) ආහාරයට ගත්තේ, තම

ශ්‍රමයෙන් උපයා ගත් ආහාර පමණකි.“ යැයි පවසන නබි වදන මෙම විද්වතුන් සඳහන් කරති. දාවුද් (අලෛයිහි අස්සලාම්) තුමා යුදෙව් වරුන්ගේ රජ වරයෙක් වූ නමුත් තම ආහාරය සඳහා යකඩ කම්හල්කරු වෙකු ලෙස රැකියා කළ බව සැලකිය යුතුයි.

- ☐ ඉස්ලාම් හි පූජකයන් යන විශේෂ පිරිසක් නැත. ආගම ඉගෙන ගත් ආගමික විද්වතුන් සමාජයට කරන සේවය හෝ රැකියාව සඳහා වැටුපක් ලබති. සියලු මුස්ලිම්වරු තම ආගම නිසියාකාරව ඉගෙන ගත යුතු බවද, තම අවශ්‍යතාව සඳහා අල්ලාහ්ගෙන් සෘජුව යාච්ඤා කළ යුතු බවද තම සියලු ක්‍රියාවන්හට මරණයෙන් පසු පිළිතුරු දිය යුතු බවද ඉස්ලාම් තරයේ පවසයි.

- ☐ එනිසා අල්ලාහ් වෙත සියලු කරුණු පවරන ලෙස ඉස්ලාම් උපදෙස් කරන විට එහි සැබෑ අර්ථය අපි වටහා ගෙන ඉස්ලාම් අනුමත කළ මාර්ගයේ ජීවත් විය යුතුයි.

## 38. සතුරාට සමාව දිම.

“යෙදව් කාන්තාවක් මුහම්මද් සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම් තුමාණන් ඝාතනය කරනු පිණිස

වස මිශ්‍ර කළ එළු මස් පිළියල කර එතුමාණන්ට ආහාර සැපයුවාය. ඇගේ කුමන්ත්‍රණය හෙළි වී නබි සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම් තුමාණන් වෙතට ඇය ගෙනෙන ලදුව, එම වරද ඇය පිළිගත්තාය. සහාබාවරුන් ඇය මරා දමන්න දැයි විමසූ විට, “නැත“ යැයි පවසූ රසූල් සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම් තුමාණන් ඇයට සමාව දුන්හ.වස කෑමෙන් එතුමාගේ උගුරේ සිදු වූ උවදුර එදා පටන් දුටුවෙමි.“ යැයි අනස් (රලි) පවසා අල් බුහාරි, මුස්ලිම්, අහ්මද් සහ අබූ දාවූද් වාර්තා කළහ.

මෙම සිද්ධියට අදාළ කරුණු කිහිපයක් මෙහි දී සඳහන් කළ යුතුයි.

- ☐ ජේසු ක්‍රිස්තු වහන්සේ තුමා දේව පුත්‍ර යෙක් ලෙසද, මරියම් තුමිය දේව මෑණියෙ ලෙසද යුදෙව් වරුන් කිසි විටෙක පිළිනොගනිති. ක්‍රිස්තු බැතිමතුන්ගේ පාලනය යටතේ ජෙරුසලම් හි නොයෙකුත් පීඩාට ලක් වූ යුදෙව් ජාතීන් බොහෝ දෙනෙක් ප්‍රාණ ආරක්ෂා පතා අරාබි දේහය තුළට පැමිණ, මදීනා සහ උතුරු අරාබි පළාත් හී ජීවත් වූහ.

- ☐ අවසාන නබිවරයෙක් පැමිණෙන බව යුදෙව් වරුන්ගේ ආගමික ග්‍රන්ථය වන තව්රාත් වී අනාවැකිය සඳහන් වී තිබෙන නමුත් එම නබි

වරයා අරාබි ජාතීන්ගෙන් පැමිණීම ඔවුන්ගෙන් ඇතැම් අය අප්‍රිය කළෝය.

☐ නබි සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් තුමාණන්ගේ කාලයේදී ඒක දේවවාදය අනුගමනය කළ එකම ජනතාව යුදෙව් වරුන් පමණක් වූ නමුත් මුස්ලාම් වරුන්ට සහ මුහම්මද් සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් තුමාණන්ට එරෙහිව අරාබියේ බහු දේව වන්දනා කරුවන් සමඟ එකතු වී යුදෙව්වරුන් නොයෙකුත් කුමන්ත්‍රණ කරන්නට යෙදුණෝය.

එහෙත් ඉස්ලාමයේ සත්‍යතාව පිළිබඳව අවබෝධය ලත් යුදෙව් වරුන් බොහෝ දෙනෙක් මුස්ලිම් බවට පත් වූ අතර එසේ නොකළ යුදෙව්වරුන් පිරිස සහ මුස්ලිම් වරුන් අතර නොයෙකුත් ගැටුම් සිදු වුණි. කෑයිබර් සටන එයින් එකකි.

☐ කෑබර් සටනේ දී යුදෙව් ජාතීන් පරදවා ඔවුන්ගේ බලකොටු කිහිපයක් මුස්ලිම්වරු අත්පත් කර ගත් පසු අරාබි දේශයේ උතුරු පළාතේ යුදෙව් වරුන්ගේ බලය සම්පූර්ණයෙන්ම බිඳ වැටුණි. යුදෙව් වරුන්ගේ පරාජය නිසා කෝපයට පත් වූ යුදෙව් කාන්තාවක් වස මිශ්‍ර කළ එළු මස් පිළියෙල කර නබි සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් තුමාණන්ට සහ එතුමාගේ සහාබා වරුන්ට සංග්‍රහ

කළාය. ආහාරය කන්නට සහාබා වරුන්ට ආරාධනා කළ නබි සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් තුමාණන් එයින් කටක් දෙකක් අනුභව කළ විගස "එය අල්ලන්න එපා. මෙම ආහාරයේ වස මිශ්‍ර කර ඇති බව දැනෙනවා." යැයි කීහ. කෑම පිළියෙල කළ යුදෙව් කාන්තාව ගෙන්වා ඇගෙන් ප්‍රශ්න කළ විට, තම වරද සඟවන්නට තැත් නොකළ ඇය, " ඔබ සැබැවින්ම අල්ලාහ්ගේ නබිවරයෙකු නම් වස ආහාරයෙන් ඔබට කිසිදු හානියක් සිදු නොවෙයි. ඔබ (නබිවරයෙකු ලෙස පෙනී සිටින) රජ කෙනෙකු පමණක් නම් ඔබෙන් නිදහස් වෙන්නට සමාජයට මම කරන්නේ සේවයක් බව සිතුවෙමි." යැයි පැවසුවාය. නබි සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් තුමාණන් ඇයට සමාව දී නිදහස් කළහ.

☐ රටේ පාලකයෙක් ඝාතන කරන්නට කුමන්ත්‍රණය කිරීමේ බරපතළ වරදට සෑම රටකම මරණ දඬුවම් පැන වීම සිදු කෙරේ.

☐ කිහිප දෙනෙක් එක බන්දේසියක වාඩි වී ආහාර ගැනීම මුස්ලිම් වරුන්ගේ සිරිතක් වන අතර තම ආහාරය තවත් කෙනෙකු සමඟ බෙදා ගෙන කෑම

නබි සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම් තුමාණන්ගේ විශේෂ පුරුද්දකි. මෙවා සියල්ල දැන සිටි යුදෙව් කාන්තාව, නබි සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම් තුමාණන්ට වස ආහාරය සැපයීමෙන් එතුමා සමඟ ආහාරයට සහභාගි වන අනිකුත් ප්‍රධාන සහාබා වරුන්ද, එනම් ඉස්ලාමීය නායක්වයේ ඉහළ පෙළේ කිහිප දෙනෙක් ඝාතනය කළ හැකි වේ යැයි සිතුවාය.

- තමා ඝාතනය කරන්නට තැත් කළ ඇගේ සැබෑ අරමුණ දැන ගත් පසු, නබි සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම් තුමාණන්ගේ ප්‍රථම ක්‍රියාව ඇයට සමාව දීමයි.

- ඉස්ලාමීය නීති ක්‍රමය යටතේ සොරකම්, මිනිමැරුම් වැනි අපරාධ ක්‍රියාවන්ට නියමිත දඬුවම වෙනස් කිරීමට කිසිවෙකුට අනුමත නැති අතර, හානියට ලක් වූ තැනැත්තාට පමණක් සමාව දීමේ අයිතිය හිමිය. නබි සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම් තුමාණන්ද තමාට සිදු වූ හානියට සමාව දුන්හ.

- වස සහිත ආහාර කෑමෙන් බිෂර් ඉබ්න් අල් බරා (රලි) නම් සහාබි වරයාගේ මහත් වේදනා සහිත

මරණය එහි දී සිදු විය. ඉන් අනතුරුව ඉස්ලාමීය නිති ක්‍රමයට එකඟව, එම කාන්තාවට මරණ දඬුවම නියම කෙරුණු බව වාර්තා වේ.

- අල්ලාහ්ගෙන් පහළ වූ ඉස්ලාමීය නීති ක්‍රමය වෙනස් කිරීමට රටේ පාලකයාට වුවද කිසිදු අයිතියක් නැත. නොයෙක් අවස්ථාවන් හී තමාට සිදු වූ අතවරයට සමාව දුන් නබි සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් තුමාණන්ද ඉස්ලාමීය නීතිය අකුරට පිළිපැදිය යුතු බවද, පාලකයන්ගේ මතය පරිදි අල්ලාහ්ගේ නීති ක්‍රමය වෙනස් කළ නොහැකි බවද මෙහිදී පැහැදිලි වේ.
- මිනිසා විසින් සකස් කරන ලද නීති ක්‍රමය හා සියලු දේ මවා ආරක්ෂා කරන්නා වු අල්ලාහ්ගේ නීති ක්‍රමය අතර තිබෙන වෙනස මෙය වේ.

## 39.උපදේශක වරුන් දෙපිරිසක්

"විශ්වාසවන්තයින් තමන් අතර සාකච්ඡා කරන අය වෙති." යැයි අල් කුර්ආන් වාක්‍ය 42:38 පවසයි.

පහත සඳහන් හදීසය අබූ හුරෙයිරා (රලි) දන්වයි. අබුල් හයිතම් ඉබ්න් අල් හයිතාන් (රලි) මක්කාවේදී නබි සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් තුමාණන්ට දේව විශ්වාසය (ෂහාදාව) ප්‍රකාශ කර, මදීනාවට

පැමිණියහොත් එතුමාට රැකවරණය සපයන බවට පොරොන්දු වූ අන්සාර්වරුන් 12 දෙනෙකුගෙන් කෙනෙකි. මදීනා නුවරදී දිනක් නබි සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම් ඔහුට සේවකයෙක් සිටිනවා දැයි විමසූහ. එයට අබූ හයිතම් (රලි) “නැත“ යැයි පිළිතුරු දුන්නේය. කාලයකට පසු. නබි සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම් තුමාණන් ඔහුට සේවකයෙක් සපයා “මෙම සේවකයා සලාහ් කරනු දුටුවෙමි. ඔහුට කරුණාව දක්වනු මැනවි.“ යැයි පැවසූහ. නබි සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම් තුමාණන්ගේ උපදෙසට එකඟව සේවකයාට කරුණාව දැක්විය යුතු නම් සේවකයා නිදහස් කළ යුතු බව අබූ හයිතම් (රලි) ගේ බිරිය පැවසූ විට ඔහු එම සේවකයා නිදහස් කළේය.

මේ බව ආරංචි වූ නබි සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම් තුමාණන්, “අල්ලාහ් නබිවරයෙක් හෝ නියෝජිතයෙක් සමාජයට එවන කල්හී ඔහු වටා දෙවර්ගයට අයත් අය රොක් වෙති. එක් පිරිසක් යහපත් දේ කරන්නටද අයහපත් දෙයින් ඉවත් වන්නටද අනුබල දෙයි. අනිත් පිරිස ඔහුව නොමග යවන්නට දැඩි උත්සාහ දක්වයි. නොමඟ යවන්නට වෑයම් කරන පිරිසගෙන් ඉවත් වන කෙනෙකු ඇත්ත වශයෙන්ම ආරක්ෂාව ලැබූ කෙනෙකි.“ යැයි පැවසූහ.

මෙම හදීසය තුළින් නබි සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම් තුමාණන් පෙන් වූ වැදගත් කරුණු කිහිපයක් පහත සඳහන් වේ.

- සමාජයක් නිසියාකාරව පාලනය විය යුතු නම්, සාකච්ඡා කිරීම සහ උපදෙස් දිම අනිවාර්යයෙන් සිදු විය යුතු කරුණකි.

- කෙනෙකුට උපදෙස් දෙන්නේ සාමාන්‍ය යෙන් ඔහුගේ විශ්වාසයට ලක් වූ කෙනෙක් හෙයින් ඔහු තම වගකීම පුද්ගලික වාසියක් නොපතා එම කාර්යය අවංකව ඉටු කළ යුතුයි.

- අබුල් හයිතම් (රලි) ට නැමදුම් කරන සේවකයෙක් දෙන ලෙස නබි සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් තුමා නිර්දේශ කළේ, එම සේවකයා යහපත් කෙනෙකු බව දැන ගෙනයි.

- නබි (සල්) තුමාණන්ගේ උපදෙසට එකඟ ව සේවකයාට කරුණාව දැක්වීමට නම්, ඔහු නිදහස් කළ යුතු බව අබුල් හයිතම් (රලි)ගේ බිරිය විශ්වාස කළ නිසා නොමිලේ ලැබු සේවකයෙක් අහිමි වුවත් ඒ මගින් අල්ලාහ්ගේ ආදරය ලබා ගත හැකි යැයි උපදෙස් දුන්නාය.

- මේ අවස්ථාවන්හි දී උපදෙස් දුන් දෙදෙනාම තමන් කෙරෙහි තබන ලද විශ්වාසය කඩ කළේ නැත.

☐ පාලකයින්ට සහ බලයට පත් වූ අයට උපදෙස් දෙන්නන් අනුගමනය කළ යුතු ප්‍රතිපත්තිය ගැන මෙම හදීසය තුළින් නබි සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම් තුමාණන් පෙන්වා දුන්හ.

☐ යහපත් දේ ඉටුකර, අයහපත් දෙයින් ඈත් වන ලෙස නිර්දේශ කරන කෙනෙකුගේ උපදෙස් නිසා ඇතැම් විට ලෞකික දෙයින් පාඩුවක් හෝ අවාසියක් සිදුවන බව පෙනුණ හොත් නායකයාගේ පිළිකුලට ඔහු භාජන වී දඬුවම්ද ලැබිය හැක. එහෙත් මෙම උපදේශක පිරිස අල්ලාහ් ඉදිරියේ උසස් අය බව සැලකේ.

☐ නායකයාගේ කැමැත්ත කුමක් දැයි දැන ගෙන එයට සරිලන අන්දමින් උපදෙස් දී ඔහුව තවතවත් නොමඟ යවන්නට යෙදෙන අකුසල් අය සමාජයේ ඕනෑ තරම් සිටිති. ඔවුන් ඇතැම් විට ජනප්‍රියද වනු ඇත. එහෙත් නායකා විසින් තබන ලද විශ්වාසය කඩ කළ අයහපත් උපදේශක වරුන් වන ඔවුන්ගෙන් ඈත්ව සිටින නායකයා ආරක්ෂාව ලැබූ කෙනෙක් බව නබි සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම් තුමාණන් පැහැදිලිව පෙන්වූහ.

- ☐ දෙ වර්ගයට අයත් උපදේශක වරුන් ගැන කරුණු මෙහිදී පැහැදිලිය.

- ☐ උපදේශක වරයා තම උපරිම හැකියාව තුළ අවංකව කටයුතු කළ යුතුය. මෙම නිගමනය සෑම කලකටම, සෑම අවස්ථාවකටම සෑම මිනිස් සමාජයකටම ගැළපෙන බව සලකන්න.

## 40. උතුම් ආත්මයක අවසාන වදන්

අලි ඉබ්න් තාලිබ් (රලි) පහත සඳහන් හදීසය දන්වයි. “නබි සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම් තුමාණන්ට අසනීපය උග්‍ර වූ අවස්තාවක, ‘අලි, මගේ අනුගාමිකයින් කිසි විටක නොමඟ නොයනු පිණිස මම කියන කරුණු කඩදාසියක ලියා ගන්න.‘ යැයි පැවසුහ. කඩදාසිය රැගෙන එන්නට මම ගිය විට එතුමාණන් වෆාත් විය හැක යනු මම බිය වූ නිසා, එතුමා පවසන සියල්ල මට මතකයේ තබා ගත හැකි යැයි පිළිතුරු දුන්නෙමි. එවිට එතුමාණෝ, සලාහ්වන් හි නිරතවන ලෙසද ධන බදු වන සකාත් ගෙවන ලෙසද, (අපෙන් යැපෙන) වහල් සේවකයන්ට මෛත්‍රිය දක්වන ලෙසද පැවසුහ. මෙසේ නැවත නැවත පවසමින් සිටියදි එතුමා අමරණීය අල්ලාහ් වෙතට ආපසු සැපත් වුහ.“

තවද "නැමදුම් කිරීමට සුදුසු අල්ලාහ් හැර අන් කිසිවෙක් නැති බවද මුහම්මද් සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් තුමාණන් අල්ලාහ්ගේ සේවකයෙක් හා රසූල්වරයෙක් (සංදේශක වරයෙක්) බවද ප්‍රකාශ කරන ලෙසද අණ කළහ. මේවා විශ්වාස කරන කෙනෙක් අපාය ගින්නෙන් ආරක්ෂා ලබන බවද එතුමා පැවසූහ." ඉමාම් අහමද් සහ අදබ් අල් මුෆ්රද් ග්‍රන්ථයෙහි අල් බුහාරි මෙම හදිසය වාර්තා කළහ.

- ☐ මුහම්මද් සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් තුමාණන්ගේ අවසාන දින කිහිපයක් පිළිබඳව සඳහන් කරන වාර්තා කිහිපයක් ඇත.

- ☐ තම අනුගාමිකයන් ඉස්ලාමය හැකි පමණ අවංකව පිළිපැදිය යුතු බව පොළඹවන්නට නබි සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් තුමාණන් තම අවසාන මොහොත දක්වාම ක්‍රියා කළ අයුරු මෙම හදීසය පෙන්නුම් කරයි.

- ☐ කෙනෙක් යහපත් මුස්ලිම් වරයෙකු වීම තුළින් ස්වර්ගයට මාර්ගය විවෘත කර ගන්නා බව එතුමා දැන සිටියහ. එනිසා සෑම කෙනෙක්ම අල්ලාහ්ට අවනත වන මුස්ලිම් වරයෙකු බවට පත් විය යුතු යැයි එතුමා අපේක්ෂා කළහ.

☐ එතුමාගේ අවසාන වදන් ඉස්ලාමයේ අත්‍යවශ්‍ය කරුණු ගැන පහදා දෙයි. නබි සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් තුමාණන්ගේ මරණයට සති දහයකට පමණ පෙර “අද දින ඔබේ දහම සම්පූර්ණ කළෙමි.“ යන 5:3 කුර්ආන් වැකිය පහළ වූවායින් පසුව අමතර ආගමික නීති රීති කිසිවක් පහළ නොවුණි.

☐ එනිසා ඉහත සඳහන් හදීසය ඉස්ලාම් හී වැදගත් කුළුණ සහ කරුණු තහවුරු කිරීම පිණිස සඳහා බව වටහා ගත හැක.

☐ අල්ලාහ් කෙරෙහි සහ නබි සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් තුමාණන් කෙරෙහි විශ්වාසය තැබීම ප්‍රධාන කුළුණු වන අතර සලාහ් සහ සකාත් ඉස්ලාම් හී අනිකුත් කුළුණු වේ. පෞද්ගලික සහ සමාජයේ යහපතට සලාහ් සහ සකාත් අත්‍යවශ්‍ය වන අයුරින්ම ඉස්ලාමිය සමාජයේ සෑම යහපත් ක්‍රියාවකම ආරම්භක ස්ථානයද මෙම කුළුණු වේ.

☐ මේ කුළුණු ස්වේච්ඡාවෙන් හා කැමැත්තෙන් ස්ථාපිත කළ යුතු අතර කෙනෙකු ඒවා ඉටු නොකළේ නම් ඔහුගේ ඊමානය දුබල වන බව එයින් හැඟේ. තවද කෙනෙකුගේ බලපෑම් නිසා

සලාහ් කරන කෙනෙක් එය නිසියාකරව ඉටු කරන්නේ නැත.

- ඉස්ලාම හී කුළුණු වන සලාහ් ගැන සැලකිලිමත් නොවන කෙනෙක් ඉස්ලාම් පෙන්වන අනිත් යුතුකම් ගැනද සැලකීමක් දක්වන්නේ නැත. එමෙන්ම සකාත් යන ශුද්ධකාරක බද්ද නොගෙවන කෙනෙකු එයින් යැපෙන දුප්පත් අයට අසාධාරයක් කරන පාපයට පත් වෙයි.

- මේවාට අමතරව වහල් සේවකයන්ට (එනම් සමාජයේ දුබල අයට) මෛත්‍රිය දක්වන ලෙස කිහිප වාරයක්ම නබි සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම් තුමා පැවසුහ. මෙම උපදේශය වහල් සේවකයන්ට පමණක් නොව සමාජයේ සෑම දුබල කොටසකටම අදාල වේ.

- අල්ලාහ් සහ ඔහුගේ රසූල්වරාය ගැන අවබෝධ සහිතව ෂහාදාව ප්‍රකාශ කරන කෙනෙක් ඉස්ලාමිය සමාජයට අතුළු වෙයි. මෙම ෂහාදාව කොටස් දෙකකින් සමන්විතයි. ඒවා නම් අල්ලාහ් කෙරෙහි විශ්වාසය සහ මුහමම්මද් සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම් තුමාණන්ගේ නබිත්වයේ විශ්වාසය යන කරුණු දෙකකි. මුස්ලිම් වරයෙක් අනිවාර්ය යෙන්

මෙවා  පිළි ගත යුතු කරුණු දෙක වේ. එක් කොටසක් පිළිගෙන ඉතිරි කොටස ඉවත දැමිය නොහැක.

- මේ අනුව වසර 23කට පෙර මුල් දිනයේ ආරම්භ කළ නිවේදනය නබි සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් තුමාණන්ගේ ජීවිතයේ අවසාන දක්වාම වෙනස් නොවුණු බව පැහැදිලිව පෙනේ.

- දේව විශ්වාසය සහිතව තමා වෙතට පැමිණෙන දාසයාට අති කාරුණික හා දයාබර අල්ලාහ් කිසිවිටක පලවා නොහරින බව පවසන කුර්ආන් වාක්‍යයන් කිහිපයක් ඇත. එමෙන්ම අල්ලාහ් වෙතට හැරෙන දාසයාව පිළිගන්නට දෑත විවෘතව තබා සියලු පාපයන්ට සමාව දීමට අල්ලාහ් නිතර බලා සිටින බව පවසන නබි සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් තුමාණන්ගේ වදන් ද ඇත.

- මේ අනුව තම ජීවිතයේ අවසාන මොහොතේදී පවා දේව විශ්වසාය පිළිගෙන එම විශ්වාසය සහිතව මරණයට පත් වන කෙනෙක් ස්වර්ගයේ තම ස්ථානය හිමි කර ගන්නේ අල්ලාහ්ගේ අසීමිත කරුණාව සහ දයාව හේතු කොට ගෙනයි.

- ☐ මෙහිදී එක් කරුණක් මතකයේ තබා ගත යුතුයි. එනම් මරණාසන්න මොහොතේදී ඕනෑම කෙනෙකුට දේව විශ්වාසය පවසන ෂහාදාව ප්‍රකාශ කළ හැකි වනු ඇතැයි කිසි විටක නොසිතිය යුතුයි. මරණය සිදු වන අවස්ථාවේදී ෂහාදාව මතක තිබේ යැයි කිසිදු පොරොන්දුවක් නැත. අප අවට සිදු වන නොයෙකුත් මරණ දෙස සලකා බලන විට අපි සියලු දෙනාම මරණයට නිතර සූදානම්ව සිටිය යුතු බව පැහැදිලිය. මේ අවබෝධය ලත් කෙනෙක් යුතුකම් සියල්ල ඉෂ්ට කර තම අවසාන මොහොත පැමිණෙන විට එය පිළිගන්නටත්, අල්ලාහ් වෙතට සාමයෙන් සහසහනයෙන් හැරී යන්නටත් සූදානම්ව සිටියි. එලෙස සූදානම් නොවී හදිසියෙන් මරණයට පත්වන කෙනෙක් සියලු දෙයින්ම පාඩු ලබන බව නිසැකයි. ෂහාදා ප්‍රකාශ කරන්නට පවා අවස්ථාවක් නොලබන මෙම අවාසනා වන්ත තත්ත්වය ගැන අපි නිතර ප්‍රවේශම් විය යුතුයි.

- ☐ අල්ලාහ්ගේ ඒකීය භාවය සහ මුහම්මද් සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් තුමාණන්ගේ අවසාන නබිත්වය පිළිගෙන යහපත් ජීවිතයක යෙදෙන කෙනෙකුට මෙම ෂහාදාව ඉන්ෂා

අල්ලාහ් පහසුවෙන් ප්‍රකාශ කළ හැකි වනු ඇත. මේ ගැන කල්පනා කර ගෙන සිටින්නට ඔහුට කිසිදු අවශ්‍යතාවක් නැත. එම ප්‍රකාශනය ස්වභාවිකව, පහසුවෙන් ඔහුගේ මුවින් පිට වනු ඇත. මරණය ළඟා වන බව දැනෙන විට මෙලොවෙහි අත හැර යන දේවලට වඩා උසස් දේ අල්ලාහ්ගෙන් තමාට ලැබෙන බව මේ අය ස්ථිර වශයෙන් දනී. ඔවුන් අවසාන මොහොතේ දී ෂහාදා ප්‍රකාශ කර ස්වර්ගයේ තම ස්ථානය ඉන්ෂා අල්ලාහ් තහවුරු කර ගනී.

ඉස්ලාම් පෙන් වූ උසස් ගුණාංගයන් සමඟ ජීවත් වී ස්වර්ගයට ඇතුළු වීමට වාසනාව ලැබූ මෙවැනි පිංවතුන් සමඟ අපි සියළු දෙනාම එක් වීමේ භාග්‍ය ලබන්නට අති කැරුණික අල්ලාහ් පිහිට වන ලෙස ප්‍රාර්ථනා කරමු.

ප්‍රශංසා සියල්ල මුළු විශ්වයේ අධිපති අල්ලාහ්ට හිමි වේවා. සාමය හා අල්ලාහ්ගේ ආශීර්වාද මුහම්මද් සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් තුමාණන්ටද, එතුමාණන්ගේ පවුලේ අයටද, එතුමාගේ හිත මිතුරන්ටද, එතුමා පෙන් වූ මාර්ගය අනුගමනය කරන සියලු මුස්ලිම්වරුන්ටද හිමිවේවා. ආමීන්.

මෙම පොත් පිංචය පිළිබඳ ඔබගේ අදහස් අගේ කොට සලකමු.